## 2018. 05. 01 වන දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පැවති

## මාසික සභා රැස්වීම් වාර්තාව

**සහභාගීත්වය (-**

| | |
|---|---|
| ☞ ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා | ගරු සභාපති |
| ☞ කමල් වැල්ලගේ මහතා | ගරු උප සභාපති |
| ☞ ජී.සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| ☞ ග්‍රේෂන් කෙරම්ණියගේ මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| ☞ ඒ. ඩබ්. ජගත් කුමාර මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| ☞ ඒ.පී.ලක්ෂ්මි හේමන්තා ද සිල්වා මෙනවිය | ගරු නගර සභා මන්ත්‍රී |
| ☞ දිනයාදුර ධර්මදාස මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| ☞ නන්දන රාජපක්ෂ මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| ☞ ලලිත් ධම්මික කොඩිකාර මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| ☞ ආර්. එම්. ලසන්ත අජිත් කුමාර මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| ☞ ඩෙනට් පනියන්දූවගේ මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| ☞ මගගේ අතුල ප්‍රියන්ත මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| ☞ ඩබ්. ඒ. සෝභිත රංජිත් මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| ☞ ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය | ගරු නගර සභා මන්ත්‍රී |
| ☞ ජී. ජී. ආර්. පේෂලා කුමාරි මහත්මිය | ගරු නගර සභා මන්ත්‍රී |
| ☞ එච්. ඉනෝකා ක්‍රිෂාන්ති මහත්මිය | ගරු නගර සභා මන්ත්‍රී |
| ☞ එම්. ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| ☞ ඩබ්. එම්. නිලානි මෙනවිය | ගරු නගර සභා මන්ත්‍රී |
| ☞ ධනසේන මාදුවගේ මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| ☞ කේ. ජී. පී. දයානන්ද මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| ☞ එස්. එම්. සරත්චන්ද්‍ර ද සිල්වා මහතා | ගරු නගර සභා මන්ත්‍රී |

☸ **පන්සිල් සමාදන් වීමෙන් අනතුරුව පෙ.ව. 09.35 ට රැස්වීමේ වැඩ කටයුතු ආරම්භ කරන ලදී** ☸

**(01)**

**01:01** **2018 – 04 – 05 Èk mj;ajk ,o udisl iNd /iaùï jd¾;dj iNd iïu; lsÍu**

2018 – 04 – 05 දින පවත්වන ලද මාසික සභා රැස්වීම් වාර්තාව පිළිගත යුතු බවට ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රී ඒ. ඩබ්. ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදී.

✠ **ඒ අනුව 2018- 04- 05 දින පවත්වන ලද මාසික සභා රැස්වීම් වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.**

**සංශෝධන 01**

**ගරු නගර සභා මන්ත්‍රී එම්.ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා විසින් ඉදිරිපත් කරන ලද සංශෝධන**

පළාත් පාලන කොමසාරිස්වරයා වෙත යවා අනුමැතිය ලබා ගැනීමට තීරණය වූ ගෙවීම් සම්බන්ධව එම කටයුතු සිදු කර ඇත්ද යන්න දැනගැනීම අවශ්‍ය බව දන්වන ලදී.

**සංශෝධන 02**

**ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය විසින් ඉදිරිපත් කරන ලද සංශෝධන**

44 පිටුවෙහි 5 වන ඡේදයෙහි ‘මම ඉල්ලා සිටිනවා පොල්වත්ත පියසේන ක්‍රීඩාංගණය පොල්වත්තෙ ළමයින්ට නොමිලේ ලබා දෙන්න කියා’ යන්න ඇතුලත් විය යුතුයි.

**(02)** **සභාපතිවරයා විසින් කරනු ලබන විශේෂ නිවේදන** නැත

**(03)** **ලැබී ඇති පැමිණිලි පෙත්සම් හා ලිපි සභාවට ඉදිරිපත් කිරීම**

**03:01 "** ආරක්ෂක සේවාව සඳහා සේවක මහතුන් බඳවා ගැනීම " මැයෙන් නගර සභාවේ ලේකම් තුමිය විසින් ඉදිරිපත් කරන ලද ලිපිය සභාගත කරන ලදී.

අම්බලන්ගොඩ නගර සභාවේ ආරක්ෂක සේවයේ දැනට නිලධාරීන් 05 දෙනෙකු සේවයේ යෙදී සිටින අතර ඉන් එක් අයෙකු 2018-04-14 දිනෙන් පසු සේවයට වාර්තා නොකරන බවත් මීට අමතරව ස්ථිර මුරකරු තනතුර සඳහා දෙදෙනකු පත් කර ඇති නමුත් ඉන් එක් අයෙකු මුරකරු තනතුරේ සේවය නොකරන අතර ක්‍රීඩා පුහුණුකරුවකු ලෙස සේවය කරන බවත් පොදු වෙළඳ පොල මුරකරු ලෙස වැඩ ක්ෂේත්‍ර කම්කරුවකු යොදවා ඇති අතර ඔහු 2018 ජූනි මස විශ්‍රාම යන බවත් මේ අනුව නගර සභාවේ ආරක්ෂක සේවා කටයුතු කරගෙන යාම ඉතා අසීරු කටයුත්තක් වන බවත් ඒ සඳහා පඩි පාලක සභා ආඥාප පනතට අනුව ආරක්ෂක නිලධාරීන් බඳවා ගැනීම සඳහා අනුමැතිය ලබා දෙන ලෙසත් ඉල්ලා තිබුණි.

<u>**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**</u>

සභාපතිතුමනි මම දැනට ඉන්න අය ගැන නම් සෑහීමකට පත් වෙන්නෙ නැහැ. එනිසා මගේ අදහස අළුතින් පිරිසක් නගර සභාවට බඳවා ගැනීම සුදුසුයි කියන එකයි. බස් නැවතුම් පොලට අනිවාර්යෙන්ම ආරක්ෂක නිලධාරියෙක් යොදවන්න ඕනෙ. අද වෙනකොට බස් නැවතුම් පොලට මගියෙකුට ගොඩවෙන්න වත් බැරි තත්වයක් තියෙන්නෙ. ඇතුල්වෙන තැන් වහල තමයි වාහන ගහන්නෙ. එනිසා මේ සඳහා සුදුසු අය බඳවා ගෙන ආරක්ෂක අංශය ඉදිරියට ගෙනියන්න කියන ඉල්ලීම කරනවා.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ඩී. ධර්මදාස මහතා කතා කරමින්**</u>

සභාපතිතුමනි අළුතින් බඳවා ගන්නා අයට වැටුප් ගෙවන්නේ කොහොමද?

<u>**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

පඩි පාලක සභා ආඥා පනත අනුව.

<u>**ගරු නගර සභා මන්ත්‍රී එම්. ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා කතා කරමින්**</u>

සභාපතිතුමනි මේක අත්‍යාවශ්‍ය කරුණක්. උප සභාපතිතුමා කිව්ව වගේ මම දැක්කා බස් නැවතුම්පොලේ අවුරුදු දවස් වල වාහන නවත්තපු හැටි. ආරක්ෂක අංශයට කී දෙනෙක් ඕන වෙනවද සභාපතිතුමා?

ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්

මට මතක 12 ක් වගේ.

ගරු නගර සභා මන්ත්‍රී එම්. ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා කතා කරමින්

සභාපතිතුමනි වැඩි වෙන විදියටත් නෙමෙයි ඒ ගන්න අයට තමන්ගෙ කාර්යභාරය හරියට කරන්න පුළුවන් අය ගන්න ඕනෙ. තෝරා ගැනීමේදී ඒක බලන්න කියල අපි ඉල්ලා සිටිනවා.

ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දූවගේ මහතා කතා කරමින්

සභාපතිතුමනි මේ රාජකාරියේ වගකීම් පිළිබදව තැනින් තැනට වෙනස් වෙනවා. නගර සභාව ගත්තොත් තියෙනවා බඩු භාර දීම්, භාර ගැනීම්, වාහන යන එන ඒව පිළිබද සටහන්. එතකොට පොත් පත් වල සටහන් කර ගැනීම් තියෙනවා. ඒ නිසා යම් දෙයක් වුනොත් ඒව හොයා බැලීමට අපොහොසත් වෙනවා. නිලධාරීන් වගකීමෙන් නිදහස් වෙනවා. එනිසා ඒ වගකීම පිලිබදව අපි ඒ අයට උපදෙස් ලබා දෙන්න ඕනෙ. මට පුළුවන් උදව්ව මම සභාවට කරන්නම්. බස් නැවතුම්පොල ගත්තොත් එතන අයට තියෙන වගකීම, රාජකාරිය වෙනස්. එතන අයට උචිත විදියට අපි රාජකාරිය පවරන්න ඕනෙ. ඒ අයට උපදෙස් ලබා දෙන්න ඕනෙ. මම ඒ සදහා සහයෝගය ලබා දෙන්නම්. වයස් සීමාවක් තීරණය කල යුතුයි අවු 30 ට වැඩි 50 ට අඩු. එහෙම තීරණයක් කරන්න. ඒවගේම අනිවාර්යෙන් 10 පන්තිය සමත් විය යුතුයි. නැත්තම් පොත පතක් ලියා ගන්න බැරි වෙනවා. ඒ දේවල් සැලකිල්ලට ගෙන හොද අය බදව ගමු. මමත් සහයෝගය ලබා දෙන්නම් ඒ අයට අවශ්‍ය උපදෙස් පිළිබදව. එතකොට අපිට හොද රාජකාරියක් ලබා ගන්න පුළුවන්. අවුරුද්දක කාලයකට බදවා ගන්න ඕනෙ ඒවගේම ගිවිසුමක් අත්සන් කල යුතුයි ඒ අයත් සමග.

තීරණය

☞ මේ සම්බන්ධයෙන් සාකච්ඡා කල සභාව වසරක කාලයක් සදහා නගර සභාවේ ආරක්ෂක සේවයට නව නිලධාරීන් 12 දෙනෙකු බදවා ගැනීම සුදුසු බව ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දූවගේ මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සහා සම්මත විය.

**3:2** “ ගාල්ල දිස්ත්‍රික් මිල නියම කිරීමේ කමිටු වාර්තාව - 2018 වර්ෂයේ පළමු භාගය ” මැයෙන් ගාල්ල දිස්ත්‍රික් පළා ත් පාලන සහකාර කොමසාරිස්තුමිය විසින් එවන ලද ලිපිය සභාගත කරන ලදී.

ගාල්ල දිස්ත්‍රික් මිල නියම කිරීමේ කමිටුව විසින් 2018 වර්ෂයේ පළමු භාගය සදහා දන්වා එවන ලද මිල ගණන් ඉදිරිපත් කරන බවත් ඒ සම්බන්ධව ආයතනයේ තාක්ෂණ සේවා නිලධාරීන් දැනුවත් කරන ලෙසත් දන්වා තිබුනි.

තීරණය

☞ මෙම ලිපිය සභාවේ දැනගැනීම සඳහා ඉදිරිපත් කරන ලදී.

- පෙ.ව. 9.55 ට පමණ ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරමිණියගේ මහතා සභාවට පැමිණෙන ලදී.

**3:3** **"** වෙසක් තොරණට ආධාර පිණිස පවත්වනු ලබන විනෝද ක්‍රීඩා විනෝද බද්දෙන් නිදහස් කර දෙන මෙන් ඉල්ලා සිටිමි " මැයෙන් සී. ඩ්‍රැගන්ස් බෞද්ධ සමිතියේ ලේකම්තුමා විසින් එවන ලද ලිපිය සභාගත කරන ලදී.

සී ඩ්‍රැගන්ස් බෞද්ධ සමිතිය විසින් වසරක් පාසා ඉදි කරනු ලබන වෙසක් තොරණ 25 වන වරට මෙවර ද ඉදි කරනු ලබන බවත් ඒ සඳහා අවශ්‍ය මුදලින් යම් ප්‍රමාණයක් සපයා ගන්නේ ඊට සමගාමීව පවත්වනු ලබන විනෝද ක්‍රීඩා වලින් ලැබෙන මුදලින් බවත් එම නිසා එම ක්‍රීඩා වලින් ලැබෙන ආදායම් විනෝද බද්දෙන් නිදහස් කර දෙන ලෙසත් ඉල්ලා තිබුණි.

ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දූවගේ මහතා කතා කරමින්

සභාපතිතුමනි අම්බලන්ගොඩටම තියෙන්නෙ එක තොරණයි. ඒක නිදහස් කරල සහයෝගයක් ලබා දෙමු.

ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා කතා කරමින්

සභාපතිතුමනි, මන්ත්‍රීවරුනි, මාධ්‍යවේදීනි, අම්බලන්ගොඩ නගරෙ කියන්නෙ වෙසක් තොරණ් 15 ක් 16 ක් ඉදි කරපු නගරයක්. අද ඒක එකකට සීමා වෙලා තියෙනවා. මේකත් මේ අයගෙ අප්‍රතිහත ධෛර්යෙන් තමයි කෙරෙන්නෙ. ඒ නිසා අපි ඉතිහාසයේ සෑම අවස්ථාවකදීම මොවුන්ට සහයෝගය ලබා දුන්නා. අදටත් එම සහයෝගය ලබා දෙන්න කියල මම ඉල්ලා සිටිනවා. මම එක ඉල්ලීමක් කරන්න කැමතියි සභාපතිතුමනි, මෙම සමිතිය අවු. 20 ක් 30 ක් පැරණි වුවත් තවමත් බැංකු ගිණුමක් නෑ මේ සමිතියට. එනිසා ඔවුන්ට මේ අනුමැතිය දෙන ගමන්ම ලබන වසරට මේ අනුමැතිය ලබා ගැනීමේදී බැංකු ගිණුමක් තිබීමේ අවශ්‍යතාවය පෙන්වල දෙන්න. එක පැත්තකින් මහජන මුදල්. අනෙක් පැත්තෙන් නගර සභාව නීත්‍යානුකූල ආයතනයක්. බැංකු ගිණුමක් හදාගන්න එක මහ ලොකු දෙයක් නෙමෙයි. ඒ නිසා ඒ ඉල්ලීම කරොත් හොඳයි කියන එක මම ප්‍රකාශ කර සිටිනවා.

තීරණය

☞ මේ සම්බන්ධයෙන් සාකච්ඡා කල සභාව සී ඩ්‍රැගන්ස් බෞද්ධ සමිතිය විසින් ඉදි කරනු ලබන වෙසක් තොරණ සමගාමීව පවත්වනු ලබන විනෝද ක්‍රීඩා වලින් ලැබෙන ආදායම් විනෝද බද්දෙන් නිදහස් කර දීම සුදුසු යැයි ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දූවගේ මහතා විසින් යෝජනා කරනු ලැබූ

අතර ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.

03:04 ' අම්බලන්ගොඩ අන්තර් යෞවන සමාජ ක්‍රීඩා උළෙල - 2018 ක්‍රීඩාංගණය වෙන් කරවා ගැනීම ' මැයෙන් අම්බලන්ගොඩ තරුණ සේවා නිලධාරී විසින් එවා තිබූ ලිපිය සභාගත කරන ලදී.

2018 – 30 වන ජාතික යෞවන ක්‍රීඩා උළෙලේ ප්‍රථම අදියරේ තරග පැවැත්වීම සඳහා පොල්වත්ත පියසේන ක්‍රීඩාංගණය 2018-05-12 සහ 2018-05-13 යන දිනයන්හිදි මුදල් අය කිරීමකින් තොරව ලබා දීමට කටයුතු කරන ලෙස ඉල්ලා තිබුණි.

<u>තීරණය</u>

☞ මේ සම්බන්ධයෙන් සාකච්ඡා කල සභාව 2018-05-12 සහ 2018-05-13 යන දිනයන් සඳහා පොල්වත්ත පියසේන ක්‍රීඩාංගණය මුදල් අය කිරීමකින් තොරව ලබා දීමට ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධයක් නොමැති වූ බැවින් ඒ සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

**3:5** ' පාඨමාලා සම්බන්ධ බැනරයක් ප්‍රදර්ශනය කිරීම සඳහා අවසර ලබා ගැනීම ' මැයෙන් ශ්‍රී ලංකා සාගර විශ්ව විද්‍යාලයේ සහකාර අධ්‍යක්ෂතුමා විසින් එවා තිබූ ලිපිය සභාගත කරන ලදී.

සාගර විශ්ව විද්‍යාලයේ අනුබද්ධිත මධ්‍යස්ථානයක් වන ගාල්ල ප්‍රාදේශීය මධ්‍යස්ථානය මගින් ඉගැන්වීම් කරනු ලබන පාඨමාලා සම්බන්ධව සිසුන් දැනුවත් කිරීම සම්බන්ධ බැනරයක් අම්බලන්ගොඩ නගර මධ්‍යයේ මුදල් අය කිරීමකින් තොරව ප්‍රදර්ශනය කිරීම සඳහා අවසර ලබා දෙන ලෙස ඉල්ලා තිබුණි.

<u>තීරණය</u>

☞ සාගර විශ්ව විද්‍යාලයේ අනුබද්ධිත ගාල්ල ප්‍රාදේශීය මධ්‍යස්ථානය මගින් ඉගැන්වීම් කරනු ලබන පාඨමාලා සම්බන්ධව සිසුන් දැනුවත් කිරීම සම්බන්ධ බැනරයක් අම්බලන්ගොඩ නගර මධ්‍යයේ මුදල් අය කිරීමකින් තොරව ප්‍රදර්ශනය කිරීම සඳහා සහා අනුමැතියට යටත්ව අවසර ලබා දීම වෙනුවෙන් ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධයක් නොමැති වූ බැවින් ඒ සඳහා **සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**03:06** ‘ නෙත් පාදන සිත් සනසන ශ්‍රී සුගත වන්දනා වෙසක් යායේ වැඩකටයුතු වලට අවශ්‍යතාවයන් කිහිපයක් සපුරා ගැනීම සම්බන්ධවයි ’ මැයෙන් පෝරඹ ශ්‍රී සුගතබිම්බාරාම විහාරස්ථානයේ විහාරාධිපති හිමියන් විසින් එවා තිබූ ලිපිය සභාගත **කරන ලදී.**

සමගි මිතුරු සංසදය විසින් සංවිධානය කරන ලද වෙසක් යායේ වැඩ කටයුතු සාර්ථක කර ගැනීම සඳහා පාර සුද්ධ කර ගැනීම, පුටු 200 ක් ලබා ගැනීම, තාර දැමීම, කැනපි 03 ක් ලබා ගැනීම, කොඩි කණු ලබා ගැනීම, වැලි ප්‍රවාහනයට ලොරියක් ලබා ගැනීම, හල්වතුරේ ඇල පිරිසිදු කිරීම යනාදි කටයුතු ඉටු කර ගැනීම සඳහා සහයෝගය ලබා දෙන ලෙස ඉල්ලා තිබුණි.

<u>**ගරු නගර සභා මන්ත්‍රී එම්. අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්**</u>

ගරු සභාපතිතුමනි පාර සුද්ධ කරන එකයි තාර දමන එකයි කර ගන්න බැරි වුනා. අනික් දේවල් නම් නගර සභාවෙන් කරල තිබුනා. තව දින පහක් පවතිනව උත්සවය. ඒ ටිකත් කරල දෙන්න කියල ඉල්ලා සිටිනවා.

<u>**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

වැඩ අධිකාරී මහතා ඒක අද කරල දෙන්න.

<u>**තීරණය**</u>

☞ සමගි මිතුරු සංසදය විසින් සංවිධානය කරන ලද වෙසක් යායේ වැඩ කටයුතු සාර්ථක කර ගැනීම සඳහා ඉල්ලීම් කර ඇති පාර සුද්ධ කිරීම, පුටු 200 ක් ලබා දීම, තාර දැමීම, කැනපි 03 ක් ලබා දීම, කොඩි කණු ලබා දීම, වැලි ප්‍රවාහනයට ලොරියක් ලබා දීම, හල්වතුරේ ඇල පිරිසිදු කිරීම යනාදි කටයුතු ඉටු කර දීමට ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ඒ සඳහා **සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**03:07** ‘ පොදු වෙළඳ සංකීර්ණයේ උඩු මහලේ අංක 10 කඩ කාමරය ගිවිසුම අවලංගු කර බස් නැවතුම් පොළ වෙළඳ සංකීර්ණයේ නව ගිවිසුමට අනුව සකස් කිරීම ’ මැයෙන් විෂය ලිපිකරු විසින් ඉදිරිපත් කර තිබූ ලිපිගොනුව සභාගත කරන ලදී.

පොදු වෙළඳපොල කඩ කාමර අංක 10 ට අදාල ගිවිසුම බස් නැවතුම්පොල වෙළඳ සංකීර්ණයේ ඇති නව ගිවිසුමට අනුව සකස් කිරීම සඳහා අනුමැතිය ලබා දෙන ලෙස ඉල්ලා තිබුණි.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

පොදු වෙළඳපොලේ 1987 ගිවිසුමේ වගන්ති ප්‍රකාරව මේ කොන්දේසිය අඩංගු වෙනවා.

7. කඩ කාමරය බදුකරුට ඔහුගේ/ඇයගේ භාර්යාවට/ ස්වාමි පුරුෂයාට හෝ දරුවකුට එම කඩයේ බදු අයිතිය පවරා දෙන ලෙස සභාපතිතුමාගෙන් ඉල්ලා සිටීමට බදුකරුට අයිතියක් ඇත. එවැනි සෑම පැවරීමකදීම සභාපතිතුමාගේ ලිඛිත අවසරය ලබා ගත යුතුය.
ඒ අනුව යම් කිසි පැවරීමක් කරනව නම් කරන්න පුළුවන් භාර්යාවට හෝ පුතාට පමණයි. බාහිර පාර්ශවයකට පවරනව නම් අපේ බස් නැවතුම් පොලේ ගිවිසුමේ අනුමැතිය ලබා දීල තියෙනවා බාහිර පාර්ශවයකට පවරන්න. මේගොල්ලන් ඉල්ලනවා බාහිර පාර්ශවයකට පවරන්න. එතකොට මුලින්ම මේ ගිවිසුම අවලංගු කරල බස් නැවතුම් පොලේ තියෙන ගිවිසුමකට යන්න ඕනෙ. එහිදී නගර සභාවට

ගාස්තුවකුත් අය වෙනවා. එක්වන් ගාස්තුව රු. 131250.00, පැරණි එක්වන් මුදල රු. 25100.00, වෙනස රු. 106150.00, යෝජිත පැවරුම් ගාස්තුව රු. 175000.00, ගෙවිය යුතු මුළු පැවරුම් ගාස්තුව රු. 281150.00 ක මුදලක් ගෙවල පැවරීමේ අයිතිය ලැබෙනවා. ඒ අනුව වෙනත් බාහිර පුද්ගලයකුට නීත්‍යානුකූලව පවරනව නම් පරණ ගිවිසුම අනුව බැහැ. ඒ පරණ ගිවිසුම ඉවත් කරල අළුත් ගිවිසුමකට යන්න සභාවේ අවසරය ඉල්ලා සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ආර්.එම්. ලසන්ත අජිත් කුමාර මහතා කතා කරමින්</u>**

සභාපතිතුමනි මිවෙල්ලාගෙ කඩේ ගාව කෝරිඩෝව වහල තියෙන්නෙ. බිත්ති බැදලා. මන්ත්‍රීවරුන්ට දැන් ගිහිල්ලා බලන්න පුළුවන්. එතනින් එහාට යන්න විදියක් නැහැ.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

සභාපතිතුමනි පොදු වෙළඳ පොළ අභාවයට ගිහිල්ලා තියෙන්නේ මේ තත්වය නිසා. බස් නැවතුම්පොලේ පවතින ගිවිසුමට ගියහම කවුරුහරි මේ කඩ අරගෙන පොදු වෙළඳපොළ දියුණු කර ගන්න පුළුවන්. මේ වෙනකොට මේ කඩ වැහිල තියෙන්නෙ. අපේ ලසන්ත මන්ත්‍රීතුමා කිව්ව පොදු වෙළඳපොළේ කෝරිඩෝවෙ පවා වහල බිත්ති බැදලයි කියලා.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ආදායම් පරීක්ෂක මහත්තය මේ කතාව ඇත්තද? එහෙම කරල තියෙනවනම් ඒක බරපතල වරදක්. එහෙම කරල තියෙනවනම් කඩල අයින් කරන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දූවගේ මහතා කතා කරමින්</u>**

සභාපතිතුමනි අපිට මේ පොදු වෙලළඳපොල අළුත් වැඩියා කරල පාවිච්චි කරන්න පුළුවන් තත්වෙට ගන්න බැරිද නගර සභාවට? මේක සුනාමියට අහුවුනා. තාම බැරිවුනා හදා ගන්න. මේක රෙපයාර්

කරන්න බැරිනම් කඩල හරි අළුතින් හදන්න බැරිද? රාජ්‍ය බැංකුවකින් සහන මුදලට ණයක් අරගෙන ප්ලෑන් එක හදල ඒ කඩ ටික විකුණල ඒ මුදලින් යම් කිසි ප්‍රමාණයක් හදල ඊට පස්සෙ අපි දෙන අයත් එක්ක ගිවිසුමකට අනුව කටයුතු කරොත් මම හිතනවා අපි නගර සභාව වශයෙන් මේකට ලොකු මුදලක් යට කරන්න ඕනෙ නෑ. අපිට තියෙන්නෙ කළමනාකරණ කටයුතු ටික කරන්න පමණයි. මම

සංවර්ධන කමිටුවේ ඉන්න වෙලාවෙත් ඔය ගැන තුන් හතර පාරක් කතා කරල අපි මිනින්දෝරු සැලැස්මට ගියා මම හිතන්නෙ. ඇත්තටම අපිටම ලැජ්ජයි සුනාමියෙන් පස්සෙ අපිට මේක හදාගන්න බැරි වීම සම්බන්ධව. අපි හැමෝම මේකට වග කියන්න ඕනෙ. දැන් අපිට තියෙන්නෙ මේකට නව සැලසුමක් යට පාර්කින් එකක් එක්ක ප්‍රතිසංස්කරණය කරොත් අම්බලන්ගොඩ නගරය සභාවෙ ආදායම වැඩි වෙයි. ඒ නිසා අපි හැමෝම එකතු වෙලා මේක සහයෝගයෙන් ගොඩ නගමු කියල මම ඉල්ලා සිටිනවා. කල හැකි හැම උදව්වක්ම මම කරනවා. රාජ්‍ය බැංකුත් එක්ක කතා කරන්න, විෂය භාර ඇමතිතුමා මුණ ගැහෙන්න යන්න මේ ඕනෑම දේකට මමත් එන්නම් කියන කාරණාව මම සභාවට ඉදිරිපත් කරනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී ඩී. ධර්මදාස මහතා කතා කරමින්</u>

සභාපතිතුමනි, පොදු වෙළදපොල කඩා ඉවත් කරන එක නම් අපරාධයක්. පසුගිය කාලෙ ආපු සුළගට වහලෙ තැන් කීපයක් ගැලවිලා තියෙනවා. ඒව පිලිසකර කරල පොළ වගේ දෙයක් එතෙන්ට ගෙන ගියොත් ගොඩක් වටිනවා.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

අපි මේ සම්බන්ධව මීට පෙරත් කතා කරල තියෙනවා. මෙතන ගොඩනැගිල්ල ඉදිකරනව නම් රුපියල් ලක්ෂ 1000 කට වඩා ගාණක් යනවා. අපිට අඩු පොළියට මුදල් ගන්න ස්ථාන තිබුනත්, අපිට මීට පෙර වැසි ජලය බැස යාම විධිමත් කිරීමේ ව්‍යාපෘතිය කියල ජලය බැසයාම සම්බන්ධයෙන් ව්‍යාපෘතියක් කරා. ඒකෙදි ණය මුදලක් ලබා ගෙන ගෙවීම සම්බන්ධයෙන් පසුගි සභාවල අපිට ගැටළුවකඋද්ගත වෙලා තියෙනවා. ඒ ගැටළුව නිරාකරණය වුනහම අපට මේ දේට ණය මුදලක් ලබා ගැනීමේ හැකියාව තියෙනවා. එනිසා දැනට අපි මේක පිලිසකර කරමු. අළුත් දේකට යන්න පිඹුරුපත් සකසමු කියල යෝජනා කර සිටිනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී එම්.ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා කතා කරමින්</u>

සභාපතිතුමනි ඔය ගිවිසුම මාරු කරන කොට නගර සභාවට කොපමණ මුදලක් එනවද? මොකද ඔය කඬේ වෙන කෙකුට පවරනව කියන්නෙ කාටහරි විකුණනවා.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

මේක නිකම්ම තිබුනොත් කීයක්වත් නෑ. මෙතනදි රු. රු. 281150.00 ක මුදලකුයි මාස තුනක කුලියයි ලැබෙනවා.

**තීරණය**

☞ පොදු වෙළඳපොල කඩ කාමර සඳහා ලබා දී ඇති ගිවිසුම වෙනස් කොට බස් නැවතුම්පොල වෙළඳ සංකීර්ණයේ ඇති නව ගිවිසුමට අනුව සකස් කිරීම සඳහාත්, වෙනත් පාර්ශවයකට පැවරීමේදී අදාල බදු මුදල්, පැවරුම් ගාස්තු සහ මාස 03 ක කඩ කුලිය ඇප තැන්පතුවක් ලෙස අය කර ගැනීමටත් **සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**පෙ.ව. 10.00 ට පමණ ගරු නගර සභා මන්ත්‍රී ඩබ්. එම්. නිලානි මෙනවිය සභාවට පැමිණෙන ලදී.**

**3:8** විෂය ලිපිකරු විසින් ඉදිරිපත් කර තිබූ ' නගර සභාව සතු තල්ගස්ගොඩ 04 වන පටුමගේ පිහිටි තැලිගල කන්ද ඉඩම පදිංචිකරුවන්ට ලබා දීමට අදාල සම්පූර්ණ වාර්තාව ' සභාගත කරන ලදී.

## තල්ගස්ගොඩ, දළුක්කන්ද,04 වන පටුමග නගර සභාව සතු ඉඩම් සඳහා ඔප්පු ලබාදීම පිළිබඳ වාර්තාව

අම්බලන්ගොඩ,තල්ගස්ගොඩ,දළුක්කන්ද පන්සල පාරෙහි බලයලත් මානක වික්ටර් ගොඩහේන මහතා විසින් 1999.12.20 දින මැන සකස් කරන ලද අංක 715 දරණ පිඹුරෙහි කැබලි අංක 4 බී1 නැමැති රූඩ් 01 පර්චස් 04.4 විශාල බිම් කැබැල්ල, 04 කණුව, කරන්දෙණියේ විජේමුණි මාලනී මෙන්ඩිස් මහත්මිය විසින් රු10,000.00 ක වටිනාකමකින් යුක්ත 6994 අංක දරණ ඔප්පුවෙන්, ඉඩම් අනුබෙදුමකින් නගර සභාවට මෙම ඉඩම් කොටස පවරා දී ඇත.මෙම ඉඩම් කොටසට අදාල වරිපනම් අංකය 63/8 වන අතර අයිතිකරු නගර සභාව වේ.

වර්තමානයේ මෙම ඉඩමෙහි පදිංචිකරුවන් 04 දෙනෙකි. එම්.ඩබ්.චන්ද්‍රලතා මහත්මිය,එච්.ඒ.ජයලත් මහතා,කේ.ඩබ්.ජයන්ත මහතා සහ ඒ.එම්.තනූජ චතුරංග මහතා එම පදිංචිකරුවන් වේ.මෙම ඉඩම් සඳහා ඔප්පු ලබා දෙන ලෙස වරින් වරම බහුල වශයෙන්ම ඉල්ලීම් කර ඇත්තේ එම්.ඩබ්.චන්ද්‍රලතා මහත්මිය සහ ඇයගේ දියණිය වන ජී.එච්.ඒ.ශ්‍යාමලී මහත්මියයි.ඔවුන්ගේ ලිපි වල සඳහන් පරිදි මීට වසර 08 – 09 ට පෙර ඔවුන්ට නිවසක් සාදා ගැනීම සඳහා මෙම ඉඩම් කොටස ලබාදී ඇත්තේ අඩු ආදායම්ලාභී පදනම මත එවකට අම්බලන්ගොඩ හිටපු ප්‍රාදේශීය ලේකම්ගේ වාචික උපදෙස් මතය. අනෙක් පදිංචිකරුවන් 03 ට මෙම ඉඩම් කොටස් ලබාදී ඇත්තේ දකුණු පළාත් ගරු මහ ඇමතිතුමාගේ

මූලිකත්වය යටතේ එවකට නගර සභාවේ හිටපු උප නගරාධිපතිතුමා විසින් බවද එම ලිපිවලම සඳහන්වේ.එමෙන්ම එම ලිපියෙහිම චන්ද්‍රලතා මහත්මිය සඳහන් කර ඇති පරිදි රු.100,000.00 ක ගොඩනැඟිලි ද්‍රව්‍ය ආධාරද මෙම අවස්ථාවේ ඔවුන්ට ලබා දී ඇත. (ගොනුවේ පිටු අංක 20) එනමුදු ඔවුන්ට මෙම ඉඩමෙහි පදිංචි වීම සම්බන්ධව හෝ නිවෙස් සාදාගැනීම සම්බන්ධව හෝ කිසිදු ලියවිල්ලක් මෙම ලිපි ගොනුවේ නොමැත.

චන්ද්‍රලතා මහත්මිය විසින් දිගින් දිගටම තමන් පදිංචි ඉඩම් සඳහා ඔප්පු ලබා දෙන ලෙස ඉල්ලීම් කිරීම නිසාවෙන් මේ පිළිබඳව 2016.10.11 වන දිනැති ලිපියෙන් පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලයෙන් උපදෙස් ඉල්ලා ඇත. (ගොනුවේ පිටු අංක 22) එම ලිපියට පිළිතුරක් ලැබී නොමැත. ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයෙන් සහ අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන්ද මෙම ගැටළුව නිරාකරණය කිරීමට කටයුතු කරන මෙන් නගර සභා කාර්යාලයෙන් ඉල්ලීම් කර ඇත. (ගොනුවේ පිටු අංක 28 හා 29)

දකුණු පළාත් ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ දැනුම්දීම පරිදි පළාත් පාලන සහකාර කොමසාරිස් විසින් මේ පිළිබඳව සකස් කරන ලද සම්පූර්ණ වාර්තාවක් එම කාර්යාලය විසින් දකුණු පළාත් පළාත් පාලන කොමසාරිස් කාර්යාලය වෙත 2016.12.12 වන දින යොමු කර ඇත. (ගොනුවේ පිටු අංක 38) පළාත් පාලන කොමසාරිස් කාර්යාලය විසින් මෙම වාර්තාව ගරු දකුණු පළාත් ප්‍රධාන අමාත්‍යතුමාගේ අනුමැතිය සඳහා යොමු කර ඇත.ඒ අනුව ගරු දකුණු පළාත් ප්‍රධාන අමාත්‍යතුමා විසින් මෙම ඉඩම බැහැර කිරීම සඳහා රජයේ තක්සේරුවක් ලබාගෙන විකිණීමක් ලෙස එකී පදිංචිකරුවන් වෙත විකිණීම හා එම මුදල් යොදාගෙන නගර සභා බල ප්‍රදේශයෙන් වෙනත් ඉඩමක් නගර සභාව විසින් මිලදී ගෙන පොදු කටයුතු සඳහා යෙදවීම හෝ උක්ත ඉඩම පදිංචිකරුවන් වෙත බදු පදනම මත ලබාදීමට කටයුතු කරන ලෙසට 2017.03.27 වන දින පළාත් පාලන දෙපාර්තමේන්තුව වෙත යොමු කරන ලද ලිපියෙන් අනුමැතිය ලබා දී ඇති බව පළාත් පාලන දෙපාර්තමේන්තුව මඟින් 2017.04.19 වන දි අප වෙත දන්වා ඇත. (ගොනුවේ පිටු අංක 39)

ඉහත අනුමැතිය පරිදි කටයුතු කරන ලෙසත් මෙම ඉඩම විකිණීමක් කරන්නේ නම් මෙම ප්‍රදේශයෙන් පොදු කටයුතු සඳහා වඩාත් සුදුසු ඉඩම් කැබැල්ලක් මිලදී ගෙන එය පොදු කටයුතු සඳහා යොමු කරන ලෙසත් පළාත් පාලන කොමසාරිස් කාර්යාලයේ ඉහත සඳහන් ලිපිය මඟින් උපදෙස් ලබාදී ඇත. මෙම උපදෙස් පරිදි වර්තමානයේ මෙම ඉඩමේ පදිංචිකරුවන් 2017.05.16 වන දින නගර සභාවට කැඳවා ඉහත අනුමැතිය පිළිබඳ ඔවුන් දැනුවත් කර මේ පිළිබඳව ඔවුන්ගේ එකඟතාවය විමසා ඇත. (ගොනුවේ පිටු අංක 44)

එම්.ඩබ්.චන්ද්‍රලතා මහත්මිය විකුණුම්කරයක් ලෙස තමන් පදිංචි ඉඩම් කොටස ලබාගැනීමට කැමැත්ත පල කර ඇති අතර අනෙක් පදිංචිකරුවන් තිදෙනා, මෙම ඉඩම සඳහා රජයේ තක්සේරුව ලද පසු තමන් පදිංචි ඉඩම් කොටස් විකුණුම්කරයක් ලෙස ලබාගන්නේද බදු පදනම මත ලබාගන්නේද යන්න තීරණය කරන බව ලිඛිතව දන්වා ඇත. (ගොනුවේ පිටු අංක 48- 51)

017.06.12 වන දිනැති ලිපියෙන් මෙම ඉඩම නොමිලයේ මැනුම්කර පිඹුරුපත් සකස් කර දෙන මෙන් ගාල්ල මිනුම්දෝරු අධිකාරී කාර්යාලයෙන් ඉල්ලීමක් කර ඇත. .(ගොනුවේ පිටු අංක 62) මෙම ඉඩම සඳහා ඔප්පු සහ පත්ඉරු පවතින බැවින් මෙය පෞද්ගලික ඉඩමක් වන බවත් එබැවින් නොමිලයේ මැනිම් කටයුතු ඉටුකළ නොහැකි බව 2017.06.28 වන දිනැති ලිපියෙන් ගාල්ල දිස්ත්‍රික් ජොෂ්ඨ මිනින්දෝරු අධිකාරී විසින් දන්වා ඇත. (ගොනුවේ පිටු අංක 63) එබැවින් මිල ගණන් කැඳවා අවම මිල ගණන් ඉදිරිපත් කරන ලද .(ගොනුවේ පිටු අංක 65) පී.ඒ. රබින් චන්ද්‍රසිරි මහතා මඟින් අදාල ඉඩම මැනුම් කර 2018.03.19 දිනැති අංක 3711 දරණ පිඹුරුපත සකස් කරන ලදී. (ගොනුවේ පිටු අංක 99) මෙම ඉඩම මැනීම්කර පිඹුරුපත් සකස් කිරීම සඳහා මැනීම් ගාස්තුව රු.20,000.00 ක් වන අතර වර්තමාන පදිංචිකරුවන්ට මෙම මුදල නගර සභා කාර්යාලයේ තැන්පත් කරන ලෙස 2017.10.25 වන දිනැති ලිපියෙන් (ගොනුවේ පිටු අංක 73) දන්වා ඇති අතර එකී පදිංචිකරුවන් 04 දෙනා විසින් රු.5000.00 බැගින් 44125/ 2017.11.06 , 6857/ 2018.01.30 , 6864 /2018.01.30 සහ 6874 /2018.02.01 අංක හා දිනැති ලදුපත් මඟින් නගර සභා කාර්යාලයේ මෙම මුදල් තැන්පත් කර ඇත. .(ගොනුවේ පිටු අංක 77,87,89,90)

මෙම ඉඩමේ පදිංචි එම්.ඩබ්.චන්ද්‍රලතා මහත්මිය විසින් දකුණු පළාත් සභා විපක්ෂ නායක ගරු අසෝක ධනවංශ ද සිල්වා මැතිතුමා මඟින් මේ පිළිබඳව දකුණු පළාත් සභා පෙත්සම් කාරක සභාවට 2017.02.04 වන දින පැමිණිලි කර ඇත.ඒ අනුව දකුණු පළාත් සභා ලේකම් කාර්යාලයෙන් 2017.08.30 දිනැති ලිපියෙන් 2017.09.11 වන දින පෙත්සම්කාරක සභාවට නගර සභා නිලධාරීන් කැඳවා ඇත. (ගොනුවේ පිටු අංක 69,70)

දකුණු පළාත් සභා ලේකම් කාර්යාලයේ සභා ලේකම්ගේ 2017.10.03 දිනැති ලිපිය මඟින් පෙත්සම් කාරක සභාවේ තීරණය දන්වා ඇති අතර එමඟින් සඳහන් කර ඇත්තේ දැනට නගර සභාව විසින් මේ සඳහා කටයුතු කර ඇති බැවින් එම කටයුතු කඩිනම් කරන ලෙස අමාත්‍යාංශ ලේකම්ට දන්වා ඇති අතර මේ පිළිබඳ කටයුතු කර එහි ප්‍රගතිය පෙත්සම් කාරක සභාවට දන්වන ලෙසද දන්වා ඇත. .(ගොනුවේ පිටු අංක 71) පෙත්සම්කාරිය විසින් (එම්.ඩබ්.චන්ද්‍රලතා) මෙම ඉඩමේ පදිංචි අනෙක් පදිංචිතරුවන් 03 ඔප්පු ලබාගැනීමට අකමැත්තක් දක්වන්නේ නම් තමන් ශුක්ති විඳිනු ලබන පර්චස් 08 ක පමණ භූමි ප්‍රමාණය මැන රජයේ තක්සේරුව අනුව විකුණුම්කරයක් ලබාදෙන ලෙස නැවතත් පෙත්සම්කාරක සභාවෙන් ඉල්ලීමක් කර ඇත. (ගොනුවේ පිටු අංක 74)

මෙම ඉඩම සඳහා සකස් කරන ලද 3711 අංක දරණ පිඹුරුපත රජයේ තක්සේරුව ලබාගැනීම සඳහා, මාතර තක්සේරු දෙපාර්තමේන්තුව වෙත 2018.03.20 දින යොමු කර ඇත. තක්සේරු වාර්තාව මෙතෙක් ලැබී නොමැත. .(ගොනුවේ පිටු අංක 100)

දකුණු පළාත් සභා ලේකම්ගේ 2018.02.22 දිනැති ලිපියෙන් දන්වා ඇති පරිදි 2018.03.12 වන දින නැවත මේ පිළිබඳව පෙත්සම්කාරක සභාවේදී විමර්ශනය කර ඇත.(ගොනුවේ පිටු අංක 86) දකුණු පළාත් සභා ලේකම්ගේ 2018.03.23 දිනැති ලිපියෙන් දන්වා ඇත්තේ පෙත්සම්කාරිය

(එම්.ඩබ්.චන්ද්‍රලතා) පදිංචි ඉඩම සඳහා මිනින්දෝරු වාර්තාව ලැබීමෙන් පසු වර්තමාන රජයේ තක්සේරුව අයකර කඩිනමින් මෙම කාර්යය අවසන් කරන ලෙස සහ මෙහි ප්‍රගතිය පෙත්සම් කාරක සභාව වෙත දන්වන ලෙසයි.(ගොනුවේ පිටු අංක 106)

මෙම ඉඩමේ මැනීම් කටයුතු කරන ලද පී.ඒ .රබීන් චන්ද්‍රසිරි මහතාට මැනීම් කටයුතු සඳහා ගාස්තුව වන රු.20,000.00 ක මුදල මේ වන තෙක් ගෙවා නොමැත.ඒ මහතා විසින් අදාල මුදල් ලබා දෙන ලෙස ඉල්ලීමක් කර ඇත. .(ගොනුවේ පිටු අංක 98)

අම්/නස/02/15/02 අංක දරණ නගර සභාව සතු ඉඩම් සඳහා ඔප්පු ලබාදීම (තල්ගස්ගොඩ, දළුක්කන්ද,04 වන පටුමග) නැමැති ගොනුව අනුව අවශ්‍යා කටයුතු සඳහා මෙසේ වාර්තා කරමි.

සකස් කළේ - ආර්.ඩබ්.ඩී.මල්කාන්ති
සංවර්ධන නිළධාරී

<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දූවගේ මහතා කතා කරමින්</u>

සභාපතිතුමනි මේක අපේ නගර සභාවට අයිති ඉඩමක් නිසා ඒ අය කුමන හෝ කාගෙ හෝ අවසර මත භාවිතා කරල තියෙනවා. අපට පොදු කටයුතු සඳහා අනිවාර්යෙන්ම ඉඩම් කොටසක් ලබා දිය යුතුයි. එහෙමනම් රජයේ තක්සේරු මුදල් දැනුම් දුන් පසු මේ වාර්තාව පරිදි ඒ අය අවු 10 වගේ කාලයක් භාවිතා කරල තියෙන නිසා එම ඉඩමෙන්ම ඒ ප්‍රමාණයට සරිලන ඉඩම් කොටසක් ලබා ගැනීමට අදාල ඉඩමේ පදිංචි වෙලා ඉන්න අයගෙන් මුදල් අය කරගැනීම සුදුසුයි කියල මම යෝජනා කරනවා.

<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>

සභාපතිතුමනි මේ වන විට මෙම ඉඩම සීමා නිර්ණය කිරීමේදී කරන්දෙනිය පැත්තට යන තත්වෙ තමයි තියෙන්නෙ. එහෙම වුනොත් අපිට එතනින් ඉඩමක් ගන්න එකේ තේරුමක් නැති වෙනවා.

<u>ගරු සභාපති එම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

විපක්ෂනායකතුමා කරපු යෝජනාවට එකගනම් ඒක ස්ථිර කරන්න.

<u>ගරු නගර සභා මන්ත්‍රී එම්.ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා කතා කරමින්</u>

සභාපතිතුමනි අපි එකග නැහැ. මොකද ඔබතුමත් මමත් මේකෙ හිටියා ඔය කාල සීමාවල් වලදි. අපිට කමක් නැහැ නැති බැරි කෙනෙකුට ඉඩම් දුන්නට. නමුත් ප්‍රධාන අමාත්‍යතුමාගෙ නම ගැච්චිච නිසා මම

මේ කතා කරන්නෙ. උප සභාපතිතුමා දන්නව ඕකෙ වෙච්ච දේ හොඳින්ම. ඔබතුමා තමයි මේකෙ මුලින්ම 3 දෙනෙක් පදිංචි කරේ. අනිත් එක්කෙනා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ වැඩ කරන කාලෙ ප්‍රාදේශීය ලේකම් හිටියෙ වර්නන් පෙරේරා මහත්මයා මම හිතන්නෙ. එතුමියගේ කරදරය මත මානුෂික පැත්තෙන් හිතල එතුමියට ඉඩම් කෑල්ල දුන්නා. අපි කොයි දේ කලත් නීත්‍යානුකූල විදියට කරන්න ඕනෙ. ඕකෙ මම හිතන්නෙ නෑ එකම නිලධාරියෙක්වත් වගකීම අරගෙන කියලා. මේක කරකැවිකැවි ගිහිල්ල ආපහු නගර සභාව පැත්තට ඇවිල්ලා.

<u>ගරු සභාපති එම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

මේ විදිය ප්‍රශ්නයකදි පළාත් සභාව පැත්තෙන් අනුගමනය කරන ක්‍රම කීපයක් තියෙනවා. පෙත්සම් කාරක සභාව කියන්නෙ සියළු දෙනා කැඳවල මන්ත්‍රීවරුන් විසින් විසඳල සාධාරණ විසඳුමක් දෙනවා. අපි විරුද්ධ නම් ඒ මොහොතෙම විරුද්ධතාවය ප්‍රකාශ කරන්න ඕනෙ.

<u>ගරු නගර සභා මන්ත්‍රී එම්.ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා කතා කරමින්</u>

සභාපතිතුමනි නගර සභාවත් කරල තියෙන්නෙ වරදක්. නගර සභාව සතු ඉඩමක පදිංචි කිරීම තුල. මේක නීත්‍යානුකූල වෙන විදියට විසඳන්න තමයි අපි කියන්නෙ. මේක ප්‍රධාන අමාත්‍යතුමා මැදිහත්වෙලා දීපු එකක් නෙමෙයි. නැත්තම් වැරදි මතයක් යනවා ප්‍රධාන අමාත්‍යතුමා නගර සභාවට අයිති ඉඩම් නිකං දීලයි කියලා. නමුත් ඕකෙ බලෙන් ගිහිල්ලා පදිංචි වුනා කොටසක්. පස්සෙ ප්‍රාදේශීය ලේකම්තුමා එක්කෙනෙක්ට දුන්නා. විශේෂයෙන් මම සඳහන් කරනවා ප්‍රධාන අමාත්‍යතුමාගෙ කැමැත්ත උඩ නෙමෙයි මේක දුන්නෙ. මේකෙ පදිංචි වෙලා ඉඳලා ඊට පස්සෙ අපේ උප සභාපතිතුමා ඉල්ලීම් කරාට පස්සෙ තමයි මේ විදියට කෙරුනේ.

<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දූවගේ මහතා කතා කරමින්</u>

සභාපතිතුමනි කවුරු කරත් නගර සභාව සතු ඉඩම් මෙහෙම දෙන එකට අපි විරුද්ධයි. මේක වැරදි පූර්වාදර්ශයක්. සභාව සතු දේපල මන්ත්‍රීවරුන්ට හිතුන පරිදි දීම සම්පූර්ණ තහනම්. ඒකට අපි තදින් විරුද්ධයි. එසේ කරන්න එපා කියලත් අපි ඉල්ලීම් කරනවා. මේ ඉඩම් ප්‍රශ්නෙ ආපු නිසා මම මේදේ යොමු කරනවා. පනියන්දූව පාරෙන් මහ අම්බලන්ගොඩ පාරට එනකොට දැනට අවු. 20 කට විතර ඉහත රීගල් එක ඉස්සරහ ළමා උද්‍යානයක් තිබුනා. අද ඒක නැහැ. අද රථගාලක් බවට පත්වෙලා. මම ඉල්ලීමක් කරනවා කරුණාකරල නගර සභාව සතු ඉඩම් අන් අයට කිසි විදියකට අයුතු ප්‍රයෝජන ගන්න ඉඩ තියන්න එපා. මම ඉල්ලීමක් කරනවා රීගල් එක ඉස්සරහ තියෙන ඒ ඉඩම වට කරල ගේට්ටුවක් දාන්න. අපි කුමන හෝ ප්‍රතිපාදන වලින් ළමා උද්‍යානයක් එතන ගොඩ නගමු. ඊලගට මම කියන්න ඕනෙ 2015 දින 100 ආණ්ඩුවේදි ලක්ෂ 10 ක් ලබා දුන්නා මම මානාන ක්‍රීඩා පිටියේ තාප්පය ඉදි කරන්න. අපි පොඩි කාලෙ ඕකෙ ගල් බොරළු වල සෙල්ලම් කලේ. දැන් පිට්ටනිය හොඳට තියෙනවා. මට කීප දෙනෙක්ම කිව්ව ලර්නර්ස් එකේ වාහන මෙතෙන්ට එනව කියලා. කරුණාකරල ඒක නවත්තන්න. මම ඉල්ලා සිටිනවා ඒකට ගේට්ටුවක් දාන්න. අපි ක්‍රීඩා කරපු අය විදියට කැමතියි

මේව හදල ළමයි අනිසි දේවල වලට යොමු නොවී ක්‍රීඩාවට යොමු වෙනවට. මම ලක්ෂ 25 ක් තුන් වතාවකට ලබා දුන්නා හල්වතුර ක්‍රීඩා පිටිය හදන්න. මම ඉල්ලීමක් කරනවා නගර සභාව සතු මානාන ක්‍රීඩා පිට්ටනියටත් කැරකෙන ගේට්ටුවක් දාන්න කියලා. හල්වතුර ක්‍රීඩා පිටියටත් මගේ මේ වසරෙ ප්‍රතිපාදන ටික මම දෙන්නම්. මොකද මේ දේවල් කරල දුන්නහම අපිට සතුටක් තියෙනවා ළමයි මේවගෙන් ප්‍රයෝජන ගන්න කොට.

**<u>ගරු සභාපති එම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

අපි දැන් සාකච්ඡා කරන්නෙ දළුක්කන්ද 4 වන පටුමගේ සිද්ධිය සම්බන්ධයෙන්. ඒ අතරතුර වෙනත් ඉඩම් ගැන කතා කරහම වෙන්නෙ මේක ඉවරයක් නැති වෙනවා. ඒනිසා මම කරුණාවෙන් ඉල්ලා සිටිනවා මේක කතා කරල ඉවර කරන්න. ඊට පස්සෙ වෙනත් කරුණු යටතේ අනික් දේවල් කතා කරන්න. මෙහෙම වෙනකොට පළවෙනියට ගත්ත කරුණට ගන්න තීරණය අමතක වෙනවා. නැත්තම් වෙන්නෙ සභාවල කතා කිරීම පමණයි. ඒ නිසා ඕනම කරුණක් එක් වරක් පමණක් කතා කරන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්. ජගත් කුමාර මහතා කතා කරමින්</u>**

සභාපතිතුමනි මානාන ක්‍රීඩා පිට්ටනියට තමයි කලින් අම්බලන්ගොඩම කුණු දැම්මෙ. 1997 ඔබතුමාල ආවට පස්සෙ පස් දාල කුණු වහල පිට්ටනියක් බවට පත්කරා. නමුත් 2004, 2005 වෙනකම් ඕකෙ එක තණකොල ගහක්වත් හිටෙව්වෙ නැහැ. මම පත්වෙලා ආවට පස්සෙ ගරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගෙ එක ගමකට එක වැඩක් යටතේ ලැබුන ලක්ෂ 10 න් මම මුලින්ම කරේ මගේ ගමේ සහෝදර සහෝදරියන්ගෙ ඉල්ලීම පරිදි මේ පිට්ටනියෙ වැඩ පටන් ගත්ත එක. හැබැයි පළවෙනි අදියරේදි සම්පූර්ණ පිට්ටනියෙම තණකොල අල්ලන්න උනේ නැහැ. කොටසක විතරයි තණකොල ඇල්ලුවෙ. දෙවනි අදියරේදි ගමේ අය ඉල්ලීම් කරා පාරෙ කාණු හදන්න. කාණු දාන්න කියලා. ඊට

පස්සෙ මම ඒක කරා. මෙතුමා කිව්ව අපි වාහන දානවයි කියල ක්‍රීඩා පිටියට. අපි වාහන රිවස් කරන්නෙ ක්‍රීඩා කරන කොටසෙ නෙමෙයි. මෙතුමා කියන විදියට මෙතන ක්‍රීඩා කිරීමට කිසිම අවහිරයක් වෙලා නැහැ. මෙතුමා කියනව නම් ඒකත් කරන්න එපා කියල. මම ඒක නොකර ඉන්නම්. ක්‍රීඩා පිටියෙ වැටක් ගහල ගේට්ටුවක් දාන්න. අපිත් කැමතියි ඒකට සභාපතිතුමනි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩබ්. එම්. නිලානි මෙනවිය කතා කරමින්</u>**

සභාපතිතුමනි මේව ගැන කතා කරන කොට පරිස්සමින් කතා කරන්න කියන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරමිණියගේ මහතා කතා කරමින්</u>**

සභාපතිතුමනි මේ ඉඩම් වල වැසියො අවුරුදු 10 ක කාලයක් තිස්සෙ තමන්ගෙ ධනස්කන්ධය මේ වෙනුවෙන් වැය කරල දැන් නිවහන් ගොඩ නගල අවසන්. ඒවගේම මේ චන්ද්‍රලතා මහත්මිය තමන්ගෙ දුක් ගැනවිල්ල ප්‍රාදේශීය ලේකම්වරයට කිව්වට පස්සෙ තමන්ගෙ පූර්ණ සහයෝගය දීලයි ඒ අවස්ථාව දීල තියෙන්නෙ. ඒවගේම අපේ නියෝජ්‍ය සභාපතිතුමා මෙයට සහයෝගය දුන් බවට ප්‍රකාශ වුනා.

කවුරු හෝ මේ වන විට අපේ නගරයේ වැසියො මේ වන විට පදිංචි වෙලා හමාරයි. මේ වන විට අපේ සභාවත් ඉක්මවල පෙත්සම් කාරක සභාව, ප්‍රධාන අමාත්‍යවරයා ආදී ඉහලට මේ ගැටළුව ගිහිල්ලයි තියෙන්නෙ. ඔවුන්ගේ අනුමැතියත් ලැබිල හමාරයි. එනිසා අපි සභාව විදියට මෙම ගැටළුවට විරුද්ධ වීම නිෂ්පලයි මම හිතන හැටියට. මෙම ඉඩම මේ වන විට තක්සේරු දෙපාර්තමේන්තුව වෙත යොමු වෙලයි තියෙන්නෙ. ඒ තක්සේරුව ලැබුනු පසු ඒ හිලව්වට ලැබෙන ඉඩම අරගෙන සතුටු වෙලා මේ හතර දෙනා සතුටු වන විදියේ විසඳුමකට යමුයි කියල අවසාන වතාවටයි කියල හිතාගෙන කරන යෝජනාව කරමින් මම නවතිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.ජී. ලක්ෂ්මි හේමන්තා ද සිල්වා මෙනවිය කතා කරමින්</u>**

සභාපතිතුමනි මම නම් ශ්‍රේෂන් මන්ත්‍රීතුමා වගේ නිවිල කතා කරන්නෙ නැහැ. මිනිස්සු දැනගන්න ඕනෙ අපි කොහේද මේ පදිංචි වෙන්නෙ කියල. එහෙම නම් සභාපතිතුමා අර පර්සි අයිය ළිද ලග ගෙයක් හැදුවා. අන්න ඒකටත් අවසරය දෙන්න. අර චිත්‍රා මහත්මියත් ගෙයක් හැදුවා ඒකටත් ඔප්පුවක් දෙන්න. මෙහෙම ගියොත් සභාපතිතුමා අපේ නගර සභාව සතු ඉඩම් වලට අපිට ඔප්පු ප්‍රදානය කරන්න සිදු වෙනවා. තමන් දැන දැනම තමයි වරද කරල තියෙන්නෙ. චන්ද්‍රලතා මහත්මියගෙ එකට පොඩි සහනයක් දෙන්න පුළුවන්. තව ටික දවසක් ගිහිල්ලා මේ නගර සභාව ඇතුලෙ කවුරුහරි ගෙයක් ගැහුවොත් ඒකටත් කැමති වෙනවද කියන එකයි මම අහන්නෙ. අනිත් එක ඕකෙ තක්සේරුව කරන්නෙත් ඒ එන නිලධාරීන්. මට එකක්. මෙතුමාට එකක්. එහෙම තමයි. ලොකු ලොකු සල්ලි කාරයින්ට එකක් දුප්පත් මිනිස්සුන්ට එකක්. ඒක නිසා ඔය තක්සේරුව ගැන මගේ කිසිම විශ්වාසයක් නැහැ සභාපතිතුමා. නොදැන කරපු වරදට සමාවක් දෙන්න පුළුවන් වුනත් දැනගෙන කරපු වරදට සමාවක් දෙන්න බැහැ. චන්ද්‍රලතා මහත්මියට මම ඒ මහත්මියට පක්ෂග්‍රාහි වෙනවා නෙමෙයි ප්‍රාදේශීය ලේකම්තුමා දීපු නිසා පොඩි සහනයක් තියෙනවා. අනික් එක පර්චස් 40 ක් කියන්නෙ පර්චස් 6 ගානෙ කැඩුවොත් 6

දෙනෙකුට විතර දෙන්න පුළුවන්. එහෙම නම් තව දෙන්නෙකුටත් දීල තක්සේරුවේ වටිනාකමට අපි එකගනම් පමණක් මගේ කැමැත්ත දෙනවයි කියල ප්‍රකාශ කරනවා. අනිත් එක අපි ඕක දීල කොහොමද ඉඩමක් ගන්නෙ අම්බලන්ගොඩ සීමාව තුල. ඒක නිසා මේකට මගේ කිසිම කැමැත්තක් නොමැති බව ප්‍රකාශ කරනවා. මොකද මේක නගර සභාවෙයි කියල දැන දැන පදිංචි වෙච්ච නිසා. ඒවගේම ප්‍රාදේශීය ලේකම්තුමා ලබා දීපු එක සම්බන්ධව අවධානයක් යොමු කර සලකා බලන ලෙසත් ඉල්ලා සිටිමින් මම නිහඬ වෙනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්</u>**

සභාපතිතුමනි ඕකෙ ඇස්තමේන්තුව ගත්තොත් රු. 2000 ක් 3000 ක් දේවි. එහෙම වුනොත් ඒක ප්‍රායෝගික නැහැ. මෙතුමිය කිව්ව වගේ එහෙම හිතවත් කමට මුදල් අඩු කිරීමක් කරොත් මම විරුද්ධයි. එහෙමනම් අපි ඒ ප්‍රදේශයේ පවතින මිල ගණනක් නියම කරල දෙන්න ඕනෙ. නැත්තම් අපිට පාඩුයි.

**<u>ගරු සභාපති එම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

අපිට මිල නියම කිරීමේ අයිතියක් නැහැ. තක්සේරු දෙපාර්තමේන්තුව විසින් තමයි මිල නියම කරන්නෙ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්. සරත් චන්ද්‍ර ද සිල්වා මහතා කතා කරමින්</u>**

සභාපතිතුමනි තක්සේරු ආයතනයෙන් මේ ඉඩම තක්සේරු කරල දෙනවා. අපි ඉඩමක් ගන්න කොටත් අපිට තක්සේරු කරල දෙනවනම් ඒකෙ ගැලපීමක් තියෙනවා. අපි රාජ්‍ය ආයතනයකින් ගන්නකොට තක්සේරුවක් නෑ දෙනකොට තක්සේරුවක් තියෙනවා. ඒ දෙක පරස්පරයි නේද?

**<u>ගරු සභාපති එම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

අපි විකුණනවනම් හරි ගන්නවනම් හරි රජයේ තක්සේරුකරු වෙත බැඳී සිටිනවා. උදාහරණයක් වශයෙන් තල්ගස්ගොඩබැද්ද ඉඩම මම ඒ කාලෙ 1930000.00 ක් දීල නගර සභාවට ගත්ත ඉඩමක්. නමුත් සුනාමි ව්‍යසනයත් එක්ක හිටපු සභාපතිතුමා ගෙවල් හදන්න ඒක දුන්නා. ඒක ගත්තෙ කසල කළමනාකරණය කරන්න වැඩසටහනක් සඳහායි. ඒ වෙලාවෙ රජයේ තක්සේරුකරු විසින් තක්සේරු කරලයි අපි ගත්තෙ. අපි විකුණන කොටත් තක්සේරුකරුගේ තක්සේරුවට යටත්.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩී. ධර්මදාස මහතා කතා කරමින්</u>**

සභාපතිතුමනි මේ ඉඩම සම්බන්ධයෙන් පෙත්සම් කාරක සභාවත්, ප්‍රධාන අමාත්‍යතුමාත් ගන්නා තීරණයත් නගර සභාව ඊට විරුද්ධ වුනොත් ලැබෙන ප්‍රතිඵලයත් නගර සභාවට කැමති තීරණයක් ගැනීමෙන් ලැබෙන ප්‍රතිඵලයත් සම්බන්ධයෙන් දැනගන්න කැමතියි.

**<u>ගරු සභාපති එම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

අපි බැඳී සිටිනවා අපේ පසුගිය සභාව, මේ සභාව කියල සභා වර්ග කීපයක් නැහැ. අපි සියළුම දෙනා පසුගිය සභාවෙත් මේ සභාවෙත් අනුප්‍රාප්තිකයො. පසුගිය සභාවෙන් කරපු සියළු දේවල් අපි භාරගන්න වෙනවා. මේ සභාව විසින් කරන සියළු දේවල් ඊලග සභාව භාර ගන්න වෙනවා. ඒ නිසා අපිට ප්‍රතික්ෂේප කිරීමේ බලයක් නැහැ සාධාරණ හේතුවක් නැතිව. මේ පෙත්සම් කාරක සභා තීරණයට එකග නැත්තම් නැවත විමර්ශනයක් කරන්න කියලා අපි ඉල්ලීමක් කරන්න ඕනෙ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ.එම්. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්</u>**

සභාපතිතුමනි මමත් කියනවා මේක හතර දෙනෙකුට බෙදීම අසාධාරණයි. එක එක්කෙනාට විවිධ කොටස් තමයි මේකෙ බෙදිල තියෙන්නෙ. විපක්ෂනායකතුමා කිව්ව වගේ තක්සේරු කරල ක්‍රමවේදයකට දෙනවට නම් අපේ විරුද්ධත්වයක් නැහැ. නමුත් මේක සාධාරණයක් වෙන්න ඕනෙ. අපි

කැමතියි විශේෂයෙන්ම චන්ද්‍රලතා මහත්මිය අසරණ කාන්තාවක්. ඇයට දීමට නම් අපි කාන්තාවන් වශයෙන් කිසිම විරුද්ධතාවයක් නැහැ. නමුත් මේක සම විදියකට බෙදීම් කටයුතු කරන්න කියල තමයි මමත් කියන්නෙ.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

සභාපතිතුමනි මේකෙ ඔප්පුව ගෙනත් දුන්නෙ චන්ද්‍රලතා මහත්මිය.

**<u>ගරු සභාපති එම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

නැහැ මේකට ඔප්පුවක් තිබුණ. මේ පහුගිය කාලෙදි සේරම වෙනස් වෙලා. අළුතින් ලිපි ගොනු හදලා. කිසි දෙයක් හොයන්නෙ නැතිව තමයි කරල තියෙන්නෙ. ඔතන වුනත් ඇත්තෙ එහෙම දෙයක්.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

සභාපතිතුමනි මේ ඉඩමෙ දැන් තියෙන්නෙ පර්චස් 36 ක් විතර. මේ වාර්තාව අනුව එවකට උප සභාපති ඉදල තියෙන්නෙ රාහුල ලලිතවික්‍රම මහතා. මේක තනි පුද්ගලයෙක් අල්ලන් හිටියෙ. කිසි කෙනෙකුට කිට්ටු කරන්න නොදී මේක අල්ලන් හිටියා. මම ගිහිල්ල මේක සුද්ද කරල ඒ මනුස්සයට යන්න කිව්ව. මේක 1999 ඉදල 2009 වෙනකන් මේක බලහත්කාරයෙන් අල්ලන් හිටියා ඒ මනුස්සයා. කවුරුවත් මේ දිහා බැලුවෙ නැහැ. මට පුද්ගලිකව කිව්වහම මේක සභාවට අයිති දෙයක් කියල මම ගිහිල්ල සුද්ද කරේ. ඊට පස්සෙ දෙන්නෙක් තුන්දෙනෙක් ගිහිල්ල මේක අල්ල ගත්තා. විශේෂයෙන්ම කියන්න ඕනෙ පාක්ෂික වශයෙන් නම් මගේ එක්කෙනයි මෙතන ඉන්නෙ. මේකට ගරු ප්‍රධාන අමාත්‍යතුමා උදව් කරා ඒ මිනිස්සුන්ට ගෙවල් හදාගන්න. ගිහිල්ල බලල උදව් කර නිසා තමයි මේ විදියටවත් ගෙවල් හදා ගත්තෙ. මේ චන්ද්‍රලතා මහත්මියටත් දුන්නා. කවුරු මොනව කිව්වත් ගරු ප්‍රධාන අමාත්‍යතුමාගෙ තීරණය තමයි අවසාන තීරණය විෂය භාර අමාත්‍යතුමා වශයෙන්. මම දැක්කා ලිපිගොනුවෙ මුලින්ම වජිර ඇමතිතුමා ලියුමක් එවල තියෙනවා මේක දෙන්න කියලා. ඊට පස්සෙ ප්‍රධාන අමාත්‍යතුමා තමයි

නිර්දේශ කරල තියෙන්නෙ මේක බදු හෝ තක්සේරු මුදලට ලබා දෙන්නයි කියලා. ඉතින් මේක මට ප්‍රශ්නයක් නැහැ. හැබැයි අහිංසක මිනිස්සු. මේක තල්ගස්ගොඩ විතරක් වෙච්ච දෙයක් නෙමෙයි. මේ සභාවෙ පූර්වාදර්ශයක් වශයෙන් පොල්වත්තපුර දුන්නා. නගර සභාවෙ ඉඩමක්. පෝරඹ ප්‍රෙද්ශයේ දුන්නා උපාලි සිරිසුමන මැතිතුමා සභාවෙ ඉඩමක්. අපි දේශපාලනඥයො වශයෙන් මිනිස්සු මොනවහරි ඉල්ලුවහම ඇහුන්කම් දෙන්න වෙනවා. මම මේකට සභාව ගන්න ඕනම තීරණයකට එකගයි. සභාව ගන්න තීරණයක් ගන්න. හැබැයි කොහොමවුනත් මතක තියාගන්න ඕන රජයෙන් ආධාර දීල තියෙනවා මේ ගෙවල් හදන්න. අවසාන තීරණය ප්‍රධාන ඇමතිතුමා විෂයභාර ඇමතිවරයා වශයෙන් එතුමාට බලතල තියෙනවා මේ ඉඩම් දෙනවද නැද්ද කියන එක තීරණය කරන්න.

**<u>ගරු සභාපති එම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මම මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලා සිටිනවා මට ගියවර වාර්තාව හැදීමේදීත් මට ප්‍රශ්නයක් වුනා. මොකද මේව ටේප් වෙනවා. එක මන්ත්‍රීවරයෙකුට එක ප්‍රශ්නයක් සම්බන්ධයෙන් කතා කරන්න ලැබෙන්නෙ

එක වතාවයි. වැඩියෙන් කතා කරන්න පුළුවන්. හැබැයි වාර්තාවෙන් ඉවත් කරනවා. ඕනම ප්‍රශ්නයක් එක පාරකට වැඩිය කතා කරන්න එපා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එම්.ඩබ්. රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

සභාපතිතුමනි ප්‍රශ්නෙක වැරදි මත එනකොට කතා කරන්න වෙනවා. වැරදි මත දෙන්න එපා. මෙතුමා කිව්ව නිසයි දුන්නෙ. මෙතන දීල තියෙන්නෙ පොදු කොටසක්. ක්‍රීඩා පිටියක්, ප්‍රජා ශාලාවක් වගේ දෙයක් හදන්න පුළුවන්. අපිත් කැමතියි නැති බැරි කෙනෙකුට ඉඩමක් දෙන්න. නමුත් නීත්‍යානුකූල ක්‍රමවේදයකට එන්න ඕනෙ. ඒක නිසා මේක නීත්‍යානුකූල ක්‍රමවේදය අනුගමනය කරල දෙන්න. ඔතන මේ ප්‍රශ්නෙ ඇතිවුනේ මේ කට්ටිය ගිහිල්ල බලෙන් පදිංචි වුන නිසා. මම ඉල්ලා සිටිනවා අපේ තියෙන දේපල සම්බන්ධව ලැයිස්තුවක් අරගන්න කියලා අපට 10% තව දීපු ඉඩම් තියෙනවනම්.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා කතා කරමින්</u>**

සභාපතිතුමනි මම දැනගන්න කැමතියි මේ කතා කරන ඉඩමට අයිති අනික් ගෙවල් කොහේද කියල? මේ කැබලි කරපු ඉඩමෙ අනික් කොටස් මොන සභාවටද අයිති කරන්දෙනියටද? අම්බලන්ගොඩටද? ඉඩම බෙදා වෙන් කරන කොට සභාවට දීපු 10% කොටස තමයි මේක. මට තියෙන ප්‍රශ්නෙ කරන්දෙනිය ප්‍රාදේශීය සභාවටද අම්බලන්ගොඩ නගර සභාවටද මේක අයිති කියන එක. මේ ප්‍රශ්නෙ අයිති කරන්දෙනිය ප්‍රාදේශීය සභාවට. අපි මෙහේ කෑ ගහනවා මේකට. කරන්දෙනිය ප්‍රාදේශීය සභාවෙන් ඉල්ලීමක් කරන්න මේ ගැන පරීක්ෂා කරල තීරණයක් ගන්න කියලා. ඔය වගේ උදාහරණ තියෙනවා. අම්බලන්ගොඩ මායිම දිගේ කන්දෙගොඩ මාර්ග සති පාරෙ ඇලෙන් මේ පැත්තෙ කොටස අපි අයිතිවාසිකම් කියන කොට බලපිටිය ප්‍රාදේශීය සභාවෙ හිටපු සභාපතිතුමා ආයුධ අරන් ආවෙ. එත්කොට මම උප සභාපති හිටියෙ. අපි ඔප්පු තිරප්පු පෙන්නල, නිවැරදි ලේඛන පෙන්නල මායිම විසදගත්ත. ඒවගේම කරිත්තකන්ද කොට්ඨාශයේ මායිමේ බෙදුම් නඩුවක් යනවා එක ගෙයක් බලපිටියෙ ප්‍රාදේශීය සභාවෙ. අනික් ගෙයි අම්බලන්ගොඩ නගර සභාවේ. හැබැයි මුළු ඉඩමම අයිති බලපිටිය ප්‍රාදේශීය සභාවට. එතුම වරිපනම් බදු ගෙවන්නෙ අම්බලන්ගොඩ නගර සභාවට. එතුමා මට කිව්වහම මම කිව්ව බලපිටියෙන් කැමතිනම් අපට මේක පවරන්න උසාවි තීන්දුවේදීම ඒක ගන්න කියලා. මොකද මේ වරිපනම් බදු තක්සේරු කිරිම කරන්නෙ අපි නෙමෙයි. තක්සේරු දෙපාර්තමේන්තුව. ඒ අය පෙට්ටි කඩයක් වුනත් තක්සේරුව දීල යනවා. මේවගේ තවත් නගර සභාවට අයිති පොදු දේපල තියෙනවා. මම කියන්නෙ මේකෙ නිවැරදි තාවය ඉස්සෙල්ලම අපි තෝර ගනිමු. ඊට පස්සෙ අයිතිය ඔවුන්ගෙ නම් ඔවුන්ට භාර දෙමු. ඒ අය නීත්‍යානුකූලව පෙන්නුවොත් අම්බලන්ගොඩ නගර සභාවට අයිති කියල ප්‍රශ්නයක් නැහැ. මේ පෙත්සම් කාරන සභාවෙ ගත්තු තීරණයක්. එතන ප්‍රධාන අමාත්‍යතුමාගෙ, පළාත් පාලන කොමසාරිස්තුමාගෙ නියෝජනය තියෙනවා. අම්බලන්ගොඩ අළුත් පාරෙ ඔයිට වඩා වටින ඉඩමක් පර්චස් එක 50000/- ක් විතර වෙන ඉඩමක් මේ පෙත්සම් කාරක සභාවෙන් නිදහස් කරා. ගරු අශෝක ධනවංශ මන්ත්‍රීතුමා ඉදිරිපත් කරල තිබුන. ගරු වජිර අබේවර්ධන ඇමතිතුමා, ගරු ප්‍රධාන අමාත්‍යතුමා ඉල්ලීම් කරල තිබුන.ඉතින් ඉහල දේශපාලන

නායකත්වය විසින් පෙත්සම් කාරක සභාවෙදි මේ නිදහස් කිරීම් කරල තියෙනවා. අනුමැතිය දීල තියෙනවා. අපි මෙතන කැකෝ ගැහුවට සාර්ථක වෙන්නෙ නැහැ. ආන්ඩුව විසින් රජයෙන් උදාගම් කියල ගෙවල් 50 ක් හදල දෙනවා.

ඇමතිතුමාගෙ ඉඩම්ද? රජයේ ඉඩම් දෙන්නෙ. මෙතන එකම වරද අනවසර. මමත් එකගයි. හැබැයි ඒ දුප්පත් මිනිස්සු ගෙවල් හතරක් හදාගෙන. මෙතන ඉන්න කවුරුහරි මන්ත්‍රීවරයෙක් කැමතිද ඒ ගෙවල් කඩල දාන්න. කවුරුත් කැමති වෙන්නෑ සභාපතිතුමනි. එහෙමනම් තියෙන්නෙ මේ ප්‍රශ්නෙ නීතියට භාර දීල විසදගන්න. අපි ගරු සභාවෙ අනුමැතියක් දීම අවශ්‍ය නැහැ. පෙත්සම් කාරක සභාවේ තීරණයට අනුව කටයුතු කරන්න කියන ඉල්ලීම මම කරනවා ගරු සභාපතිතුමනි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩබ්. එම්. නිලානි මෙනවිය කතා කරමින්</u>**

සභාපතිතුමනි මම දැනගන්න කැමතියි මන්ත්‍රීතුමා කිව්ව විදියට මේක කරන්දෙනිය ප්‍රාදේශීය සභාවට අයිති නම් අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම්තුමා කොහොමද ඉඩම් කැබැල්ල දුන්නෙ.

**<u>ගරු සභාපති එම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ඒක ප්‍රාදේශීය ලේකම්තුමාගෙන් අහන්න.

**<u>තීරණය</u>**

☞ නගර සභාව සතු තල්ගස්ගොඩ 04 වන පටුමගේ පිහිටි තැලිගල කන්ද ඉඩම පදිංචිකරුවන්ට ලබා දීමට අදාල සම්පූර්ණ වාර්තාව ගරු සභාවේ දැන ගැනීම සඳහා ඉදිරිපත් කරන ලදී.

**(04)** යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න — නැත

**(05)** යථා පරිදි කල් දී ඇති යෝජනා

**5:1 .re uka;%Sjreka úiska bosßm;a lrk fhdackd( ke;**

**5:2 ks,Odíka úiska bosßm;a lrk mßmd,k fhdackd (** නැත

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

විපක්ෂ නායක තුමා ප්‍රශ්න ගණනාවක් ඉදිරිපත් කරල තිබුනා. ඒව නිසි කාලයට ඇවිත් තිබුනෙ නැහැ. ඔබතුමාට ඒ බව දන්වල ඇති. නව මන්ත්‍රීවරුන්ට යෝජනාවක් ඉදිරිපත් කරන්නෙ කොහොමද? ප්‍රශ්නාවලියක් ඉදිරිපත් කරන්නෙ කොහොමද? සභා රීති සම්බන්ධව දැනුවත්වීම සඳහා අපේ පළාත් පාලන විමර්ශන නිලධාරී වරයා සමග සාකච්ඡාවක් තියෙනවා මේ මාසෙ 15 වෙනිදට. විශේෂයෙන්ම නව මන්ත්‍රීවරුන් ඒකට සහභාගි වෙන්න.

<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දූවගේ මහතා කතා කරමින්</u>

සභාපතිතුමනි, ඒ පිලිබඳව ස්තුතිවන්ත වෙනවා නමුත් මන්ත්‍රීවරයෙක් සභාවට යම්කිසි යෝජනාවක් හෝ ප්‍රශ්නයක් ඉදිරිපත් කරහම ඒක නගර සභා ආඥා පනත යටතේ අපි ලේකම් තුමාට භාර දෙනවා. එහිදී ලේකම්තුමා නැත්නම් ප්‍රධාන කළමනාකරණ සහකාර මහත්මියට බාර දෙනවා. එතකොට මගේ කාර්යාලයෙන් ආවහම ඒක බාර ගෙන නැහැ. මීන් ඉදිරියට එසේ සිදු නොවිය යුතුයි කියා මා ඉල්ලා සිටිනවා. මම 13 වෙනිදා මේක බාර දුන්නෙ. ඊට පස්සෙ ඒකෙ අඩුපාඩු හදල නැවත වරක් බාර දුන්නා.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

අපි 15 වෙනිදට මේකම උදාහරණයට අරගෙන සාකච්ඡා කරමු. ඊනම ලිපියක් සභාවට ආවම ඒකෙ දින මුද්‍රාව තියන්න. යම් කිසි ආකාරයක ප්‍රතික්ෂේප කිරීමට හේතු තියෙනව නම් ඒක ලිඛිතව දන්වන්න.

**(6) කාරක සභා වාර්තා සලකා බැලීම**

**6: 1 2018- 04- 24 දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද පුස්තකාල කමිටු වාර්තාව**

**පිළිගත යුතු බවට ගරු සභාපති එම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා විසින් ස්ථිර කරන ලදී.**

<u>2018 wm%sfh,a ui 24 jk osk mqia;ld, lñgq jd¾;dj</u>

- .re iNdm;s — weï' ví,sõ' wreK m%oSma uy;d'
- .re k.r iNd uka;%S — f.%aIka flrñKshf.a uy;d'
- .re k.r iNd uka;%S — wd¾'tï' ,ika; wcs;a l=udr uy;d'
- .re k.r iNd uka;%S — kkaok rdcmCI uy;d'

- .re k.r iNd uka;%Sks B'weï' bkaø whsrdx.ks ñh'
- .re k.r iNd uka;%Sks Ô'Ô' reúks fmaI,d ñh'
- .re k.r iNd uka;%Sks tÉ'bfkdald ls%Idka;s ñh'
- .re k.r iNd uka;%Sks tï'ví' rdyq, ,,s;úl%u uy;d'
- .re k.r iNd uka;%S Okfiak udÿjf.a uy;d'
- .re k.r iNd uka;%S fla'Ô'Ô' ohdkkao o is,ajd uy;d'
- f,alï î'tA' Oïñld ñh'
- lñgq idudcsl tka'tÉ'vkalka o is,ajd uy;d
- lñgq idudcsl iq.;a fyÜáwdrÉÑ uy;d'
- lñgq idudcsl csfkakaøjxY o is,ajd uy;d'
- lñgq idudcsl y¾nÜ ùrlafldä uy;d'
- lñgq idudcsl Ô'ví' .=Kisß uy;d'
- lñgq idudcsl à'ví' yßiapˆ uy;d'
- lñgq idudcsl à'ví' mshisß uy;d'
- m%cd ixj¾Ok ks,OdÍ ã'ù' ;rx.s ñh'
- mqia;ld,hdêm;sksh fla'ví' rxckS udfk,a fukúh'
- mqia;ld,hdêm;sksh ã' ufyaId ;dfí%õ fukúh'
- mqia;ld, iydhsld tA'Ô' risld ñh'
- mqia;ld, iydhsld Ô'tÉ't,a' mshka;s fukúh'
- mqia;ld, iydhsld tia'tï' ufkdaß pkaøjxY ñh'
- mqia;ld, iydhsld tï'ví' csfkald iqux.,S ñh'
- mqia;ld, iydhsld tia' iqis,d oSmdks ñh'
- mqia;ld, iydhsld fla'tA'úiqoaê f¾Kqld ñh'
- mqia;ld, iydhsld ã'tï'Ô'tia' os,areCIs ñh'
- mqia;ld, iydhsld ud,;S iuka;d wdßhisxy ñh'
- mqia;ld, iydhl tA'ví' bkaøodi uhd'

.re iNdm;s;=ud lñgqjg meñKSfuka miqj m'j'2'30 g mqia;ld, lñgqfõ jevlghq;= wdrïN l<dh'

- t;=ud úiska lñgqjg meñKs ish¨u k.r iNd uka;%Ska lñgq iudcsl uy;=ka iy f,alï;=ñh we;=`M ld¾h uKav,h ms<s.kakd ,os'

- isßmd, udÿjf.a uy;d lñgqjg iyNd.S ùug fkdyels nj okajd ,smshla tjd ;snq w;r iNdm;s;=ud úiska th lñgqjg bosßm;a lrk ,os'

- mqia;ld, m%.;s jd¾;d lñgqjg bosßm;a lsÍu m<uqj isÿúh'

m%Odk mqia;ld,fha m%.;s jd¾;dj mqia;ld,hdêm;sh úiska o YdLd mqia;ld,j, m%.;s jd¾;d tA tA YdLd Ndr mqia;ld, iydhsldjka úiskao úoHq;a mqia;ld,fha m%.;s jd¾;dj Ô'tÉ't,a' mshka;s fukúh úiska lñgqjg bosßm;a lrk ,os'

- **woyia yd fhdackd**
  mqia;ld, m%.;sh ms<sn`o m%ia:dr igykla miq.sh lñgqj,oS bosßm;a l, wdldrhg ish¨ uy;au uy;aókag oek.ekSu i`oyd lñgqjg bosßm;a lrk f,i csfkakaøjxY o is,ajd uy;d fhdckd lrk ,os'

- úoHq;a mqia;ld,fha m%.;sh ms<sn`o wvqùula olakg ,efnk neúka thg fya;=j iNdm;s;=ud úiska mqia;ld,hdêm;skshf.ka úuik ,o w;r thg fya;=j f,i oelajqfha merKs idudcsl;ajh ,nd .kakd ,o isiqka oekg w'fmd'i'^id'fmd<& úNd.hg uqyqK oSug iqodkñka isák neúka wOHdmk lghq;= i`oyd fhduq ù isák nj fmkajd fok ,os'

- úoHq;a mqia;ld,h iy mqia;ld, Ndú;d lrk idudcslhka m%udKh jeä lsÍu i`oyd mdi,a j,g f.dia mdi,a <uqka oekqj;a lsÍu iqÿiq nj y¾nÜ ùrlafldä uy;d lñgqjg fhdackd lrk ,os'
- miq.sh jir ;=kl muK ld,hl isg fmd;a ñ<os .ekSu wvq nj fmkS hk neúka kj;u fmd;a ñ<oS .ekSu i`oyd idys;H udifhaoS isÿ lsÍu iqÿiq nj iNdm;s;=ud fhdackd lrk ,os thg fya;=j f,i fmkajd fok ,oafoa jÜgï ,enqkqfha iema;eïn¾ ui njh'
- m%Odk yd YdLd mqia;ld, i`oyd fmd;a rdlal wvq nj mqia;ld,hdêm;sksh okajd isák ,os'wjYH rdlal m%udKh bosß lñgqfõoS bosßm;a lrk f,i m%Odk yd YdLd mqiq;ld, iydhsldjkag .re iNdm;s;=ud úiska Wmfoia ,nd fok ,os'
- w¨;ska rdlal ñ<os .ekSfïoS mqia;ld,j, tAjd ;eîug bvlv m%udKj;ao hkak fidhd ne,sh hq;= nj .re k.r iNd uka;S% fla'Ô'mS' ohdkkao is,ajd iy;d mjik ,os'
- mqia;ld,j,g wu;rj mdi,a <uqkag mdvï lsÍug Yd,djla ශ්‍රමාහ ජකක-iEoSug uq,a ;ek fok nj iNdm;s;=ud mjik ,os' wïn,kaf.dv k.rfha bvlv we;s m%foaY f;dard f.k tu jevigyka bosßfhaos ls%hd;aul lsÍug n,dfmdfrd;a;=jk nj mjik ,os'
- m%Odk mqia;ld,h k.r iNd f.dvke.s,a,g f.k f.dia k.r iNd ld¾hd,h mqia;ld, f.dvke.s,a,g .ekSu iqÿiq njg iNdm;s;=ud fhdackd lrk ,o w;r k.r iNd f.dvke.s,af,a ;;ajh ms<sn`o oek .ekSug f.dvke.s,s m¾fhaIK wdh;khg okajd we;s nj;a tA wkqj lghq;= isÿ lrk nj mjik ,os'
- lshùfï udih i`oyd weia;fïka;=j idod bosßm;a lr thg wkue;sh ,nd .kakd f,i iNdm;s;=ud m%cd ixj¾Ok ks,OdÍ;=ñhg Wmfoia ,nd fok ,os'
- 2016 j¾Ifha cd;sl mqia;ld, yd m%f,aLk fiajd uKav,h úiska osjhsfka úYsIag wkaoñka ixrCIK lghq;= lrk ,o uyck mqia;ld,h f,i wïn,kaf.dv k.r iNd mqia;ld,h f;aÍ m;aù we;s nj m%cd ixj¾Ok ks,Odß;=ñh lñgqjg okajk ,os'
- YdLd mqia;ld, w;r isÿjk fmd;a yqjudre l%uh jvd;a iqÿiq l%uhla nj .re k.r iNd uka;S%S f.%aIka flrñKshf.a uy;d mejiSh'

- fjk;a lreKq bosßm;a fkdjq neúka .re k.r iNd uka;%S f.%aIka flrñKshf.a uy;d úiska iafõÑcdfjka lñgqjg meñKs ish¨u uy;au uy;aókag ia;+;sh m%ldY lrñka lñgqfõ jev lghq;= wjika lrk ,os'

සකස් කළේ

පුස්තකාලයාධිපතිනිය

<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා කතා කරමින්</u>

2016 වර්ෂයේ දිවයිනේ විශිෂ්ට අන්දමින් සංරක්ෂණ කටයුතු කරන ලද මහජන පුස්තකාලය ලෙස අම්බලන්ගොඩ නගර සභා පුස්තකාලය තේරී ඇති බව ප්‍රජා සංවර්ධන නිලධාරීතුමය විසින් කමිටුවට දැන්නුවා. මේ සම්බන්ධව කටයුතු කරපු නිලධාරී මහත්ම මහත්මීන්ට මම මේ අවස්ථාවේ ගරු සභාවේ ස්තුතිය පුද කර සිටිනවා.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

මෙම වාර්තාවේ තියෙනවා පොත් තියන්න රාක්ක මදියි කියලා. ඒ රාක්ක ලබා ගැනීම සඳහා සභාවේ අනුමැතිය ඉල්ලා සිටිනවා. ඒ වගේම මෙම පුස්තකාලයට ළමයි වැඩිපුරම එන්නෙ පාඩම් කිරීමට. දැනට සභාව පවත්වගෙන යන ශාලාවෙ තමයි වෙනද ළමයි පාඩම් කරේ. ළමයි 50 ක් 60 ක් විතර පාඩම් කරපු එක දැන් 10 කට 15 කට සීමා වෙලා. එනිසා අපි ගමෙන් ගමට ළමයින්ට පාඩම් කිරීමට ස්ටඩි හෝල් ඉදි කිරීමට අපි තීන්දු කර තිබෙනවා. ඒ සම්බන්ධයෙනුත් සභාවෙ අනුමැතිය ඉල්ලා සිටිනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා කතා කරමින්</u>

සභාපතිතුමනි මේ රාක්ක හදන්නෙ ලී වලින් නේද? නගර සභා භූමියේ ඇති ලී කදන් භාවිතා කරල මේ ක්‍රියාව කරගන්න පුළුවන් නේද?

**ඒ අනුව 2018 -04- 24 දින පවත්වන ලද පුස්තකාල කමිටු වාර්තාව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ඒකමතිකව සභා සම්මත විය'**

## <u>lñgq jd¾;dj iïnkaOfhka .;a ;SrK</u>

- **පුස්තකාල සඳහා අවශ්‍ය පොත් රාක්ක සෑදීම සඳහා නගර සභා භූමියේ දමා ඇති ලී කදන් යොදා ගැනීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

- ගම් මට්ටමින් ළමයින්ට පාඩම් කිරීම සඳහා ස්ටඩි හෝල් (study hall) ඉදි කිරීම සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

**6: 2** **2018- 04- 18 දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද ටෙන්ඩර් කමිටු වාර්තාව පිළිගත යුතු බවට ගරු සභාපති එම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා විසින් ස්ථිර කරන ලදී.**

<u>අම්බලන්ගොඩ නගර සභාව - **2018.04.18** දින පැවති ටෙන්ඩර් කමිටු වාර්තාව</u>

සහභාගීත්වය:-

1. ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා.
2. ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා.
3. ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා.
4. ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා.
5. ගරු නගර සභා මන්ත්‍රිනී පේෂලා කුමාරි මිය.
6. ගරු නගර සභා මන්ත්‍රී කේ.පී. දයානන්ද සිලවා මහතා.
7. ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්.සරත්චන්ද්‍ර මහතා.
8. ලේකම්, බී.ඒ.ධම්මිකා මිය.
9. ප්‍රධාන කළමනාකරණ සහකාර එස්.එන්.පී ද සිල්වා මිය.

01.අම්බලන්ගොඩ නගර සභා ක්‍රීඩාංගනයේ සුළඟින් හානියට පත් ක්‍රීඩාගාරයේ වහල අළුත්වැඩියාව සඳහා අවශ්‍ය සින්ක් ඇලුමිනියම් තහඩු (0.47mm- සඳහා ඉදිරිපත් කර තිබූ මිල ගණන් අතුරින් අවම මිල ඉදිරිපත් කර ඇති සුමල් කළුතර ( එස්.ටී.කේ.බිල්ඩර්ස්) ආයතනයෙන් මිලදී ගැනීමට ටෙන්ඩර් කමිටුව විසින් නිර්දේශ කරන ලදි.

02.එම තහඩු සවිකිරීමට අවශ්‍ය 3ණී කොච්චි ඇණ , වොෂර් සහ නෝලික් පටි සඳහා ඉදිරිපත් කර තිබූ මිල ගණන් අතුරින් 3" කොච්චි ඇණ සඳහා අවම මිල ඉදිරිපත් කර තිබූ ඇල්කාටෝ ආයතනයෙන් මිදී ගැනීමටත් , 3" කොච්චි ඇණ සඳහා අවශ්‍ය ඇලුමිනියම් වොෂර් සහ නෝලික් පටි සඳහා අවම මිල ඉදිරිපත් කර තිබූ සටාර්ලයින් හාඩ්වෙයාර් ආයතනයෙන් මිලදී ගැනීමටත් ටෙන්ඩර් කමිටුව විසින් තීරණය කරන ලදි.

**ඒ අනුව 2018 -04- 18 දින පවත්වන ලද ටෙන්ඩර් කමිටු වාර්තාව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**6: 3** **2018- 04- 27 දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද නගරයේ වාහන තදබදය අවම කිරීම සම්බන්ධ සාකච්ඡාවේ වාර්තාව පිළිගත යුතු බවට ගරු සභාපති එම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදී.**

<u>නගරයේ වාහන තදබදය අවම කිරීම සම්බන්ධ සාකච්ඡාව</u>

**<u>2018.04.27 දින ප.ව.2.30</u>**

<u>සහභාගීත්වය</u>

| | | |
|---|---|---|
| 1. | ඇම්.ඩබ්ලිව්.අරුණ ප්‍රදීප් මයා | ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව |
| 2. | ඩබ්ලිව්.කමල් ද සිල්වා මයා | ගරු උප සභාපති, අම්බලන්ගොඩ නගර සභාව |
| 3. | ජී.සරත් ශ්‍රී ලාල් ද සිප්ල්වා මයා | ගරු නගර සභා මන්ත්‍රී, අම්බලන්ගොඩ නගර සභාව |
| 4. | ආර්.එම්.ලසන්ත කුමාර මයා | ගරු නගර සභා මන්ත්‍රී, අම්බලන්ගොඩ නගර සභාව |
| 5. | නන්දන රාජපක්ෂ මයා | ගරු නගර සභා මන්ත්‍රී, අම්බලන්ගොඩ නගර සභාව |
| 6. | දිනයාදුර ධර්මදාස මයා | ගරු නගර සභා මන්ත්‍රී, අම්බලන්ගොඩ නගර සභාව |
| 7. | ඒ.ඩබ්.ජගත් කුමාර මයා | ගරු නගර සභා මන්ත්‍රී, අම්බලන්ගොඩ නගර සභාව |
| 8. | ග්‍රේෂන් කෙරම්ණියගේ මයා | ගරු නගර සභා මන්ත්‍රී, අම්බලන්ගොඩ නගර සභාව |
| 9. | ජී.ඩී.රුවිනි පේෂලා මිය | ගරු නගර සභා මන්ත්‍රී, අම්බලන්ගොඩ නගර සභාව |
| 10. | ඊ.ඇම්.ඉන්ද්‍රා අයිරාංගනී මිය | ගරු නගර සභා මන්ත්‍රී, අම්බලන්ගොඩ නගර සභාව |
| 11. | ධනසේන මාදුවගේ මයා | ගරු නගර සභා මන්ත්‍රී, අම්බලන්ගොඩ නගර සභාව |
| 12. | එච්.ඉනෝකා ක්‍රිෂාන්ති මිය | ගරු නගර සභා මන්ත්‍රී, අම්බලන්ගොඩ නගර සභාව |
| 13. | එම්.අතුල ප්‍රියක්ත මයා | ගරු නගර සභා මන්ත්‍රී, අම්බලන්ගොඩ නගර සභාව |
| 14. | ඩබ්.ඒ.සෝභිත රංජිත් මයා | ගරු නගර සභා මන්ත්‍රී, අම්බලන්ගොඩ නගර සභාව |
| 15. | කේ.පී.දයානන්ද සිල්වා මයා | ගරු නගර සභා මන්ත්‍රී, අම්බලන්ගොඩ නගර සභාව |
| 16. | එම්.ඩබ්.නිලානි මිය | ගරු නගර සභා මන්ත්‍රී, අම්බලන්ගොඩ නගර සභාව |
| 17. | ඩී.පනියන්දුවගේ මයා | ගරු නගර සභා මන්ත්‍රී, අම්බලන්ගොඩ නගර සභාව |
| 18. | ඒ.බී.එල්.හේමන්තා මිය | ගරු නගර සභා මන්ත්‍රී, අම්බලන්ගොඩ නගර සභාව |
| 19. | ආර්.ලලිත වික්‍රම මයා | ගරු නගර සභා මන්ත්‍රී, අම්බලන්ගොඩ නගර සභාව |
| 20. | දම්මික කොඩිකාර මයා | ගරු නගර සභා මන්ත්‍රී, අම්බලන්ගොඩ නගර සභාව |
| 21. | එස්.එම්.සරත් චන්ද්‍ර ද සිල්වා මයා | ගරු නගර සභා මන්ත්‍රී, අම්බලන්ගොඩ නගර සභාව |
| 22. | බී.ඒ.ධම්මිකා මිය | ලේකම්, අම්බලන්ගොඩ නගර සභාව |
| 23. | මනූ ගුණරත්න මයා | ප්‍රධානසංවිධායක,අම්බලන්ගොඩ වෙ.කර්. මණ්ඩලය |
| 24. | ආර්.එම්.ටොලිසන් මයා | ලේකම්,අම්බලන්ගොඩ වෙළඳ කර්මාන්ත මණ්ඩලය |
| 25. | සුසිල් ගමගේ මයා | උප සභාපති, අම්බලන්ගොඩ වෙ. කර්.මණ්ඩලය |
| 26. | ජී.පන්ඩුල ප්‍රියන්ත මයා | මාළු වෙළඳපොළ, අම්බලන්ගොඩ. |
| 27. | ජී.වසන්ත කුමාර මයා | මාළු වෙළඳපොළ, අම්බලන්ගොඩ. |
| 28. | ටී.එම්.එම්.ගුණසේකර මයා | උප පොලිස් පරීක්ෂක,අම්බලන්ගොඩ පොලිසිය |
| 29. | කේ.කේ.දුමින්ද කන්නන්ගර මයා | උප පොලිස් පරීක්ෂක,අම්බලන්ගොඩ පොලිසිය |
| 30. | ඩී.එස්.එච්.ගුණවර්ධන මයා | තාක්ෂණ සේවා නිලධාරී |
| 31. | කේ.පියරත්න මයා | ආදායම් පරීක්ෂක |
| 32. | ටී.චන්න මයා | ආදායම් පරීක්ෂක |
| 33. | අචිරා රංජනී ලොකුගේ මිය | කළමණාකරණ සහකාර |

පිළිගැනීම:-

ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා.

නගරයේ වාහන තදබදය අවම කිරීම වෙනුවෙන් පැවැත්වෙන සාකච්ඡාව සඳහා පැමිණි ගරු නගර සභා මන්ත්‍රීතුමාලාගෙන්ද ,වෙළඳ සංගමයේ මහතුන් ඇතුළු සියළු නිලධාරී මහත්ම මහත්මීන් හා නගර සභා ලේකම් ඇතුළු කාර්ය මණ්ඩලය ඉතාමත් ගෞරවයෙන් පිළිගනු ලබන බව පවසන ලදි. නගරයේ වාහන තදබදය අවම කිරීම වෙනුවෙන් පවතින ගැටළු පිළිබඳ සාකාචඡා කර එම ගැටළු විසඳා ගැනීම මෙම සාකච්ඡාව තුලින් සිදු කෙරෙන බව වැඩි දුරටත් ප්‍රකාශ විය.

<u>**2018.04.27 දින පැවති රැස්වීමේ සාකාච්ඡා වූ කරුණු සමාලෝචනය**</u>

| මාතෘකාව | | සාකච්ඡා කරුණු | තිරණය |
|---|---|---|---|
| ත්‍රිරෝද රථ සම්බන්ධව | ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දූවගේ මහතා | ➢ කඩසාප්පු ඉදිරියේ රථ නවතා තැබීම නිසා කඩ සාප්පු වැසී යාම<br>➢ ත්‍රී රෝද රථ සඳහා පලපත්‍ර ලබා දීමේදී අම්බලන්ගොඩ බල ප්‍රදේශයේ පදිංචි කරුවන්ට මුලිකත්වයක් ලබා දීම.<br>➢ පසුගිය කාලයේ ත්‍රී රෝද රථ නැවතුම් පොළවල් සඳහා අවසර ලබා දී ඇත්නම් එය වහාම නතර කිරීම.<br>➢ දැනට ලියාපදිංචි වී ඇති ත්‍රිරෝද රථ ගණන හා අනුමත ත්‍රිරෝද රථ නැවතුම්පොලවල් කීයක් ද යන්න.<br>➢ ත්‍රී රෝද රථ සඳහා බලපත්‍ර නිකුත් කිරීටත්,වාහන පාකින් ටිකට් නිකුත් කිරීමටත්.<br>➢ එම ස්ථානයෙහි පුවරු සවි කිරීමටත්<br>➢ තවද පරණ පාරෙහි හා ස්ටේෂන් | |

| | | | |
|---|---|---|---|
| | | එක පාරෙහි බඩු පැටවීම බෑමට උදේ 7 සහ රාත්‍රී 7 කටයුතු කිරීමට ව්‍යාපාරිකයන්ට උපදෙස් දීම<br>➢ මාර්කට් එක ළඟ පහලට යන පාර සම්බන්ධවත් | |
| | ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා | ත්‍රීවිල් 120 ක් පමණ නැවැත්වීමට හැකියාව තිබුණ නමුත් ඒ අනුව බලපත්‍ර 180ක් පමණ නිකුත් කරන ලද බවත් අලුතින් බලපත්‍රයක් නිකුත් කරනුයේ බලපත්‍රයක් නිකුත් අදාල අයෙකු එයින් ඉවත් වූවහොත් පමණක් බවත් ප්‍රකාශ කරන ලදි.<br>තවද අනුමත ත්‍රීවිල් රථ නවතා තැබීමේ ස්ථාන වශයෙන්<br>• කුලරත්න පාර මංසන්ධිය<br>• අම්බලන්ගොඩ නගර සභා සාප්පු සංකීර්ණයේ බස් නැවතුමපොළ දෙපස<br>• දුම්රිය පොළ මංසන්ධිය<br>• දුමරිය පොළ පාර ජී.එල්.පී. ගොඩනැගිල්ල ඉදිරිපිට<br>• මහ වීදිය පොදු වෙළඳපොළ ඉදිරිපිට<br>• පරණ පාරේ මාකට් හන්දිය අසල රණසිංහ පොත් කඩය අවසන් වන ස්ථානයේ සිට කොළඹ දෙසට ත්‍රීරෝද රථ අටක් නැවැතිවීම සඳහාත්<br>• අම්බලන්ගොඩ ඔරලෝසු කණුව අසල ගාලු පාරේ බස්නාහිර පැත්තේ රජයේ බෙහෙත් ශාලාව තිබූ ගොඩනැගිල්ල අසල. | |

| | | | |
|---|---|---|---|
| | ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා | නගර සභා පාලනය නොමැති වකවානුවේ යම් යම් වෙනස් වීම් නගරයේ සිදුව ඇති බවත් ඒ අනුව නගරයේ බදු ගෙවන ජනතාවට වාහන නැවැත්වීමට තැනක් නොමැති වීම පිළිබඳවත් ,නම් කරන ලද ත්‍රීරෝද රථ නැවැත්වීමේ ස්ථාන හැර අනෙකුත් ස්ථාන වලින් රථ වාහන නවතා තැබීම ඉවත් කළ යුතු බවත් ඒ සඳහා සම්පූර්ණ සහයෝගය පොලීසිය වෙත ලබා දෙන බවත් ප්‍රකාශ කරන ලදි. | |
| | උප පොලිස් පරීක්ෂක ටී.එම්.එම්. ගුණසේකර මයා. | පාර අවහිර වන පරිදි මාළු ලැලි දමා ඇති බැවින් එය ඉවත් කළ යුතු බවත් අනුමත ත්‍රීරෝද රථ සඳහා අංකයක් ලබා දීමටත් එය නීතිමය නියමාකාරයෙන් ක්‍රියාත්මක කළ යුතු බවත්ය. | |
| | ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පතියන්දුවගේ මහතා | දැනට ලියාපදිංචි වී ඇති ත්‍රීවිල් හිමිකරුවන් හට නැවත ලියා පදිංචි වීම සඳහා දිනයක් නියම කිරීමටත්,ඒ අනුව එම දිනට පැමිණෙන අයට පමණක් බලපත්‍රයක් නිකුත් කළ යුතු බවත් පෙන්වා දීම. | |
| | අදහස් හා යෝජනා | නව ත්‍රීවිල් නැවතුම් ස්ථාන ලෙස හල්වතුර හන්දිය, සුවන රෝහල අසල,පොල්වත්ත හන්දිය,පෝරඹ හන්දිය,සෙලාන් බැංකුව අසල නම් කිරීමට යෝජනා විය. | |
| | අම්බලන්ගොඩ වෙළඳ හා කර්මාන්ත මණ්ඩලය ප්‍රධාන සංවිධායක, මනූ ගුණරත්න මයා | ඒ මහතා පෙන්වා දෙන ලද්දේ ත්‍රීවිල් රථ සේවය මඟින් ජනතාවට විශාල සේවයක් වන බවත් මාර්ග තදබදයට ප්‍රධාන හේතුව මාර්ග පටු වීම බවත් මාර්ගය අඩි 60 දක්වා පුළුල් කිරීමටත් මන් තීරු 04ක් හා අඩි 03 නේ මන්තීරු 02කින් සමන්විත වන ලෙස පාර පුළුල් කළ යුතු බවත්ය.තවද ඉඩ පහසුකම් සොයා | |

| | | | |
|---|---|---|---|
| | | ත්‍රීවිල් පුල් සෑදිය යුතු බවත් එමඟින් අවශ්‍ය වූ විට අවශ්‍ය තැන්වලට ත්‍රිවිල් රථ යොමු කිරීමේ ක්‍රමවේදයක් සැලසිය යුතු බවත්ය.උදේ 7 රාත්‍රී 7 බඩු බෑමට ලොරි රථ වලට වෙනම ස්ථානයක් නම් කිරීමටත්ය. | |
| | ගරු නාගරික මන්ත්‍රිනී, එම්.ඩබ්.නිලානි මිය | වාහන නවතා තැබීම හේතුවෙන් අවමංගල අවස්ථාවලදී පාරේ ගමන් කිරිමේදී අපහසුතාවයට පත් වන බව පෙන්වා දෙන ලදි. | |
| | පොලිස් පරික්ෂක ටී.එම්.එම්.ගුණසේකර මයා | අනවශ්‍ය ඉදිකිරීම් ඉවත් කිරීමට ආර්.ඩී. එකද යොදා ගත යුතු බව පවසමින් එතුමන් පහත කරුණු ප්‍රකාශ කරන ලදි.<br>❖ පාර අවහිර වන පරිදි කඩ කාමර ඉදිරිපිට තනාගෙන ඇති අනවසර ඉදිකිරීම් ඉවත් කිරීමට.<br>❖ පදිකයන් සඳහා බස් නැවතුම්පොල ඉදිරිපිට ගුවන් පාලමක් ඉදිකිරීමට.<br>❖ මාර්කට් හන්දිය පහළ පාර සකස් කිරීමට.<br>❖ මාර්ග සංඥා ඉදිකිරීමට<br>❖ දැනට ප්‍රධාන මාර්ගයේ ඇති තහනම් සංඥා වැඩි කිරීමට.<br>❖ බස් නැවතුම්පොළ අසල ඇති යකඩ වැට පසු පසට ගැනීමට.<br>❖ පදික වේදිකාවේ යකඩ වැට කැඩී ඇති ස්ථානපනවීකරණය කිරීමට.<br>❖ පදික වේදිකාවෙන් ගමන් කළ යුතු බවට මිනිසුන් දැනුවත් කිරීම.<br>❖ පොල්වත්ත පාර රොසෙත් රෝහල ලඟ පදික වේදිකාව සකස් කිරීම.<br>❖ පොල්වත්ත පාර පුළුල් කිරීමට යෝජනා කිරීමට යෝජනා කිරීම.<br>❖ .එස්.බී. සාප්පුව ලඟ ඇති පාරේ වාහන නැවැත්වීම තහනම් කිරීම.<br>❖ ඔරලෝසු කණුව ඉදිරිපිට බඩු විකුණන වෙළෙඳුන් ඉවත් කිරීමට.<br>❖ රථ ගාල් සඳහා පුවරු සවි කිරීමට.<br>❖ පදික වේදිකාවේ ජලය රැඳෙන ස්ථාන සකස් කිරීමට<br>❖ පරණ පාර දෙපස කැඩුණු තැන් නවීකරණය කිරීමට. | |

| | | | |
|---|---|---|---|
| | | තවද තැපැල් කාර්යාලය වෙත තැපැල් මළු භාරදීමට බස් රථ යැමේදී පාරේ වාහන අවහිරතායන්ට පත්වන බැවින් ඒ සඳහා තැපැල් කාර්යාලයේ සේවකයන් යොදා බස් නැවතුම්පොළට ගොස් තැපැල් මළු භාර ගැනීමට කටයුතු කිරීම.<br><br>මාර්කට් එක ළඟ තිබෙන මාළු ලැලි ඉවත් කරීම සම්බන්ධයෙන්. | |
| | ගරු නාගරික මන්ත්‍රී ඩෙනට් පතියන්දුවගේ මහතා | මාළු ලැලි ඉවත් කරනවා නම් මාර්කට් එක තුළ මාළු ලැලි නැවත සකස් කර දිය යුතු බව පෙන්වා දෙන ලදි. | |
| | ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා | මාළු ලැලි ඉවත් කිරීම. | උසාවි නියෝගයක් ගෙන මාළු ලැලි ඉවත් කිරීමට කටයුතු කරන බව ප්‍රකාශ කරන ලදි. |
| | ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.සෝභිත රංජිත් | මාළු ලැලි සියල්ලම කඩා ඉවත් කර නැවත සකස් කර දිය යුතු බව. | |
| | ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා | දැනටද මාළු ලැලි කඩා පිරිසිදු කිරීමට හැකි වන සේ සකස් කර ඇති බව ප්‍රකාශ කරන ලදි. | |
| | උප පොලිස් පරීක්ෂක ටී.එම්.එම්.ගුණසේකර මයා | මාළු ලැලි ඉවත් කිරීමට දිනයක් ඉල්ලීම. | |
| | ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා | සභාවේ අනුමැතිය ලබා ගෙන අවසර දීමට කටයුතු කරන බව දැන්වීම. | 2018.05.01 දිනට සභාවේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කිරීමට. |
| | යෝජනා | ✓ මාර්කට් එක ළඟ පාර අලුත්වැඩියා කර සකස් කිරීමට.<br>උදේ 7 රාත්‍රී 7 බඩු බෑම සඳහා යෝජනා වීම<br>බැනර් ඉවත් කිරීම සඳහා ( ආර්.අයි | |

| | | | |
|---|---|---|---|
| | | මහත්වරුන්ට පැවසීම)<br>පරණ පොල්වත්ත පාර වාහන නවතා තැබීමට යෝජනා වීම<br>ත්‍රීරෝද රථ ලියාපදිංචි කිරීම<br>කොන්ක්‍රීට් කැඩී ඇති තැන් සකස් කිරීම(සැනෙන්තුවින් එක ලඟ මිලානා බේකරියට යන පාර) | |
| | ගරු නාගරික මන්ත්‍රී කේ.පී.දයානන්ද සිල්වා මහතා | රථ වාහන කමිටු රැසවීම් සඳහා අර්.ඩී.එකේ නිලධාරියෙකු ද සහභාගි කරවා ගැනීමට කටයුතු කරන ලෙස | |
| | ගරු නාගරික මන්ත්‍රී ආර්.ලලිත වික්‍රම මහතා | පොල්වත්ත හන්දියේ රෝහලට යන පාරේ ත්‍රීවිල් රථ නවතා තැබීම අනතුරු දායක බැවින් ඒ සම්බන්ධයෙන් අවධානය යොමු කල යුතු බව. | |
| | යෝජනා | බස් නැවතුම් පොළ සඳහා ආරක්ෂක නිලධාරීන් දෙදෙනෙකු යෙදවීම.<br>පොලිස් මුර පොළ නැවත ආරම්භ කරන ලෙස ඉල්ලීම.<br>පෞද්ගලික ආරක්ෂක සේවාවක් ඇති කිරීම මඟින් පාකින් පිස් අය නිරීමටත් යෝජනා වීම. | |
| | ගරු නාගරික මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් ද සිල්වා මහතා | බීමතින් හැසිරෙන මිනිසුන් වැඩි බැවින් හල්වතුර ප්‍රදේශයේ ජංගම පොලිස් රථය යැවීමට කටයුතු කරන ලෙස ඉල්ලීම. | |
| | ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා | නගර සභා පාරේ ලොකු වාහන නැවැත්වීම තහනම් කිරීම. | |
| විශේෂ ස්තුතිය | ගරු නාගරික මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් ද සිල්වා මහතා | උප පොලිස් පරීක්ෂක ටී.එම්.එම්.ගුණසේකර මයා අම්බලන්ගොඩ නගරයේ ජනතාවට කරන ලද සේවය විශේෂ ඇගයීමට ලක් කරමින් විශේෂ සතුතියන් පුද කරන බව. | |
| ස්තුතිය | ගරු නාගරික මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් ද සිල්වා මහතා | අම්බලන්ගොඩ නගරයේ වාහන තදබදය අවම කිරීම සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමට පැමිණි හා | |

| | | | |
|---|---|---|---|
| | | සාකච්ඡාවට සහභාගී වී ඊට දැක්වූ සහයෝගයවට , පැමිණි සියළු දෙනාට ස්තුතිය පුද කරන බවත් පවසන ලදි. | |
| | | ප:ව: 4.45 | |

සකස් කළේ

අචිරා රංජනී ලොකුගේ

කලමනාකරණ සහකාර

ඒ අනුව **2018- 04- 27** දින පවත්වන ලද නගරයේ වාහන තදබදය අවම කිරීම සම්බන්ධ සාකච්ඡාවේ වාර්තාව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.

**6: 4** **2018- 04- 26 දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද පරිසර, සෞඛ්‍ය හා සනීපාරක්ෂක කමිටු වාර්තාව පිළිගත යුතු බවට ගරු සභාපති එම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා විසින් ස්ථිර කරන ලදී.**

<u>පරිසර , සෞඛ්‍ය හා සනීපාරක්ෂක කමිටුව</u>

**<u>2018.04.26. ප.ව.2.30</u>**

<u>සහභාගීත්වය</u>

1. ඇම්.ඩබ්ලිව්.අරුණ ප්‍රදීප්. — ගරු සභාපති, අම්බලන්ගොඩ නගර සභාව
2. ජී.සරත් ශ්‍රී ලාල් ද සිල්වා — ගරු නගර සභා මන්ත්‍රී. අම්බලන්ගොඩ නගර සභාව
3. ඒ.ඩබ් ජගත් කුමාර — ගරු නගර සභා මන්ත්‍රී අම්බලන්ගොඩ නගර සභාව
4. ග්‍රේෂන් කෙරමිණියගේ — ගරු නගර සභා මන්ත්‍රී. අම්බලන්ගොඩ නගර සභාව
5. ජී.ජී රුචිනි පේෂලා — ගරු නගර සභා මන්ත්‍රීනී. අම්බලන්ගොඩ නගර සභාව
6. ර්.ඇම් ඉන්ද්‍රා අයිරාංගනී — ගරු නගර සභා මන්ත්‍රීනී. අම්බලන්ගොඩ නගර සභාව
7. බී.ඒ ධම්මිකා. — ලේකම්, අම්බලන්ගොඩ නගර සභාව
8. ජී.ඩී සී ප්‍රසාද්. — මහජන සෞඛ්‍ය පරීක්ෂක අම්බලන්ගොඩ උතුර
9. එම් සෙනරත් — ප්‍රාදේශීය පරිසර නිලධාරී, මධ්‍යම පරිසර අධිකාරිය.

10. ජී.එම් මනෝරි ද සිල්වා ග්‍රාම නිලධාරී, 84, විලේගොඩ
11. එම් එච් ආශා ග්‍රාම නිලධාරී, 82, මහ අම්බලන්ගොඩ
12. පී.එච් කුමාර ද සිල්වා ග්‍රාම නිලධාරී, 86 ඒ කළුවඩුමුල්ල
13. ජී.ජී රන්දික මධුෂාන් ග්‍රාම නිලධාරී, 85 පටබැදිමුල්ල
14. සුජීව එගොඩගේ ග්‍රාම නිලධාරී, පනියන්දූව
15. ජී.එච්.එස්.එස් ෆොන්සේකා ග්‍රාම නිලධාරී, 86 සී පෝරඹ
16. ඕ සජිතා දයානි ග්‍රාම නිලධාරී, 86 බී කෙරමිණිය
17. එච්.එම්.ටී.එච්.ද.සිල්වා ග්‍රාම නිලධාරී 86 බී ඕකන්ද.
18. පී.එච් කාන්ත ද සිල්වා තාක්ෂණ සේවා නිලධාරී
19. ඩී.එච්එස්.ඩී ගුණවර්ධන තාක්ෂණ සේවා නිලධාරී
20. පී.එච්.එල්.පුෂ්පරාණි සංවර්ධන සහකාර
21. එම්.ඩබ් හිරාන් සංජීව සෞඛ්‍ය පරිපාලක
22. ඒ.අයි සාරංග සෞඛ්‍ය පරිපාලක

පිළිගැනීම

ගරු සභාපති ඇම්.ඩබ් අරුණ ප්‍රදීප් මහතා.සෞඛ්‍ය හා සනීපාරක්ෂක කමිටුව සඳහා පැමිණි ගරු නගර සභා මන්ත්‍රීවරුන් ඇතුළු සියළු නිලධාරී මහත්ම මහත්මීන් හා නගර සභා ලේකම් ඇතුළු කාර්ය මණ්ඩලය ඉතාමත් ගෞරවයෙන් පිළිගනු ලබන බව පවසන ලදි. නගර සභා බල ප්‍රදේශයේ ග්‍රාම නිලධාරී වසම් මට්ටමින් පරිසර ,

සෞඛ්‍ය හා සනීපාරක්ෂක කටයුතු පිළිබඳ පවතින ගැටළු පිළිබඳ සාකච්ඡා කර එම ගැටළු විසදා ගැනීමට මෙම කමිටුව තුළින් සිදු කෙරෙන බවත් වැඩිදුරටත් ප්‍රකාශ විය.

**2018.04.26 දින පැවති රැස්වීමේ සාකච්ජා වූ කරුණු සමාලෝචනය**

| මාතෘකාව | සාකච්ඡා වූ කරුණු | ප්‍රකාශය කවුරුන් විසින් ද යන වග. | තීරණය |
|---|---|---|---|
| ඉලෙක්ට්‍රොනික් අපද්‍රව්‍ය එකතු කිරීම සඳහා ප්ලාස්ටික් බඳුන් නොමිලේ ලබා දෙන බව | දකුණු පළාත් පරිසර අමාත්‍යාංශය මගින් ඉලෙක්ට්‍රොනික් අපද්‍රව්‍ය එකතු කිරීම සඳහා ප්ලාස්ටික් බඳුන් නොමිලේ ලබා දෙන බවත් එම බඳුන් අවශ්‍ය නම් එම ආයතනය හා සම්බන්ධ වී ලබා ගන්නා ලෙසත් පළාත් පාලන කොමසාරිස්ගේ 2018.03.27 දිනැති ලිපියෙන් දන්වා ඇති බවනගරයේ සියළුම පාසල් හා රජයේ ආයතන සඳහා එම බඳුන් ලබා දිම සුදුසු බව | ගරු සභාපති ඇම්.ඩබ් අරුණ ප්‍රදීප් මහතා. | පාසල් සඳහා භාජන 10ක් ද අනෙකුත් රජයේ ආයතන අවශ්‍යතාවය පරිදි බඳුන් ඉල්ලුම් කර ගෙනැවිත් භාර දීම. හා ඉලෙක්ට්‍රොනික් අපද්‍රව්‍ය වෙනම එකතු කරන ලෙස ටැක්ටර්වල සේවක මහතුන් දැනුවත් කිරීම. |

| | | | |
|---|---|---|---|
| ට්‍රැක්ටර් රථ පිළිබඳ තොරතුරු | දැනට පවතින ට්‍රැක්ටර් රථ සංඛ්‍යාව කොපමණද යන වග | ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ් ජගත් කුමාර | |
| | ට්‍රැක්ටර් රථ 10ක් පවතින අතර රියදුරන් හා කම්කරුවන් නිවාඩු ලබා ගත් අවස්ථාවලදී ට්‍රැක්ටර් රථ සියල්ල සේවයේ යෙදවීමට නොහැකි වන බව | මහජන සෞඛ්‍ය පරීක්ෂක ජී.ඩී සී ප්‍රසාද්. | එවැනි අවස්ථාවලදී අවශ්‍යතාවය පරිදි කර්මාන්ත අංශයේ රියදුරු තිලකසිරි හා සජී යන මහත්වරුන්ගේ සේවය ලබා ගැනීම |
| සේවකයන්ගෙන් නිසි ප්‍රයෝජන ලබා නොගැනීම | සමහර සේවකයන් පොත අත්සන් කර බාහිර ක්‍රියාවල යෙදෙන බව, උදා:- අශෝක රණවික්‍රම මහතා පොත අත්සන් කර ත්‍රී රෝද රථය පදවන බව. | ගරු සභාපති ඇම්.ඩබ් අරුණ ප්‍රදීප් මහතා. | මේ තත්ත්වය වැඩ කරන අයට අසාධාරණයක් වන බැවින් වැටුප් වර්ධක ලබා දීමේ දී මේ පිළිබඳව අවධානය යොමු කළ යුතු බව |
| සේවක ගැටළු | ඩබ්.ජී සිරිල් මහතා 2017 ඔක්තෝම්බර් මස සිට සේවයට වාර්ථා කර නොමැති බව | සෞඛ්‍ය පරිපාලක එම්.ඩබ් හිරාන් සංජීව | අශෝක රණවික්‍රම හා ඩබ්.ජී සිරිල් යන අය ඉක්මණින් විශ්‍රාම ගැන්වීමට කටයුතු කිරීම |
| | දැනට සිටින සේවකයන් ප්‍රමාණවත් ද යන වග ප්‍රමාණවත් නොවේ නම් විශ්‍රාම ගොස් ඇති රියදුරන් නැවත සේවයේ යොදවා ගත හැකි බව | ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් ද සිල්වා | |
| | දැනට සිටින සේවකයන් ප්‍රමාණවත් නොවන බවත් දැනට ලැබෙන වැටුප ප්‍රමාණවත් නොවන නිසා මෙම සේවයට පැමිණීමට අකමැත්තක් දක්වන බව. | මහජන සෞඛ්‍ය පරීක්ෂක ජී.ඩී සී ප්‍රසාද්. | |
| | සමහර මාර්ගවල විශාල වශයෙන් කොළ රොඩු වැටීම නිසා එම මාර්ග දිනපතා අතුගෑම අත්‍යවශ්‍ය බවත් වර්තමානය වන විට පාරවල් අතුගෑම සඳහා කාන්තාවන් යෙදවීම සිදු නොවන බවත් ප්‍රදේශවාසීන් පැමිණිලි කර ඇති බව | ගරු නගර සභා මන්ත්‍රීජී.සරත් ශ්‍රී ලාල් ද සිල්වා | |

| | | | |
|---|---|---|---|
| | පාරවල් අතු ගෑම සඳහා යොදවා ඇති කාන්තාවන් කසල තේරීම සඳහා යොදවන ලෙස හිටපු ලේකම් තුමිය විසින් උපදෙස් ලබා දුන් බව | සෞඛ්‍ය පරිපාලක එම්.ඩබ් හිරාන් සංජීව | විශේෂ ව්‍යාපෘතියේ එක් අයකු වෙත දිනකට ලැබෙන වැටුප කොපමණ ද යන්න සභාවට වාර්තාවක් ලබා දෙන ලෙස |
| නගරයේ යම් යම් ස්ථානවල ටේලර ස්ථානගත කිරීම | ✓ මාළු මාකට් එකේ දිනපතා අපද්‍රව්‍ය නොගතහොත් ඒවා දැඩි දුර්ගන්ධයන් හමන අතර පණුවන් සහිත එම අපද්‍රව්‍ය සේවකයන් විසින් පැටවීම සෞඛ්‍යට අහිතකර වන බැවින් මාළු වෙළඳ පොල අසල ටේලරයක් තැබීම සුදුසු බවත්, පෙ.ව 6.30ත් ප.ව 2.00 දක්වා කාලය තුළ පුංචි පොළ භූමියේ එකතුවන දිරන කසල ගැනීම සඳහා ටේලරයක් ස්ථානගත කිරීම සුදුසු බව.<br>✓ පාරක තිබෙන පොඩි කසල ප්‍රමාණයක් සෞඛ්‍ය අංශයේ හෝ කර්මාන්ත අංශයේ ටැක්ටරයක් විසින් ලබා ගැනීම සුදුසු බව | ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් ද සිල්වා | පෙර පරිදි සෞඛ්‍ය අංශයේ සේවකයන් සඳහා අතිකාල ලබා දී රාත්‍රී වැඩ මුරයක් සිදු කිරීම තුළින් මෙම ගැටළුවලට විසඳුම් ලබා දිය හැකි බවත් ඒ සඳහා ම.සෞ.ප ප්‍රසාද් මහතා අවශ්‍ය කටයුතු සිදු කරළු පිළිබඳ වාර්තාවක් සභාවට යොමු කළ යුතු බව |
| පටබැඳිමුල්ල ප්‍රජා ශාලාවේ පවතින අඩුපාඩු | ✓ පටබැඳිමුල්ල ග්‍රාම නිලධාරී කාර්යාලයට හා වැසිකිළියට ජල පහසුකම් ලබා දී නොමැති බව<br>✓ ප්‍රජාශාලාව සඳහා පුටු 50ක් අවශ්‍ය බව<br>✓ වෙරළ උද්‍යානයට වාහන ඇතුල් කිරීම වලක්වාලීම සඳහා සාදා තිබූ බාධක ඉවත් කිරීම නිසා වාහන ඇතුල් කරන බව. | 85 පටබැඳිමුල්ල ග්‍රාම නිලධාරී ජී.ජී රන්දික මධුෂාන් | ප්‍රජා ශාලා භූමියට ජල සම්බන්ධතා ලබා දෙන ලෙස<br><br>පුටු 50ක් ලබා දෙන ලෙස සභාවට ලිපියක් යොමු කිරීම. |
| ජල පහසුකම් නොමැති බව | ඕකන්ද ප්‍රජා ශාලාව සඳහා ජල පහසුකම් නොමැති බව | ඕකන්ද ග්‍රාම නිලධාරී එච්.එම්.ටී.එච්.ද.සිල්වා | ජල සම්බන්ධතාව ලබා දෙන බව |
| අවසන් කසල බැහැරලන ස්ථානය සම්බන්ධ ගැටළු | හල්වතුර අවසන් කසල බැහැරලන භූමිය දැඩි දුර්ගන්ධයන් හා ඩෙංගු අවධානමක් පවතින බව. | පනියන්දූව ග්‍රාම නිලධාරී සුජීව එගොඩගේ | |
| | එම භූමියේ වැටියක් ඉදිකර ඉන් ඇතට වන්නට කසල දමන ලෙස දැනුම් දුන්න ද ආසන්නයේ කසල දමා ඇති බැවින් මේ තත්ත්වය උද්ගත වී ඇති බව. | තාක්ෂණ සේවා නිලධාරී<br><br>පී.එච් කාන්ත ද සිල්වා | |

| | | | |
|---|---|---|---|
| | මැස්සන් සඳහා කඩිනමින් ඇබේට් ඉසීම සිදු කරන බව | මහජන සෞඛ්‍ය පරීක්ෂක ජී.ඩී සී ප්‍රසාද්. | සභා අරමුදල් යටතේ ප්‍රෙස්ගාඩ් ගෙන්වා ගෙන ඉසින ලෙස උපදෙස් දෙන ලදි |
| කොන්ක්‍රීට් කොම්පෝස්ට් බඳුන් ලබා දීම | ✓ දිරන කසල භාවිතා කර කොම්පෝස්ට් නිපදවීම සඳහා කොන්ක්‍රීට් කොම්පෝස්ට් බඳුන් ලබා දීම සුදුසු බව<br>✓ නිවෙස්වලින් පාරට අපදියර බැහැර කිරීම වැඩි වී ඇති බව හා ඒ පිළිබඳ මහජන පැමිණිලි ලැබෙන බව | ගරු නගර සභා මන්ත්‍රී. ශ්‍රේෂන් කෙරමිණියගේ | |
| | අපදියර විශාල ප්‍රමාණයක් බැහැර කරන නිවෙස්වලට උරා ගැනීමේ වලවල් සකස් කරන ලෙස උපදෙස් ලබා දෙන බව | මහජන සෞඛ්‍ය පරීක්ෂක ජී.ඩී සී ප්‍රසාද්. | කොන්ක්‍රීට් කොම්පෝස්ට් බඳුන් සභා අරමුදල් යටතේ ගෙන්වා නිවෙස්වලට ලබාදීමට කටයුතු කරන බව. |
| හල්වතුර තෙත් බිමට කසල බැහැර කරන බව | හල්වතුර තෙත් බිමට කසල බැහැර කිරීම හා අවට ඇති ඇළ මාර්ගවලට කුණු දමන බවට පරිසර මිතුරෝ සංවිධානය මගින් පැමිණිලි කර ඇති බව | ප්‍රාදේශීය පරිසර නිලධාරී, එම් සෙනරත් | |
| | ඒ අවට ඇති සියළු ඇල මාර්ග නගර සභාව විසින් කපන ලද හා පුළුල් කරන ලද කානු බව. යම් ප්‍රමාණයක පරිසර හානියක් සිදු විය හැකි බව | ගරු සභාපති ඇම්.ඩබ් අරුණ ප්‍රදීප් මහතා | |
| | | | |
| ✓ ඕකන්ද කාණුවල ජලය නිසිලෙස බැස නොයන බව | ✓ ඕකන්ද කාණුවල ජලය නිසිලෙස බැස නොයන බව<br>✓ පන්සල අසල ඉඩම වල් බිහි වී ඇති බව<br>✓ රාහුල මහතාගේ නිවස අසල පාරට ගොඩනැගිලි අපද්‍රව්‍ය දමන බව | ගරු නගර සභා මන්ත්‍රිනී. ඊ.ඇම් ඉන්ද්‍රා අයිරාංගනී | පාරට අපද්‍රව්‍ය දමන අය පිළිබඳව පරික්ෂා කර බලා ඒ අයට විරුද්ධව නඩු පැවරීමට කටයුතු කරන ලෙස ම.සෞ.ප ප්‍රසාද් මහතාට උපදෙස් ලබා දෙන ලදි. |
| කළුවඩුමුල්ල ග්‍රාමිණී විද්‍යාල ක්‍රීඩා පිටිය සම්බන්ධ ගැටළු | ➢ කළුවඩුමුල්ල ග්‍රාමිණී විද්‍යාල ක්‍රීඩා පිටියේ දැල් ආවරණ කැඩී ඇති බැවින් එය අළුත්වැඩියා කර දෙන ලෙස.<br>➢ ළමා උද්‍යානය අළුත්වැඩියා කළ යුතු බව. | 86 ඒ කළුවඩුමුල්ල ග්‍රාම නිලධාරී පී.එච් කුමාර ද සිල්වා | ඉදිරි කාලය තුළ ඉටු කරන බව. |

| | | | |
|---|---|---|---|
| | | | |
| ගලි සේවය සම්බන්ධ ගැටළු | පෞද්ගලික ආයතන මගින් දුරකථන ඇමතුමක් දුන් වහාම අපද්‍රව්‍ය ගෙන යන මුත් මුදල් ලබා ගන්නේ ද පසුවය. එහෙත් මෙම ආයතනයේ ගලි සේවය සැපයීම ප්‍රමාද වීමට හේතු කවරේද යන වග. | ගරු සභාපති ඇම්.ඩබ් අරුණ ප්‍රදීප් මහතා | |
| | පෞද්ගලික ගලි රථ මගින් අපද්‍රව්‍ය කඩිනමින් ලබා ගත්ත ද ඒවා නිසි පරිදි බැහැර නොකරන බවත් හික්කඩුව පිරිපහදු ඒකකය අසල කැලෑ ඉඩමකට බැහැර කිරීම සම්බන්ධව මධ්‍යම පරිසර අධිකාරිය වෙත පැමිණිලි ලැබී ඇති බව. | ප්‍රාදේශීය පරිසර නිලධාරී, එම් සෙනරත් | |
| | ➢ අලුත් අවුරුදු නිවාඩුවෙන් අනතුරුව සේවකයන් සේවයට වාර්ථා නොකිරීම<br>➢ ජල සම්පාදන මණ්ඩලයේ පිරිපහදු ඒකකය සඳහා දිනකට භාර ගනු ලබන ලෝඩ් ගණන දෙකකට සීමා කර තිබීම. | සෞඛ්‍ය පරිපාලක ඒ.අයි සාරංග | මෙය අතවශ්‍ය සේවාවක් බැවින් කඩිනමින් එම සේවය සැපයීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස සෞඛ්‍ය පරිපාලකවරුන් වෙත උපදෙස් ලබා දෙන ලදි. |
| සුනඛ වන්ද්‍යාකරණ කටයුතු | මෙම වසරේ සුනඛ වන්ද්‍යාකරණ කටයුතු සිදු නොකරන්නේ මන් ද යන වග. | ගරු නගර සභා මන්ත්‍රී. ශ්‍රේෂන් කෙරමිණියගේ | |
| | සුනඛ වන්ද්‍යාකරණ කටයුතු පශු වෛද්‍ය කාර්යාලය වෙත භාර දී ඇති බැවින් ඉදිරියේදී එම ආයතනය මගින් සුනඛ වන්ද්‍යාකරණය සිදු කෙරෙනු ඇති. | මහජන සෞඛ්‍ය පරීක්ෂක ජී.ඩී සී ප්‍රසාද් | පශු වෛද්‍ය කාර්යාලය වෙත ඒ බව දැනුම් දීම. |
| ස්තුති කතාව | අම්බලන්ගොඩ නගරයේ ජනතාවගේ සෞඛ්‍ය හා සනීපාරක්ෂාව සම්බන්ධයෙන් සාකච්ඡා කිරීම හා තීරණවලට එළඹීමේදී ඔබ සියළු දෙනාගේ පැමිණීම බෙහෙවින් ම වැදගත් වන බවත්, ග්‍රාම නිලධාරී ජනතාව සමඟ සමීපව කටයුතු කරන බැවින් ඉදිරියේදීත් ඔබගේ සහාය මෙතුමාට ලබා දෙනු ඇති බවත් , නගරයේ ජනතාවගේ සෞඛ්‍ය හා සනීපාරක්ෂාව සඳහා කටයුතු කිරීමට ඒකරාශී වීම සම්බන්ධව පැමිණි සියළු දෙනාට ස්තුතිය පුද කරන බවත් ප්‍රකාශ කරන ලදි. | ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් ද සිල්වා. | |

| | | | |
|---|---|---|---|
| විශේෂ ස්තුතිය | කළුවඩුමුල්ල ශ්‍රී විජයාරාම විහාරස්ථානයේ විහාරාධිපති විලේගොඩ අරියදේව හිමියන් විසින් සෞඛ්‍ය අංශයේ කාර්ය මණ්ඩලය ඇගයීමට ලක් කරමින් සිංහල අලුත් අවුරුද්ද වෙනුවෙන් වාර්ෂිකව ලබා දෙන බඩු මල්ල හා සංග්‍රහය වෙනුවෙන් විශේෂ ස්තුතිය පුද කරන බව. | ගරු නගර සභා මන්ත්‍රිනී. ර්.ඈම් ඉන්ද්‍රා අයිරාංගනී | |
| නිමාව | ප.ව 4.30 ට | | |

සකස් කලේ -
පි.එච්.එල්.සී.පුෂ්පරාණි
සංවර්ධන සහකාර (පරිසර)

**ඒ අනුව 2018 -04- 26 දින පවත්වන ලද පරිසර, සෞඛ්‍ය හා සනීපාරක්ෂක කමිටු වාර්තාව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**6: 5 2018- 04- 23 දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද ක්‍රීඩා කමිටු වාර්තාව පිළිගත යුතු බවට ගරු සභාපති එම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්. ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදී.**

## <u>ක්‍රීඩා කමිටු වාර්තාව -අම්බලන්ගොඩ නගර සභාව</u>

## <u>2018.04.23</u>

සහභාගිත්වය-

1. ඇම්.ඩබ්ලිව්.අරුණ ප්‍රදීප් මහතා -ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව.
2. ජී.එස්.එස්.එල් ද සිල්වා මහතා -ගරු නගර සභා මන්ත්‍රී,අම්බලන්ගොඩ නගර සභාව.
3. ඒ.ඩබ්ලිව්.ජගත් කුමාර මහතා -ගරු නගර සභා මන්ත්‍රී,අම්බලන්ගොඩ නගර සභාව.
4. ධම්මික කොඩිකාර මහතා -ගරු නගර සභා මන්ත්‍රී,අම්බලන්ගොඩ නගර සභාව.
5. එස්.එම්.සරත්චන්ද්‍ර ද සිල්වා මහතා -ගරු නගර සභා මන්ත්‍රී,අම්බලන්ගොඩ නගර සභාව.
6. ජී.ජී.ආර්.පේෂලා කුමාරි ද සිල්වා මිය -ගරු නගර සභා මන්ත්‍රිනි,අම්බලන්ගොඩ නගර සභාව.
7. එච්.ඉනෝකා ක්‍රිෂාන්ති මිය -ගරු නගර සභා මන්ත්‍රිනි,අම්බලන්ගොඩ නගර සභාව.
8. කී.ඒ.ධම්මිකා මිය -ලේකම්,අම්බලන්ගොඩ නගර සභාව.
9. ඩී.එච්.එස්.ඩී.ගුනවර්ධන මහතා -තාක්ෂණ සේවා නිලධාරි,අම්බලන්ගොඩ නගර සභාව.
10. ජී.අශෝක කුමාර මහතා -ක්‍රීඩා භූමි උපදේශක ,අම්බලන්ගොඩ නගර සභාව.

11. කසුන් ගාල්ලගේ මහතා - ක්‍රීඩා නිලධාරි,ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,අම්බලන්ගොඩ.
12. ඉදුනිල් එදිරිවික්‍රම සූරිය මහතා - දකුණුපළාත් පාපන්දු පුහුණුකරු,ශ්‍රී ලංකා පාපන්දු සම්මේලනය
13. මහේන්ද්‍ර වික්‍රමසිංහ මහතා - ක්‍රීඩා කමිටු සාමාජික,පෝරඹ,අම්බලන්ගොඩ.
14. ජේ.ජයවීර මහතා - රියෝ ක්‍රීඩා සමාජය,අම්බලන්ගොඩ.
15. සරත් ශාන්ත මහතා - සිංහ ක්‍රීඩා සමාජය,අම්බලන්ගොඩ.
16. ආර්.ඩබ්ලිව්.ඩී.මල්කාන්ති මිය - සංවර්ධන නිලධාරි,අම්බලන්ගොඩ නගර සභාව.

**පිළිගැනීම** - ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව.

වසර 03 කට පසුව අද දින ක්‍රීඩා කමිටුව එක්රැස් වූ බවත් මීට පෙර ප්‍රදේශයේ ළමුන්ගේ ක්‍රීඩා කුසලතා නැංවීමට විශාල කර්තව්‍යයක් ක්‍රීඩා කමිටුව හරහා සිදු කළ බවත් ඉදිරියේ දී එම කර්තව්‍යයන් ඉටු කිරීම වෙනුවෙන් අද දින ක්‍රීඩා කමිටුවට පැමිණි සියළු දෙනා පිළිගනිමින් ක්‍රීඩා කමිටුවේ කටයුතු ආරම්භ කරන ලදි.

**අදහස් හා යෝජනා -**

**ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව.**

ප්‍රශ්නකාරි තත්වයක් උඩ අද දින ක්‍රීඩා කමිටුව රැස් කිරීමට සිදුව ඇති බවත් එනම් ක්‍රීඩා භූමිය ප්‍රතිසංස්කරණයට අදාළ වියදම ලබා දීමට නගර සභාවට නොහැකි වී ඇති බව පෙන්වා දෙමින් ක්‍රීඩා පිටිය ප්‍රතිසංස්කරණය කිරීම ප්‍රධාන කාර්යයක් ලෙස සළකා ඉදිරියේ දී ඒ සඳහා අවශ්‍ය කටයුතු සිදුකරන බව දන්වා සිටින ලදි.

**ජේ.ජයවීර මහතා-රියෝ ක්‍රීඩා සමාජය**

ක්‍රීඩා පිටියේ තණ කොළ දැමීම සඳහා Leveling Report එකක් ගැනීම සඳහා මේ දවස් වල මැනීම් කටයුතු සිදුකරන බව.

**ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව.**

කොපමණ කාලයක සිට වාර්තාව ඉල්ලා සිටින බව

**ජේ.ජයවීර මහතා-රියෝ ක්‍රීඩා සමාජය**

මාස 06ක කාලයක සිට

**ගරු නගර සභා මන්ත්‍රී -ධම්මික කොඩිකාර මහතා**

Leveling Report එක ඇවිල්ලද තියෙන්නේ

**ජේ.ජයවීර මහතා-රියෝ ක්‍රීඩා සමාජය**

තවම නැති බව දැන්වීම.

**ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව.**

ජනවාරි 01දින රැස්වීමක් පැවැත්වීම සඳහා මෙම ක්‍රීඩාංගණය බුක් කිරීමට ආවා.ඒ වෙලාවේ ජයන්ත ජයවීර මහතාත් හිටියා. ඒ අවස්ථාවේත් මේ Leveling Report එක ගැන කථා කලා. මම ඒ වෙලාවේ යෝජනා කලා අපි සතුව උපකරණ තිබෙන නිසා තාක්ෂණික සේවා නිලධාරි කෙනෙක් ලවා මෙම කාර්යය කර ගන්න කියලා. නගර සභාවේ උපකරණ කැඩිච්ච නිසා ඒ වේලාවේ එම කාර්යය කර ගැනීමට නොහැකි වී තිබෙනවා. මේ සඳහා රු 100,000.00 පමණ මුදලක් වැයවන බව සොයා බැලීමේ දී දැනගන්නට ලැබුණා. ඒ අනුව ඉංජිනේරු තාක්ෂණික ආයතනයට මේ ගැන දැන්වූවා. ඒ අනුව තමයි මැනීම් කටයුතු සිදු කරන්නේ. මේ සතිය ඇතුළත එම වාර්තාව ලැබේවි.

ක්‍රීඩා සංගමයේ ඉල්ලීම මත කාණුව හදන්න අපි කොන්ත්‍රාත් දෙනවා. නොවැම්බර් මාසයේ ඇති වූ සුළි සුළඟට කැඩුණු පැවිලියන් එකේ වහළ ගලවල හදන්න ගත්තේ අපි ආවට පස්සේ දැන් ලී 08 ගෙනල්ල තියෙන්වා හෙට වෙන කොට පටන් ගන්න පුළුවන්ද ?

**තාක්ෂණ සේවා නිලධාරි-අම්බලන්ගොඩ නගර සභාව.**

පුළුවන් සර්,

**ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව.**

ලී කොපමණ ඉල්ලල තියෙනවද?

**තාක්ෂණ සේවා නිලධාරි-අම්බලන්ගොඩ නගර සභාව.**

2" X 4" ලී 05 ක් සම්පූර්ණයෙන්ම දාන්න ඕනේ සර්.

**ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව.**
අපි හෙට වහල හදන්න පටන් ගන්නවා. තව මොනවද පැවිලියන් එකේ කරන්න තියෙන්නේ

**මහේන්ද්‍ර වික්‍රමසිංහ මහතා**
ටොයිලට් වලත් හදා ගන්න අවශ්‍යයි.

**තාක්ෂණ සේවා නිලධාරි-අම්බලන්ගොඩ නගර සභාව**

වතුර මට්ටම උඩින් තියෙන නිසා කොන්ක්‍රීට් කරල අළුතින් වලක් හදන්න ඕනේ.

**ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව.**

100% සීල් කරල අළුතින් වලක් හදන්න. අවශ්‍ය නම් මේ වගේ තැනකට ගැලපෙන වලක් සඳහා CIC වගේ සුදුසු ආයතනයකින් උපදෙස් ලබාගන්න.

**සරත් ශාන්ත මහතා - සිංහ ක්‍රීඩා සමාජය**

වතුර බොන්න තැනකුත් නැහැ සර්

**ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව.**

Dressing Room වල නැද්ද?

**ගරු නගර සභා මන්ත්‍රීණී - එච්.ඉනෝකා ක්‍රිෂාන්ති මිය**

නැහැ සර්,

**ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව.**

Dressing Room දෙකේ සින්ක් 02 ක් සවි කරන්න. ක්‍රීඩාංගණයේ කරන්න අවශ්‍ය වැඩවලට සම්පූර්ණ ඇස්තමේන්තුවක් දෙන්න.

**මහේන්ද්‍ර වික්‍රමසිංහ මහතා**

පැවිලියන් එක ඉස්සරහ Interlock අල්ලල දෙන්න මීට පෙරත් අපි ඉල්ලීම් කරල තියෙනවා.

**ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව.**

අපි ඒක කරනවා.

**ඉඳුනිල් එදිරිවික්‍රමසූරිය මහතා - පාපන්දු පුහුණුකරු**

පළමුවෙන්ම ස්තූතිවන්ත වෙනවා අද දින ක්‍රීඩා කමිටුව කැඳවීම පිළිබඳව. වසර දෙකක් තිස්සේ අපි ක්‍රීඩකයෝ විදියට කණගාටුවෙනවා ක්‍රීඩා පිටියට සිදුකර තිබෙන දේ ගැන. ක්‍රීඩා පිටිය කඩලා දාල ,ගොඩගන්න බැරි තත්වයට පත් කරල තියෙනවා. අද එම ක්‍රීඩාපිටිය ගොඩගැනීමට සභාපතිතුමා අතගහල තියෙනවා. ඒ පිළබඳව ස්තූතිවන්ත වෙනවා. මේක වටේ තිබෙන කාණු ටික සංවර්ධනය කරලා සැලසුම් සකස් කරලා ප්‍රතිපාදන අනුමත වුනාට පසුවයි ක්‍රීඩා පිටිය ගලවන්න තිබුනේ.නමුත් හිතුමතේට එහෙම කළා. වෙච්ච හානිය නිලධාරින්ගෙන් අය කරන්න කියල මම යෝජනා කරනවා. මීට පෙර ප්‍රචාරයක් ගියා ටර්පින්ග් එකක් දාලා මෙම ක්‍රිඩාංගණය ක්‍රිකට් වලට විතරක් හදන්න යනවා කියලා. මේ පිළිබඳව ගිවිසුමකුත් ඇති කරගෙන තියෙනවා. අපිව කිසිම කෙනෙක් මේ පිළිබඳව දැනුවත් කරල නැහැ. ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ ක්‍රීඩා නිලධාරිතුමාවත් මේ සාකච්ඡාවට ගත්තෙ නැහැ.අපිට බයක් තියෙනවා කුරුණෑගලට,ගාල්ලට වුනා වගේ අපේ අනෙක් ක්‍රීඩා මේ ක්‍රීඩාංගණයෙන් එලියට යයි කියලා. අපේ ප්‍රධාන පාසල් වල නිවාසාන්තර ක්‍රීඩා තරග පවත්වන්නේ මේ කීඩාංගණයේ. ඒ නිසා ඔබතුමා මේ පිළිබඳව සළකා බලා සියළුම ක්‍රීඩාවලට යෝග්‍ය පරිදි මේ ක්‍රීඩාංගණය සකස් කර දෙන්න කියල මා ඉල්ලා සිටිනවා.

**ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව.**

ගිවිසුම මොකක්ද?

**ඉඳුනිල් එදිරිවික්‍රමසූරිය මහතා**

අශෝක මහතා දන්නවා ඇති.

**ජී.අශෝක කුමාර මහතා- ක්‍රීඩාභූමි උපදේශක**

ගරු මැතිවරණ කොමසාරිස් මහින්ද දේශප්‍රිය මැතිතුමාත් එක්ක සාකච්ඡාවක් තිබුනේ,අපි එතුමන්ගෙන් ඉල්ලීමක් කරා මේ ක්‍රීඩාංගණයේ ප්‍රතිසංස්කරණ කටයුතු සිදුකර දෙන්න කියලා ගරු ක්‍රීඩා අමාත්‍යතුමන්ව දැනුවත් කිරීමට එම අවස්ථාවේදී අපි ක්‍රීඩා ඇමතිතුමන්ව දුරකථනයෙන් සම්බන්ධ කර ගත්තා, එතුමන් පැවසුවා දකුණු පළාත් ගරු ප්‍රධාන අමාත්‍යතුමා,ගරු අමාත්‍ය වජිර අබේගුණවර්ධන මැතිතුමාත් මේ සම්බන්ධව ලිපි මගින් ක්‍රීඩා පිටිය ප්‍රතිසංස්කරණය කර දෙන ලෙසට ඉල්ලීම් කර ඇති බව. එතුමා මේ පිළිබඳව ගරු නියෝජ්‍ය කථා නායක තිලංග සුමතිපාල මැතිතුමාවත් දැනුවත් කරල තියෙන බව පැවසුවා. එදා මහින්ද දේශප්‍රිය මැතිතුමාට තේ පැන් සංග්‍රහයක් සූදානම් කරල තිබුණා. ඒ වෙලාවේ තමයි මේ පිළිබඳව සාකච්ඡා කලේ ඒකට තමයි ගිවිසුමක් ගහල තියෙනව කියන්නේ. එහෙම ගිවිසුමක් ඇති කරගෙන නැහැ.

**ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්.සරත්චන්ද්‍ර ද සිල්වා මහතා.**

මේ ක්‍රීඩාංගණය හදන්නේ සියළුම ක්‍රීඩාවලටද?

**ජී.අශෝක කුමාර මහතා- ක්‍රීඩාභූමි උපදේශක**

ඔව්. එහෙම තමයි බලාපොරොත්තු වෙන්නෙ.

**ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව.**

මම ඉගෙන ගත්ත නාලන්ද විද්‍යාලයේත්,ආනන්ද විද්‍යාලයේත්, ශාන්ත පීතර විද්‍යාලයේත් CCE එකෙත් පා පන්දු සෙල්ලම් කරන්නෙ පිච් එකේ. නමුත් එවගේ ක්‍රීඩාංගණ හොඳින් නඩත්තු කරගෙන යනවා. අපි රියෝ සහ සිංහ එකට Trup එකක් හදලා දුන්නා නමුත් නඩත්තු කරන්න සේවකයෝ නැති නිසා එයාලට ඒක කරගෙන යන්න බැරි වුණා. අපි ළඟ නඩත්තුවට අවශ්‍ය සියළු පහසුකම් තියෙන නිසා පා පන්දු වගේම මළළ ක්‍රීඩා වුණත් කරන්න පුළුවන්. ඒකට Cricket Board එක විරුද්ධ වෙන එකක් නැහැ. ගාල්ල හැරුණාම trup එකක් තියෙන්නෙ පානදුරේ. අපි දක්ෂ ක්‍රිකට් නායකයෝ බිහිකරල තිබෙන්නේ මෙවැනි දුෂ්කරතා මැද. අපේ පාසල් ක්‍රීඩකයන්ට හොඳ trup එකක සෙල්ලම් කරන්න ලැබෙන්නේ කොළඹට ගියාම.

මම පොරොන්දු වෙනවා සියළුම ක්‍රීඩා , ක්‍රීඩා කිරීමට හැකි පරිදි මේ ක්‍රීඩාංගණය සකස් කරනවා කියල. මමත් පා පන්දු සෙල්ලම් කරපු කෙනෙක්. ක්‍රිකට් පාලක මණ්ඩලයට අපි මාස 03ක් දෙන්නම් මේ වැඩ ටික අවසන් කර දෙන්න. එහෙම නැති වුනොත් අපට වෙනත් සැලැස්මක් ක්‍රියාත්මක කරන්න වෙනවා. මේක කරන්න තාක්ෂණය තියෙන්නේ ක්‍රිකට් පාලක මණ්ඩලය සතුව, අමාරුම දේ තමයි නඩත්තු.

ඒක හොඳට කරන්න අපට හැකියාව තියෙනවා. ඒ නිසා අපි සහයෝගයෙන් මේක කරමු. මේ සඳහා හැම අංශයෙන්ම ප්‍රවීනයන් අපි සම්බන්ධ කර ගනිමු.

**මහේන්ද්‍ර වික්‍රමසිංහ මහතා**

අපි පා පන්දු සෙල්ලම් කරපු අය විදියට අපි බයේ හිටියේ ක්‍රිකට් වලට විතරක් පිට්ටනිය යයි කියලා.

**ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව.**

මගේ අදහසක් තියෙනවා මානාන ක්‍රීඩාංගණය පාපන්දු වලට හදන්න. අපි ඒකත් බලමු.

**මහේන්ද්‍ර වික්‍රමසිංහ මහතා**

ලයිට් වැටක් ක්‍රීඩාංගණය වටේ ගහන්න පුළුවන්නම් හොඳයි. ඒකට ඇස්තමේන්තුවකුත් හැදුවා ලක්ෂ තුනක. නමුත් ඒක කරගන්න බැරි වුණා.

**ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව.**

ලක්ෂ 300ක් ඇස්තමේන්තුව, නැත්නම් මම ඒක කරනවා.හවස 05 වෙනකොට ක්‍රිකට් පුහුණු අවසන් කරලා ක්‍රීඩාංගනය පාපන්දු වලට දෙන්න.

**මහේන්ද්‍ර වික්‍රමසිංහ මහතා**

සමහර දවස්වලට 6.30 විතර වෙනවා.

**ජී.අශෝක කුමාර මහතා- ක්‍රීඩාභූමි උපදේශක**

මැච් එකක් තියෙන කොට තමයි එහෙම වෙන්නෙ,ලයිට් දාගන්න පුළුවන්නම් හොඳයි.

**තාක්ෂණ සේවා නිලධාරි-අම්බලන්ගොඩ නගර සභාව**

ක්‍රිකට් 6 වෙනකම් තියෙන නිසා පාපන්දු ගහන අයට 7-8 වෙනකම් සෙල්ලම් කරන්න මේක හදන එක හොඳයි. ව්‍යායාම කරන අයටත් හොඳයි. කලින් ඇස්තමේන්තුව ලක්ෂ 300 නිසා කරගන්න බැරි වුණා. බීගල් කියල ලාම්පුවක් තියෙනවා. ඒක හොඳයි. බිල ගෙවන්න පුළුවන්.

**ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්.සරත්චන්ද්‍ර ද සිල්වා මහතා.**

උදේ ඉඳන් පැය 08 ක් විතර ක්‍රිකට් සෙල්ලම් කරලා පැය 02 පමණක් පා පන්දු වලට, ඒක ආසාධාරණ නැද්ද?

**ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව.**

උදේට ළමයි පාසල් යනවා 2.30 පමණ තමයි පුහුණු වීම් වලට එන්නේ. බීගල් එකක් දැනටමත් ගබඩාවේ ඇති.ඇතුලේ කොටස තමයි දාන්න ඕනේ ඒවා 02 ක් දැම්මම හොඳටම ඇති.

**සරත් ශාන්ත මහතා - සිංහ ක්‍රීඩා සමාජය**

සැහැල්ලු පන්දු මැච් එකක් ගහන්න රු.1200.00 ඕන. සල්ලි වලට ගහනවනම් කමක් නැහැ. සමහර ළමයි ඕවර් 15 ක වගේ පොඩි මැච් ගහනවා. එකකට වඩා ගහනවනම් රු.5,000.00 වීම අසාධාරණයි.

**ජී.අශෝක කුමාර මහතා- ක්‍රීඩාභූමි උපදේශක**

පාසල් වලින් අසාධාරණ ලෙස මුදල් අයකරන්නේ නැහැ,අපි නොමිලේ දීපු අවසථාත් තියෙනවා. නමුත් එහෙම අස්ථාවලදී ක්‍රීඩා පිටියට හානි සිදුවූ විට පාසල් වලට දැන්නුවත් ඒ සම්බන්ධයෙන් කටයුතු කරන අවස්ථා අඩුයි.

**ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව.**

සාමාන්‍ය යෙන් අපි අයවැය සැලසුම් කරන අවස්ථාවේ දී ඔබතුමන්ලාගේද යෝජනා අදහස් ඇතිව තමයි මිල ගණන් ඇතුළත් කරන්නේ. මෙම වසරේදී අයවැය සකස් කරන අවස්ථාවේ දී සභාවක් තිබුණේ නැහැ.

**ඉඳුනිල් එදිරිවික්‍රමසූරිය මහතා - පා පන්දු පුහුණු කරු**

මළල ක්‍රීඩා වලටත් රු.800.00 ගන්නවා.

**ජී.අශෝක කුමාර මහතා- ක්‍රීඩාභූමි උපදේශක**

මළල ක්‍රීඩා පුහුණු වීම් වලට අයකරන්නේ නැහැ. පුහුණු කඳවුරු වලට පමණයි අයකරන්නේ. එම අවස්ථාවේ දී වෙනත් ක්‍රීඩාවකට පිට්ටනිය දෙන්න බැරි නිසා.අවශ්‍ය නම් වෙනස් කර ගන්න පුළුවන්.

**ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව.**

මේ අවස්ථාවේ දී අයවැය වෙනස් කරන එක හොඳ නැහැ. ලබන වසරේ දී කරමු. ගමේ ළමයි කොහොමත් සෙල්ලම් කරන්නේ ගමේ පිට්ටනියේ.

**ගරු නගර සභා මන්ත්‍රී - ධම්මික කොඩිකාර මහතා**

නොමිලේ ලබා දුන්නොත් දිගටම බුක් කරන නිසා කොටසකට නැතිවෙනවා.ඒ නිසයි එහෙම කරලා තියෙන්නෙ.

**ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව.**

නොමිලේ අවශ්‍ය අයට ලිපියකින් ඉල්ලීමක් කරන්න කියමු. ඒ පිළිබඳව සභාවෙන් තිරණයක් ගමු.

**ගරු නගර සභා මන්ත්‍රී- සරත් ශ්‍රී ලාල් ද සිල්වා මහතා**

පසුගිය දවසක ක්‍රීඩා අමාත්‍යතුමා පැවසුවා මෙම පිට්ටනියේ ගැටළුව නිසා මෑත කාලීනව අම්බලන්ගොඩ ප්‍රදේශයෙන් කිසිඳු කීඩකයෙක් ජාතික මට්ටමට පැමිණ නැති බව. ඒ නිසා ක්‍රීඩාපිටිවලට නිදහස දෙන්න අවශ්‍යයි. ඒකොහොමද කියල ක්‍රීඩා සමාජවලටම කථා කරල තීරණ

ගන්න කියමු. මොකද එකම දවසමෙ ක්‍රීඩා පිටිය ක්‍රීඩා සමාජ කිහිපයකින්ම ඉල්ලීම් කළොත් අපි කොහොමද විසඳන්නෙ.

**ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව.**

කානිවල් වලට ලක්ෂ 03 ඇප තැන්පත්, ඇයි ඒවා කරන්න එපා ද?

**ගරු නගර සභා මන්ත්‍රී- ඒ.ඩබ්ලිව්.ජගත් කුමාර මහතා**

පසුගිය දිනයක මානාන පිට්ටනියේ සංගීත ප්‍රසංගයක් තිබුණ.ඇප තියලද දන්නෙ නැහැ. පාරේ ලයින් එකෙන් තමයි කරන්ට් එක අරන් තිබුනේ, ගස් කපලා ඇලට දාල තිබුණා. පිට්ටනියත් හොඳටම සවුත්තු කරලා. මම ලේකම්තුමියට පැවසුවා ,සිදුවූ හානිවලට ඇපයෙන් මුදල් අඩු කරගන්න කියලා.

**ඉඳුනිල් එදිරිවික්‍රමසූරිය මහතා - පා පන්දු පුහුණු කරු**

පාරේ නගර සභා ලයින් එකෙන් තමයි කරන්ට් එක අරන් තිබුනේ. සීල් කරපු ටිකට් නෙමෙයි දුන්නේ. අපි Count Poi 8 ක් නගර සභාවට ගෙනාවා.

**ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව.**

ආදායම් පරික්ෂකතුමා බැලුවද?

**ඉඳුනිල් එදිරිවික්‍රමසූරිය මහතා - පා පන්දු පුහුණු කරු**

ඔව්.

**ක්‍රීඩා නිලධාරි කසුන් ගාල්ලගේ මහතා**

අම්බලන්ගොඩ නගර සභාවෙන් මාදම්පා ගඟේ ඉදිකල පිහිණුම් තටාකය නැවත හදලා දෙන්න කියල ක්‍රීඩා සමාජ අපෙනුත් ඉල්ලුම් කරල තියෙනවා. අම්බලන්ගොඩ පිහිණුම් වලට දක්ෂයන් හිටියත් ජයග්‍රහන නැහැ. ස්ථාන නැතිව ළමයි පරදින්නේ දශම ගණන් වලින්, ඒක නිසා මම ඉල්ලීමක් කරනවා ක්‍රීඩා අමාත්‍යාංශය හරහා මීටර් 50 ක Pool ලබා ගන්න කටයුතු කරන්න කියල. මහජන ක්‍රීඩාංගණය හදන්න ඔබතුමා දරණ උත්සහයට අපි ස්තූති වන්ත වෙනවා. විකල්ප ක්‍රීඩාංගණයකුත් අවශ්‍යයි. ක්‍රීඩා අමාත්‍යාංශය ක්‍රීඩා ගම්මාන 03 ක් හඳුනාගෙන තියෙනවා.එකක් අම්බලන්ගොඩ. නමුත් වොලිබෝල් ක්‍රීඩාංගණයක් අප සතුව නැහැ. මීටර් 400 ධාවන පථයක් නැහැ. රු.ලක්ෂ 02 මුදලක් වියදම් කරලා පියසේන ක්‍රීඩාංගණයේ අපි Toilt අළුතින් හැදුවා. එම පිට්ටනියේ වොලි බෝල් වලට Code එකක් හදල දෙන්න. මීටර් 100 Track එක හදල දුන්නොත් අපට පොල්වත්තෙ මළල ක්‍රීඩා පුහුණුවීම් කරන්න පුළුවන්.

**ජී.අශෝක කුමාර මහතා- ක්‍රීඩාභූමි උපදේශක**

ඇල පැත්ත සුද්ද කරල හඳන්න පුළුවන්.

**ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව.**

To මහතා වොලිබෝල් Code එකට ඇස්තමේන්තුවක හදල දෙන්න.

**ක්‍රීඩා නිලධාරි කසුන් ගාල්ලගේ මහතා**

**ඇල ටිකක් පස්සට ගන්න පුළුවන්නම් හොඳයි.**

**ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව.**

එතන ඇල හරල තියෙන්නේ ගංවතුර ගැටළුවට පිළයමක් ලෙස To මහතා ඒකටත් ඇස්තමේන්තුවක් දෙන්න. පසුගිය දිනක පැවැති දායක සභා රැස්වීමේ දී කියල තියෙනවා පිට්ටනියේ සෙල්ලම් කරන බෝලට දැලට උඩින් පන්සටලට එනවා කියලා මොකද මේකට කරන්නේ.

**ජී.අශෝක කුමාර මහතා- ක්‍රීඩාභූමි උපදේශක**

**දැල තව උස්සමු.**

**ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව.**

TO මහත්තයා පන්සලේ නායක හාමුදුරුවොත් එක්ක කථා කරල මේක කරන්න.

**ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්.සරත්චන්ද්‍ර ද සිල්වා මහතා.**

මීට වසර 10 පෙර සිසිර මහත්තයට මම කිව්වා මේකට කරන්න පුළුවන් දේ. නමත් ඒක සුළඟේ ගියා.

**ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව.**

දැන් සිසිර මහත්තයා නැහැ ඒ අදහස දෙන්න.

**ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්.සරත්චන්ද්‍ර ද සිල්වා මහතා.**

**කරන්න ඕන දේ මම එතනට ගියවිට කියන්නම්.**

**ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව.**

TO මහත්තයා මෙතුමාගේ අදහසුත් ගන්න.

**මහේන්ද්‍ර වික්‍රමසිංහ මහතා**

ක්‍රීඩාංගණය බුක් කරහාම පැවිලියන් එක අරින්නේ නැහැ. ඒකටත් මොකක් හරි කරන්න.

**ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්.සරත්චන්ද්‍ර ද සිල්වා මහතා.**

ඒක කරල තියෙන්නේ අඩුවෙන් පිට්ටනිය දෙන්න ඕන නිසයි. සේවකයන් 02 ඒ සඳහා යෙදවුව හොත් එයාලට රු.3000.00 දෙන්න ඕනෙ. ඒකයි දෙකකට තබලා තියෙන්නේ. සමහර වේලාවට අනවශ්‍ය දේවලුත් සිදුවෙනවා කියලා ආරංචි තියෙනවා.

**ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්.සරත්චන්ද්‍ර ද සිල්වා මහතා.**

මෙතන වෙලා තියෙන්නේ පිට්ටනිය භාර දෙන කොට පරික්ෂා කරන්න කෙනෙක් නැති එක.

**ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්.සරත්චන්ද්‍ර ද සිල්වා මහතා.**

ලේකම් මිස් පිට්ටනියට ඉන්වෙන්ට්‍රි එකක් දාන්න පිළියම් යොදල දෙන්න. පරික්ෂා කරල භාර ගන්න.

**ජේ.ජයවීර මහතා-රියෝ ක්‍රීඩා සමාජය**

**වැට තව උස්සල හදමු. එතකොට අනවශ්‍ය පුද්ගලයෝ එන එක වළක්වා ගන්න පුළුවන්.**

**ගරු නගර සභා මන්ත්‍රී ධම්මික කොඩිකාර මහතා**

**අපි පොලිසියෙන් ඉල්ලීමක් කරමු මොබයිල් එකක් යන්න කියලා.**

**ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව.**

**අපි පොලිසියත් එක්ක රැස්වීමක් සංවිධානය කරල තියෙනවා එතනදි කියමු. දේවානන් ද පැත්තේ ස්ලැබ් දාන්න.**

**ජී.අශෝක කුමාර මහතා- ක්‍රීඩාභූමි උපදේශක**

**25 වෙනිදාට සැහැල්ලු පන්දු ක්‍රිකට් මැච් එකකට පොල්වත්ත පිට්ටනිය බුක් කරල තියෙනවා. පිට්ටනිය හදාගන්න බැරිවුන නිසා මානාන පිට්ටනිය දෙමු.**

**ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්ලිව්.ජගත් කුමාර මහතා**

**මානාන පිට්ටනියත් හොඳටම සවුත්තු වෙලා තියෙන්නෙ.**

**සරත් ශාන්ත මහතා - සිංහ ක්‍රීඩා සමාජය**

**එහෙනම් මේ පිට්ටනිය දෙමු.**

**ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව.**

ඔයාලා කියනවනම් දෙමු. නමුත් අපට රැස්වීමකටවත් දුන්නෙ නැහැ. පොල්වත්ත පිට්ටනිය හදන්න මොනවද අවශ්‍ය ?

**ජී.අශෝක කුමාර මහතා- ක්‍රීඩාභූමි උපදේශක**

පස් කියුබ් 01 විතර

**ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව.**

හොස්පිට්ල් එකෙන් පස් ගන්න පුළුවන් කියල කතාවක් තියෙනවා. මම අහල කියන්නම්, එහෙන් ගන්න.

**ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්ලිව්.ජගත් කුමාර මහතා**

මානාන පිට්ටනියත් තලල දෙන්න.

**ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව.**

මානාන පිට්ටනියේ එහා පැත්ත ශුද්ධ කරල පිට්ටනිය හදාගන්න. නැතිනම් ඔය ඉඩම මිනිස්සු අල්ල ගන්නවා. එහෙම වුනොත් අපට පිට්ටනිය නැති වෙනවා. මානාන තමයි මෙහෙ තියෙන හොඳම පිට්ටනිය අක්කර 4 ½ තියෙනවා. පාසල් කොටස අපි ගනිමු. අපට දෙන්න කියල ගරු ප්‍රධාන අමාත්‍යතුමාගෙනුත් අධ්‍යාපන අමාත්‍යාංශයෙනුත් ඉල්ලීමක් කරමු.

**ක්‍රීඩා නිලධාරි කසුන් ගාල්ලගේ මහතා**

ජිම් එකේ උඩ තට්ටුව මේස පන්දු වලට ගන්න පුළුවන්ද කියල අමාත්‍යාංශය අහනවා මේස අමාත්‍යාංශයෙන් දෙනවා.

**ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව.**

මම ඔය ගොඩනැඟිල්ල හැදුවේ කරිත්ත කන්ද ප්‍රදේශයේ ග්‍රාම නිලධාරි, සමෘද්ධි ආදි නිලධාරින්ගේ රැස්වීම් තියන්න. සරත් මන්ත්‍රීතුමා මොකද කියන්නෙ?

**ගරු නගර සභා මන්ත්‍රී සරත් ශ්‍රීලාල් මහතා**

ප්‍රදේශවාසින්ගේ යෝජනාව තියෙන්නෙ ප්‍රජා ශාලාවකට ප්‍රතිපාදන දෙනවනම් කරමු.

**මහේන්ද්‍ර වික්‍රමසිංහ මහතා**
ජිම් එකට මොකද වුනේ?

**ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව.**

ජිම් එක නැවත අරින්න ඕනෙද?

**ක්‍රීඩා නිලධාරි කසුන් ගාල්ලගේ මහතා**

ඔව්.

**ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව.**

එහෙනම් සභාවට ලියුමක් දෙන්න. ලේකම් මිස් මේ පිළිබඳව සම්පූර්ණ වාර්තාවක් දෙන්න. මේ ජිම් එකට උපකරණ අරන් දුන්නේ අම්බලන්ගොඩ ඇවිදින්නනගේ සංගමය. එයාලත් මට දොස් කියනවා. උපදේශක කෙනෙක් අවශ්‍ය නැහැ. එන අය දන්නවා ඒ උපකරණ පාවිච්චි කරන්න. ශාලා භාරකරු එතනට යොදවන්න දහවල් කෑමට යන්න කියන්න උදේ හවස ජිම් එක ඇරල තියන්න. අතිකාල දීමනා ගෙවන්න එපා.

**ඉඳුනිල් එදිරිවික්‍රමසූරිය මහතා - පා පන්දු පුහුණු කරු**

අම්බලන්ගොඩ පාපන්දු සංගමය පිහිටවලා අවුරුදු 04 ක් විතර වෙනවා. ඒක ප්‍රතිසංවිධානය කරනම් හොඳයි. දැනට අපි ප්‍රජාපතිය පාසලේ ක්‍රීඩාංගණයේ සහයෝගයෙන් පා පන්දු තරග පවත්වගෙන යනවා.

**ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව.**

මීට අවුරුදු 20කට පෙර අපි 15න් පහළ පාපන්දු තරගාවලියක් පවත්වා එහි දස්කම් පෑ ක්‍රීඩකයන් තෝරා ගෙන නගර සභා පා පන්දු සංචිතයක් හැදුවා. ඔවුන්ට සියළු පහසුකම් ලබා දෙමින් අවු .19 වෙනකම් ඉඳුනිල් යටතේ නොමිලේ පුහුණුවීම් ලබා දුන්නා. පළමු කණ්ඩායමද පා පන්දු Club අතර පැවති තරගාවලියකින් අවසන් වටයට තේරුණා. සෝල්ඩන් ක්‍රීඩා සමාජය සමග අපට සම ශුරතාව ලැබුණා. එදා සෙල්ලම් කරපු අපේ ළමයි තමයි අද ආමි කෙරේටියන් කියන ක්‍රීඩා සමාජයේ ඉන්නෙ.වාර්ෂික පැවති නගර ක්‍රීඩා තරගාවලියේ වයස අවු.15න් පහළ පා පන්දු තරගවල දස්කම් පෑ දරුවන් අපි පා පන්දු සංචිතයට ඇතුල් කරගෙන පුහුණුවීම් කරගෙන යනවා. නගර ක්‍රීඩා වල අපි වයස අවු.15න් පහළ ක්‍රිකට්, පා පන්දු , මේස පන්දු , දැල් පන්දු ආදි වශයෙන් තරග පවත්වා ඔවුන් අගයමින් රන් ,රිදී,ලෝකඩ ආදි වශයෙන් පදකම්, සහතික ලබා දීමට වර්ණවත් ලෙස උත්සව සංවිධාන කරා. මේ උත්සවල ප්‍රධාන ආරාධිත අමුත්තන් ලෙස ආණ්ඩුකාරවරු පවා සහභාගිවෙලා තියෙනවා. එක තරගාවලියක් පවත්වලා අවු.05කට පස්සේ මම කරන්දෙණිය මධ්‍ය මහ විද්‍යාලයට ගියා. එතනදි මට ලොකු පිළිගැනිමක් තිබුණා. ඒ අවුරුද්දේ ලංකාවේ හොඳම පාසල් ක්‍රිකට් කණ්ඩායම වෙලා තිබුනේ කරන්දෙණිය පාසල් කණ්ඩායම. ඔවුන් හැම අවුරුද්දෙම අපේ තරගාවලියට සහභාගිවෙලා තියෙනවා. ඒක ළමයින්ට ලැබුණ හොඳ පෙර සූදානම් වීමක් කියල තමයි විදුහල්පතිතුමා පැවසුවේ. ඔවුන් අපේ තරගාවලිය අගය කළා.

**ජී.අශෝක කුමාර මහතා- ක්‍රීඩාභූමි උපදේශක**

දිනේෂ් චන්දිමාල්,ෂම්මි අෂානුත් මේ තරගාවලිය දැන් නැත්තෙ මොකද කියල ඇහැව්වා. එයාලත් මෙම තරගාවලියෙන් පන්නරය ලබපු අය.

**ගරු නගර සභා මන්ත්‍රිණී - එච්.ඉනෝකා ක්‍රිෂාන්ති මිය**

අපි මේ අවුරුද්දෙ එම තරගාවලිය කරමු.

**ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව.**

අනෙක් ක්‍රීඩාවලට පහසුකම් නැති නිසා අපි පා පන්දු තරඟාවලියක් පවත්වමු.

**ගරු නගර සභා මන්ත්‍රීණී - එච්.ඉනෝකා ක්‍රිෂාන්ති මිය**

ක්‍රිකට්වලත් දක්ෂ ළමයි ඉන්නවා ඒ නිසා අපි ක්‍රිකට් තරගාවලියකුත් කරමු.

**ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව.**

ක්‍රිකට් තරගාවලියක් සංවිධානය කරන්න කොපමණ වියදමක් දරන්න වේද?

**ජී.අශෝක කුමාර මහතා- ක්‍රීඩාභූමි උපදේශක**

ක්‍රිකට් වලට අනුග්‍රහකත්වයක් සොයා ගන්න පුළුවන්.

**ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව.**

පා පන්දු වලට තමයි අනුග්‍රහකයෝ සොයා ගන්න අමාරු. මම අනුග්‍රාහකත්වයක් ලබා ගන්න උත්සහ කරන්නම්.

**ක්‍රීඩා නිලධාරී කසුන් ගාල්ලගේ මහතා**

ජාතික හා ජාත්‍යන්තර තලයට ගිය අපේ ක්‍රීඩකයෝ අගයමින් අපි දෙසැම්බර් මාසයේ උපහාර උළෙලක් සංවිධානය කරමු.

**ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව.**

අපි නගර ක්‍රීඩා සහතික හා පදක්කම් ප්‍රදානෝත්සවයත් ඉතා වර්ණවත් ලෙස සංවිධානය කරා මේ උත්සවයත් වර්ණවත්ව කරමු.

**ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්.සරත්චන්ද්‍ර ද සිල්වා මහතා.**

අපට ජිම්නාස්ටික් ක්‍රීඩාව පටන් ගන්න බැරිද? මම පාසල් යන කාලේ කරල තියෙනවා. ඒක හැම ක්‍රීඩාවකටම වැදගත්. ස්ථානයක් අවශ්‍යයි.

**ක්‍රීඩා නිලධාරී කසුන් ගාල්ලගේ මහතා**

අමාත්‍යංශයෙන් ගුරුවරයෙකුයි මෙට්‍රස් අරන් දෙන්න පුළුවන්.

**ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව.**

අපේ ධීවර සංකීර්ණයට මොකද වුනේ? ඇයි ඒක ධීවර අමාත්‍යාංශයට දුන්නේ?

බී.ඒ.ධම්මිකා මිය- ලේකම්,අම්බලන්ගොඩ නගර සභාව.

මම ඒ කාලේ හිටියේ නැහැ. ගොනුව පරීක්ෂා කර වාර්තාවක් දෙන්නම්

**ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව.**

අපි වියදම් දරලා නඩත්තු කරපු ගොඩනැඟිල්ලක් ඒක. දැන් ඒක ළමයින්ටත් නැහැ ධීවරයන්ටත් නැහැ. ලිපි ගොනු පරික්ෂා කරල සම්පූර්ණ වාර්තාවක් සභාවට දෙන්න. නැවත අපට පවර ගන්න පුළුවන්ද කියල බලන්න. අශෝක වීරසිංහ මන්ත්‍රීතුමා අපට ලබා දීපු දෙයක්.

**ගරු නගර සභා මන්ත්‍රී ධම්මක කොඩිකාර මහතා.**

කළුවඩුමුල්ල ක්‍රීඩාංගණය අයිති කාටද?

**ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව.**

අපට මේ ගාස්තු පනවල තියෙන්නෙ.

**ගරු නගර සභා මන්ත්‍රී ධම්මක කොඩිකාර මහතා**

**ග්‍රාමණී විද්‍යාලයේ විදුහල්පතිනිය කියනව පාසලට අයිති කියල.**

**ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව.**

සුනාමියෙන් පසු අපට මුදල් ලැබුණ ක්‍රීඩා පිටි සංවර්ධනයට එතකොට තොර ගත්තෙ කළුවඩුමුල්ල පිට්ටනිය.පිට්ටනිය සංවර්ධනය කිරීමට නගර සභාවට පවරන්න වුණා. අමාත්‍ය මණ්ඩල තීරණයකින් තමයි අපට පැවරුවේ.

**ජී.අශෝක කුමාර මහතා- ක්‍රීඩාභූමි උපදේශක**

ක්‍රීඩාපිටිවලට මුරකරුවන් දානවනම් හොඳයි.

**ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව.**

පළාත් නිශ්චිතවලින් පෙර පාසල් සෙල්ලම් මිදුල් සංවර්ධනයට ලැබුණු රු 1000000.00 මුදල කැටැන්තොට පෙර පාසලට දෙන්න. සෙල්ලම් උපකරණ ලොකු අයත් පාවිච්චි කරනවා කියල ගුරුතුමිය පැවසුවා. සෙල්ලම් මිදුල වැටකින් ආවරණය කරන්න.

**ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්ලිව්.ජගත් කුමාර මහතා.**

ඒක වට කරන්න එපා. ගමේ ළමයින්ටත් සෙල්ලම් කරන්න දෙන්න.

**ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව.**

එහෙනම් අවු.15 වැඩි අයට පාවිච්චි කිරිමෙන් වළකින්න කියල දැන්වීමක් ගහන්න.

ස්තූති කථාව - ගරු නගර සභා මන්ත්‍රී සරත් ශ්‍රි ලාල් මැතිතුමා.

ප්‍රදේශයේ දරු දැරියන්ගේ ක්‍රීඩා කුසලතා නැංවීමේ අරමුණින් අද දින ක්‍රීඩා කමිටුවට පැමිණි සියළු දෙනාටම ස්තූතිය පුදකර සිටිනවා.

සකස් කලේ-ආර්.ඩබ්ලිව්.ඩී.මල්කාන්ති
සංවර්ධන නිලධාරි.

**ඒ අනුව 2018 -04- 23 දින පවත්වන ලද ක්‍රීඩා කමිටු වාර්තාව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

**තාක්ෂණ සේවා නිලධාරී මහත්මය මේ කමිටු වාර්තා වල ඇස්තමේන්තු හදන ඒව තියෙනව නම් ඒව ලබා දෙන්න.**

## (07) ටෙන්ඩර් හා මිළ ගණන්

**7:1** ටෙන්ඩර් **(-** නැත

**7:2** **මිළ ගණන් (-**

**7:2:1** ගබඩාවට අවශ්‍ය ලිපිද්‍රව්‍ය සඳහා මිළ ගණන් කැඳවන ලද අතර තාක්ෂණ සේවා නිළධාරීගේ නිර්දේශය මත රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව ඉදිරිපත් කර ඇති මිළ ගණන පිළිගැනීමට ගරු සභාව තීරණය කරන ලදී.

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව එකක් තොගය | | |
|---|---|---|---|---|---|
| 01 | කම්පියුටර් ෂීට් පැකට් (වැටුප් සැකසීමට භාවිතා කරනු ලබන) | 10 | 900/- | | |
| 02 | ෆැක්ස් රෝල් | 25 | 168/- | | |
| 03 | පෑඩ් ඉන්ක් බෝතල් | 12 | 45/- | | |
| 04 | නෝට් බුක් | 25 | 50/- | | |

**7:2:2** ලෑන්ඩ් මාස්ටරයට අවශ්‍ය ටයර් ටියුබ් සදහා මිළ ගණන් කැඳවන ලද අතර තාක්ෂණ සේවා නිළධාරීගේ නිර්දේශය මත සී/ස ශ්‍රී ලංකා රජයේ විවිධ නීතිගත සංස්ථාව ඉදිරිපත් කර ඇති මිළ ගණන පිළිගැනීමට ගරු සභාව තීරණය කරන ලදී.

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | සී/ස ශ්‍රී ලංකා රජයේ වානිජ්‍ය විවිධ නීතිගත සංස්ථාව එකක් තොගය | | |
|---|---|---|---|---|---|
| **01** | **500 X 12** ටයර් | **02** | **5500/-**<br>**vat 825/-** | | |
| **02** | **500 X 12** ටියුබ් | **02** | **620/-**<br>**Vat 93/-** | | |

**7:2:3** පැස්සුම්කරුගේ ආරක්ෂිත පැළඳුම් මිලදී ගැනීම සඳහා මිළ ගණන් කැඳවන ලද අතර තාක්ෂණ සේවා නිළධාරීගේ නිර්දේශය මත සී/ස ශ්‍රී ලංකා රජයේ විවිධ නීතිගත සංස්ථාව ඉදිරිපත් කර ඇති මිළ ගණන පිළිගැනීමට ගරු සභාව තීරණය කරන ලදී.

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | සී/ස ශ්‍රී ලංකා රජයේ වානිජ්‍ය විවිධ නීතිගත සංස්ථාව එකක් තොගය | | |
|---|---|---|---|---|---|
| **01** | ආරක්ෂිත ග්ලවුස් | | **739.13**<br>**vat 110.57** | | |
| **02** | ආරක්ෂිත පාවහන් | | **4400/-** | | |

**7:2:4** පිරිසිදු කාරක ද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා මිළ ගණන් කැඳවන ලද අතර තාක්ෂණ සේවා නිළධාරීගේ නිර්දේශය මත අ.වි.සේ.ස. සමිතිය ඉදිරිපත් කර ඇති මිළ ගණන පිළිගැනීමට ගරු සභාව තීරණය කරන ලදී.

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | අ.වි.සේ.ස. සමිතිය එකක් තොගය | | |
|---|---|---|---|---|---|
| **01** | සබන් | **500** | **53/-** | | |
| **02** | හාපික් බෝතල් | **50** | **165/-** | | |
| **03** | පීනොල් | **25** | **165/-** | **-** | |

7:2:5 විදුලි උපකරණ මිලදී ගැනීම සඳහා මිළ ගණන් කැඳවන ලද අතර තාක්ෂණ සේවා නිළධාරීගේ නිර්දේශය මත ඉදිරිපත් කර ඇති මිළ ගණන් අතරින් අවම මිළ ගණන් ඉදිරිපත් කර ඇති පූර්ණ හාඩ්වෙයාර් ආයතනයේ මිළ ගණන් පිළිගැනීමට ගරු සභාව තීරණය කරන ලදී.

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | ජෙනරල් ස්ටෝර්ස් එකක් තොගය | පූර්ණ වෙළඳ සැල එකක් තොගය | ශෂී ඉලෙක්ට්‍රිකල්ස් එකක් තොගය |
|---|---|---|---|---|---|
| 01 | දුඹුරු පාට 1/044 වයර් රෝල් | 04 | 1650/- | 1650/- | 1600/- |
| 02 | ප්ලග් බේස් 5 Am | 20 | 375/- | 120/- | 370/- |
| 03 | ප්ලග් බේස් 13 Am | 20 | 400/- | 400/- | 400/- |
| 04 | චෝක් කොයිල් 40W | 20 | 195/- | 225/- | 220/- |
| 05 | 7053 වයර් රෝල් | 02 | 7750/- | 6800/- | 7000/- |
| 06 | බීගන් බල්බ් | 03 | - | - | 7500/- |
| 07 | චෝක් 125A | 50 | - | - | 1200/- |
| 08 | අර්ත් වයර් රෝල් | 02 | 4300/- | 4600/- | 4500/- |
| 09 | මර්කරි හෝල්ඩර් 12500 | 100 | - | - | 150/- |
| 10 | 1/044 නිල්පාට වයර් රෝල් | 04 | 1650/- | 1650/- | 1600/- |
| 11 | මර්කරි බල්බ් (ඔස්රම්)<br>1/044 වයර් (නිල්/දුඹුරු) | | - | -<br>1550/- | 600/- |

7:2:6 ආදාහනාගාරයට අවශ්‍ය ගෑස් මිලදී ගැනීම සඳහා මිළ ගණන් කැඳවන ලද අතර තාක්ෂණ සේවා නිළධාරීගේ නිර්දේශය මත ඉදිරිපත් කර ඇති මිල ගණන රජයේ පිළිගත් මිලට වඩා අඩු මිලක් බැවින් මිළිඳු එන්ටර්ප්‍රයිසස් ආයතනය විසින් ඉදිරිපත් කර ඇති මිළ ගණන පිළිගැනීමට ගරු සභාව තීරණය කරන ලදී.

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | මිළිඳු එන්ටර්ප්‍රයිසස් | | |
|---|---|---|---|---|---|
| 01 | ආදාහනාගාර සඳහා 37.5 ගෑස් සිලින්ඩර | 37.5kg | 5445/- | | |
| | | | | | |

**7:2:7** **ඉදල්, කොසු හා බ්‍රෂ් මිලදී ගැනීම සඳහා මිළ ගණන් කැඳවන ලද අතර තාක්ෂණ සේවා නිළධාරීගේ නිර්දේශය මත ඉදිරිපත් කර ඇති මිළ ගණන් අතරින් අවම මිළ ගණන් ඉදිරිපත් කර ඇති ශ්‍රියා ඉන්ඩස්ට්‍රීස් ආයතනයේ මිළ ගණන් පිළිගැනීමට ගරු සභාව තීරණය කරන ලදී.**

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | නයන රංජන සේල් පොළ | පූර්ණා වෙළඳ සැල | ශ්‍රියා ඉන්ඩස්ට්‍රීස් |
|---|---|---|---|---|---|
| **01** | **ඉදල්** | **100** | **130/-** | **130/-** | **100/-** |
| **02** | **කොසු** | **100** | **130/-** | **130/-** | **100/-** |
| **03** | **බ්‍රෂ් (ටොයිලට් සඳහා)** | **06** | **80/-** | **65/-** | **55/-** |

**(08)** **ගෙවීම්**

8. 1 මුද්දර බදු වශයෙන් රු. 21403.33 ක මුදලක් දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ගෙවීමට ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැතිවූ බැවින් එම මුදල ගෙවීම සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8. 2 දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත රු. 36100.53 ක මුදලක් NBT ප්‍රේෂණය කිරීමට ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැතිවූ බැවින් එම මුදල ගෙවීම සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8. 3 පැරණි ස.තො.ස. ගොඩනැගිල්ලේ කඩ කාමර අංක 3 බී හි වහලය පිළිසකර කිරීම වෙනුවෙන් ගාස්තුව වන රු. 14210.00 ක මුදල කඩ කුලියට හිලව් කිරීම සඳහා ගරු සභාවේ අනුමැතිය ලබා දෙන ලෙස ඉල්ලා තිබුණි.

<u>ගරු නගර සභා මන්ත්‍රී එම්. ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා කතා කරමින්</u>

සභාපතිතුමනි මේකෙ වැඩේ හරියට කෙරිල තියෙනවද? ගෙවීමට ටී.ඕ. මහත්තය නිර්දේශ කරල තියෙනවද?

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

කඩ හිමියා විසින් ලිපියක් ඉදිරිපත් කරල තියෙනවා සුළං නිසා ෂීට් 6 ක් කැඩුන බවත් එය පිළිසකර කිරීමට රු. 14210/- ක මුදලක් වැයවූ බවත් එය කඩකුලී සඳහා හිලව් කිරීමට තමයි අවසර ඉල්ලා තියෙන්නෙ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එම්. ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා කතා කරමින්</u>**

සභාපතිතුමනි කඩ කාමර දෙනකොට ගිවිසුමේ තියෙනවද දන්නෙනෑ මොනවහරි වුනොත් තමන් පිළිසකර කර ගන්න බවට.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දූවගේ මහතා කතා කරමින්</u>**

සභාපතිතුමනි තව ප්‍රශ්නයක් තියෙනවා. කඩ හිමියා දහ හතරදාස් ගානක බිල් ඉදිරිපත් කරලා හැදුවා කියලා අපි ගෙවනවා. ඊළග කෙනත් කියන්න පුළුවන් මට 34000 ගානක් ගියයි කියලා. මෙහෙම දෙයක් වුනහම නගර සභාවෙ ටී.ඕ. කෙනෙක් අනුමත කරන්න ඕනෙ මෙහෙම මුදලක් යනවා කියලා. නැතුව එයාට ඕන තැන්වලින් වුඩේ කරල බිල් ඉදිරිපත් කරල නගර සභාවෙන් ගෙවනවට අපි සම්පූර්ණෙන් විරුද්ධයි. අනිත් එක ගිවිසුමේ තියෙන්න ඕනෙ ස්වාභාවික දෙයකින් වන හානියක් සඳහා කොහොමද කටයුතු කරන්නෙ කියලා. ඊළග සභා වාරෙදි මන්ත්‍රීවරුන් ඒ ගිවිසුම් පිළිබඳව දැනුවත් කරන්න කියල මම ලේකම්තුමියගෙන් ඉල්ලා සිටිනවා.

***<u>තීරණය</u>***

මෙම කඩ කාමරයට අදාල ගිවිසුම සමග ඊලග සභා වාරයට ඉදිරිපත් කර තීරණයක් ගැනීම සුදුසු බවට ගරු සභාව විසින් තීරණය කරන ලදී.

8. 4 අම්බලන්ගොඩ නගර සභාව මගින් පාලනය වන පුස්තකාල සඳහා 2018 මාර්තු මාසය සඳහා සපයන ලද පුවත්පත් වෙනුවෙන් රු. 45675.00 ක මුදලක් එම්. එස්. වීරසිංහ මහතා වෙත ගෙවීමට ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැතිවූ බැවින් එම මුදල ගෙවීම සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8. 5 සභාව සතු සියළුම වාහන හා යන්ත්‍රෝපකරණ සඳහා 2018 මාර්තු මාසය වෙනුවෙන් රු. 201885.00 ක මුදලක් සී/ස අම්බලන්ගොඩ විවිධ සේවා සමුපකාර සමිතිය වෙත ගෙවීමට ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැතිවූ බැවින් එම මුදල ගෙවීම සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

සභාපතිතුමනි මේ වාහන සම්බන්ධ ගෙවීම් ඊලග සභාවෙ ඉදලා වාහනෙන් වාහනේට වෙන වෙනම ඉදිරිපත් කරන්න කියලා ඉල්ලා සිටිනවා.

8. 6 වොට් 125 මර්කරි චෝක් ලබා ගැනීම වෙනුවෙන් රු. 23750.00 ක මුදලක් සී/ස ශ්‍රී ලංකා රජයේ වානිජ්‍ය (විවිධ) නීතිගත සංස්ථාව වෙත ගෙවීමට ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැතිවූ බැවින් එම මුදල ගෙවීම සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එම්. ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා කතා කරමින්</u>**

සභාපතිතුමනි ඒවගෙත් දිනෙයි වවුචර් අංකය දාන්න ඕනෙ අපිට දැනගන්න. මේකෙ මුකුත්ම නැහැ.

**<u>ගරු සභාපති එම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ලේකම්තුමියට කියන්න ඕනෙ පසුගිය අවු 3 ක කාලෙ තුල මේව ඔක්කොම වෙනස් වෙලා. කලින් මේව හොදට තිබුනා. දැන් හොද දේවල් ටික ටික අයින් කරලා. ඊලග සභාවෙදි මේ වැරදි හදාගන්න.

8. 7 ගිණුම් අංශය හා වරිපනම් අංශය වයරින් වැඩ කිරීම වෙනුවෙන් රු. 20200.00 ක මුදලක් වානක එන්ටර්ප්‍රයිසස් ආයතනය වෙත ගෙවීමට ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැතිවූ බැවින් එම මුදල ගෙවීම සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8. 8 නිදහස් දුම්රිය බලපත්‍ර ලබා ගැනීම වෙනුවෙන් රු. 13050.00 ක මුදලක් ප්‍රධාන දුම්රිය ගණකාධිකාරී වෙත ගෙවීමට ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැතිවූ බැවින් එම මුදල ගෙවීම සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8. 9 සභාපතිතුමා ප්‍රමුඛ මන්ත්‍රීවරුන් සඳහා නාම පුවරු සැකසීම වෙනුවෙන් රු. 20475.00 ක මුදලක් ඩයමන්ඩ් ඇඩ්වටයිසින් ආයතනය වෙත ගෙවීමට ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැතිවූ බැවින් එම මුදල ගෙවීම සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8. 10 නගර සභා ක්‍රීඩාංගණයේ ක්‍රීඩාගාරයේ වහල අළුත්වැඩියාව සඳහා සින්ක් ඇළුමිනියම් තහඩු ලබා ගැනීම වෙනුවෙන් රු. 381936.00 ක මුදලක් සුමාල් කළුතර වෙත ගෙවීමට ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැතිවූ බැවින් එම මුදල ගෙවීම සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එම්. ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා කතා කරමින්</u>**

සභාපතිතුමනි ඒ තහඩු අරගත්ත ඒවගෙ දින වකවානු හරියට බලන්න. මොකද ටෙන්ඩර් කමිටුව තියන්න කලින්ද දන්නෑ මේව ගෙනාවෙ. ඒ නිසා පොඩ්ඩක් බලන්න කියලා ඉල්ලා සිටිනවා.

8. 11 ආදාහනාගාරයට ගෑස් ලබා ගැනීම වෙනුවෙන් රු. 43,520.00 ක මුදලක් මිළිඳු එන්ටර්ප්‍රයිසස් වෙත ගෙවීමට ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැතිවූ බැවින් එම මුදල ගෙවීම සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8. 12 ඇණවුම් අංක 1833 - 2018.04.25 මඟින් මහජන ක්‍රීඩාංගනයේ වහල අලුත්වැඩියාවට අවශ්‍ය දැව ලබා ගැනීම වෙනුවෙන් රාජ්‍ය දැව සංස්ථාව වෙත රු. 25,127.46 ක් ගෙවීමට සභාවේ ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැතිවූ බැවින් එම මුදල ගෙවීම සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8. 13 සභාව සතු ස්ථාන සඳහා 2018 ජනවාරි ජල සැපයුම් වෙනුවෙන් ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය වෙත ගෙවිය යුතු රු. 30,717.43 ක මුදල ගෙවීමට ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැතිවූ බැවින් එම මුදල ගෙවීම සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8. 14 උපමාන පාදක සංවර්ධන ප්‍රධාන 2016 යටතේ 2016 පෝරොක් ඇල ප්‍රතිසංස්කරණය කිරීමේ කර්මාන්තය 10% රඳවුම් මුදල වන රු. 141,294.80. ක මුදල ගෙවීමට ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැතිවූ බැවින් එම මුදල ගෙවීම සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

**(09) ගිණුම්**

**9.1** 2018 ජනවාරි මාසයට අදාල පොදු ගිණුම- වියදම් වැය විශ්ලේෂණය හා 2018 ජනවාරි මස වියදම් වාර්තාව පිළිගත යුතු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කරන ලද අතර ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරම්ණියගේ මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**9.**2 2018 පෙබරවාරි මාසයට අදාල පොදු ගිණුම- වියදම් වැය විශ්ලේෂණය හා 2018 පෙබරවාරි මස වියදම් වාර්තාව පිළිගත යුතු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කරන ලද අතර ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරම්ණියගේ මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**(10)** weia;fïka;=

10:1) හල්වතුර මාර්ගයේ බෝක්කුව ඉදිකිරීමට අදාල තාක්ෂණ සේවා නිළධාරී විසින් සකස් කරන ලද රු. 415,741.71 ක් වූ සංශෝධිත ඇස්තමේන්තුව සභාගත කරන ලදී.

<u>තීරණය</u>

☞ **මෙම ඇස්තමේන්තුව පිළිගතයුතු බව ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරම්ණියගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ඒකමතිකව සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

10:2) අම්බලන්ගොඩ නගර සභා පිට්ටනියේ කාණුව සකස් කිරීමට අදාල තාක්ෂණ සේවා නිළධාරී විසින් සකස් කරන ලද රු. 800,723.10 ක් වූ සංශෝධිත ඇස්තමේන්තුව සභාගත කරන ලදී.

<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්</u>

සභාපතිතුමනි මේක කලින් කරේ මොකක්ද එතකොට?

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

මේක අනික් පැත්ත කාණුව.

**<u>තීරණය</u>**

☞ **මෙම ඇස්තමේන්තුව පිළිගතයුතු බව ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඩී. ධර්මදාස මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ඒකමතිකව සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

10:3) ඕකන්ද පොදු නාන ළිඳ සකස් කිරීම සඳහා තාක්ෂණ සේවා නිළධාරී විසින් සකස් කරන ලද රු.890,000.00 ක් වූ ඇස්තමේන්තුව සභාගත කරන ලදී.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එම්. ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා කතා කරමින්</u>**

සභාපතිතුමනි ළිං දෙකක් තියෙනවා. ඔය මොන ළිඳද?

**<u>ගරු නගර සභා මන්ත්‍රී ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>**

සභාපතිතුමනි අතුරු ප්‍රශ්නයක් මේක. මේ මිල ගනන් වගයක් තියෙනවා ගෑස් වලට ඇවිත් තියෙන්නෙ එක මිල ගණනයි. අපිට ඒක අත්සන් කරන්න පුළුවන්ද?

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ඕනම මිළ ගණනක් අත්සන් කරන්න. තීන්දු කිරීම සභාවෙන් කරතහැකි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා කතා කරමින්</u>**

සභාපතිතුමනි මේ ළිඳ සකස් කරන එක අත්‍යාවශ්‍ය දෙයක්ද? ඕකන්ද ප්‍රදේශයට මීට වඩා දෙයක් මේ මුදලින් කරන්න පුළුවන් නේද?

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්</u>**

සභාපතිතුමනි ඕකන්දට ජල ප්‍රශ්නය වැඩිපුරම තියෙනවා. ඒක නිසා මේ ළිඳ අත්‍යාවශ්‍ය දෙයක්.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මේ ළිඳ තිබුන විදියටම හදන්න බැරිද?

**<u>ගරු නගර සභා මන්ත්‍රී ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>**

සභාපතිතුමනි දැන් ඒ විදියට කරන්න බැහැ. පස බුරුල් සහිත වෙලා තියෙන්නෙ. එකම ක්‍රමය තියෙන්නෙ සිලින්ඩර් දාල හිම්හිට බස්සන්න තියෙන්නෙ. සෑහෙන්න අමාරු වැඩක් ඒක.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මේක හදන්න යාමෙන් අනික් ටිකත් කඩාගෙන වැටෙයිද?

**<u>ගරු නගර සභා මන්ත්‍රී ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>**

සභාපතිතුමනි හෙමින් හෙමින් තමයි මේක කරන්න වෙන්නෙ.

**<u>තීරණය</u>**

☞ **මෙම ඇස්තමේන්තුව පිළිගතයුතු බව ගරු සභාපති ඇම්.ඩබ් .අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ධම්මික කොඩිකාර මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ඒකමතිකව සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**(11)** fjk;a lreKq

**11:1** **' දකුණු පළාතේ නගර සභා වල සභාපති, උප සභාපති හා සභිකයන් සදහා වන ගමන් වියදම් දීමනාව '** මැයෙන් දකුණු පළාතේ ප්‍රධාන අමාත්‍ය ගුස්තිඤ්ඤාවඩු ෂාන් විජයලාල් ද සිල්වා මැතිතුමා විසින් පනවන ලද රීති ඇතුලත් ගැසට් පත්‍රය සභාගත කරන ලදී.

යම් නගර සභාවක සභාපති, උප සභාපති හා සභිකයන්ට සභාව විසින් පවරන කාර්යයන් සදහා ස්වකීය වාහනයෙන් හෝ පොදු වාහනයෙන් ගමන් කිරිමේදී යනු ලබන වියදම් ප්‍රතිපූර්ණය කිරීමක් ලෙස මසකට රු. 3000/- ක උපරිමයකට යටත්ව ගමන් වියදම් දීමනාවක් ගෙවනු ලැබිය හැකි බවත් එමේ ගෙවනු ලබන්නේ ස්වකීය යතුරු පැදිය, ත්‍රීරෝද රථය, මෝටර් රථය නොවේ නම් පහත ලියවිලි ඉදිරිපත් කල යුතු බවත්

අදාල වාහනයේ ලියාපදිංචි සහතිකයේ සහතික කල පිටපත, වාර්ෂික ආදායම් බලපත්‍රයේ සහතික කල පිටපත, වලංගු රක්ෂණ සහතික පිටපත, හිමිකරු විසින් වාහනය පාවිච්චිය සදහා අවසර දෙමින් ඉදිරිපත් කර ඇති දිව්රුම් ප්‍රකාශය, ගමන් වියදම් ලබා දීමේදී ඉන්දන වියදම් බිල්පත් හා පොදු වාහනයක ගමන් කලේ නම් ඊට අදාල බිල්පත් ඉදිරිපත් කිරීම කල යුතුය. ගමන් වියදම් දීමනාව ගෙවීමට පෙර සභාවේ අනුමැතිය ලබා ගත යුතු බවත් එ සදහා වාර්ෂික අයවැය ලේඛනයේ ප්‍රතිපාදන සලසා ගත යුතු බවත් දන්වා තිබුණි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දූවගේ මහතා කතා කරමින්</u>**

මගේ පුද්ගලික මතය නම් සභාපතිතුමා අපි ඔක්කොම නගරෙ පුරවැසියො. මහජන ඡන්දෙන් තේරී පත්වුන අය. ඒ මුදල සභාවෙ සල්ලි වලින් අපිට ලැබෙනව නම් අපි ඒක ලබා ගැනීමට විරුද්ධයි කියල මම යෝජනා කරනවා.

**ගරු නගර සභා මන්ත්‍රී ඒ. ජී. ලක්ෂ්මි හේමන්තා ද සිල්වා මෙනවිය කතා කරමින්**

සභාපතිතුමනි අපි එක දවසයි මෙතෙන්ට රැස් වෙන්නෙ. අපි නගරයේ දියුණුව ගැන හිතමින් මම ඒ පිලිබදව ඉල්ලීමක් කරන්නෙ නැහැ. සභාවෙන් ගෙවීම් කරන නිසා මම අකමැතියි කියා ප්‍රකාශ කරනවා.

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

මට මතක අපි පසුගිය සභාවෙත් අරගෙන නැහැ.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

රු. 1500/- ක් ගෙව්වා.

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

අපි ගත්තෙ නැහැ. මම හිතන්නෙ සභාපතිතුමා සභාවට ලොකු පිරිවැයක් දරන්න වෙනවා මේකට. ඒ නිසා මේක අවශ්‍ය නැහැයි කියල මම ප්‍රකාශ කරනවා.

**ගරු නගර සභා මන්ත්‍රී එම්. ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා කතා කරමින්**

නගර සභා මුදලින් ගෙවන නිසා මේක අවශ්‍ය නැහැ සභාපතිතුමනි.

**ගරු නගර සභා මන්ත්‍රී කේ.ජී.පී. දයානන්ද මහතා කතා කරමින්**

ප්‍රතිපත්තියක් හැටියට අපේ පක්ෂයේ මන්ත්‍රීවරුනුත් ගමන් වියදම් ලබා ගැනිමට විරුද්ධයි.

**ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්**

නවක මන්ත්‍රීවරු වශයෙන් අපිත් කියනවා මෙය අනවශ්‍යයි කියලා. එය සභාවේ දියුණුව සඳහා යොදවා ගන්න.

**තීරණය**

☞ **මෙම ලිපිය සම්බන්ධව සියළුම මන්ත්‍රීතුමන්ලාගේ අදහස් විමසා ඊලග සභා වාරයේදී නැවත සලකා බැලීමට සභාව තීරණය කරන ලදී.**

**11:2** **‘ උඩු මහලේ පැවති පරිගණක ජාල පද්ධතිය පහත මාලයට ස්ථාපිත කිරීම ’** මැයෙන් තොරතුරු සන්නිවේදන තාක්ෂණ සහකාර විසින් ඉදිරිපත් කර තිබූ ලිපිය සභාගත කරන ලදී.

ඉහල මාලයේ භාවිතා කරන ලද පරිගණක ජාල පද්ධතියේ භාවිතා කල හැකි සියළු උපාංග පහත මාලයේ සවි කිරීම සිදු කිරීමටත් භාවිතයට ගත නොහැකි උපාංග වෙනුවට නව උපාංග පැරණි මිල ගණන් යටතේම ලබාගෙන පහත මාලයේ පරිගණක ජාල පද්ධතිය ස්ථාපිත කිරීමටත් අනුමැතිය ලබා දෙන ලෙස ඉල්ලා තිබුණි.

<u>තීරණය</u>

☞ **උඩු මහලේ පැවති පරිගණක ජාල පද්ධතිය පහත මාලයට ස්ථාපිත කිරීමටත් අළුතින් මිලදී ගන්නා උපාංග පැරණි මිළ ගණන් යටතේම ලබාගැනීම සඳහාත් ගරු සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**11:3** **‘ 2017-12-31දිනට පවත්වන ලද භාණ්ඩ සමීක්ෂණයට අදාලව වෙන්දේසි කළ යුතු භාණ්ඩ වෙන්දේසි කිරීම සඳහා මණ්ඩලයක් පත් කිරීම ’** මැයෙන් අභ්‍යන්තර විගණන නිලධාරී විසින් ඉදිරිපත් කර තිබූ ලිපි ගොනුව සභාගත කරන ලදී.

2017-12-31 දිනට පවත්වන ලද ගබඩා භාණ්ඩ හා ඉන්වෙන්ට්‍රි භාණ්ඩ සමීක්ෂණයට අදාලව වෙන්දේසි කල යුතු භාණ්ඩ වෙන්දේසි කිරීම සඳහා මූල්‍ය හා ප්‍රතිපත්ති කමිටුවේ නිර්දේශ ලැබී ඇති බවත් එම වෙන්දේසිය 2018-05-22 දින පෙ.ව. 10.00 ට පැවැත්වෙන බවත් ඒ සඳහා 9 දෙනෙකුගෙන් යුත් නිලධාරී මණ්ඩලයක් පත් කර ඇති බවත් ඒ සඳහා ගරු මන්ත්‍රීවරුන් තිදෙනෙක් ද පත් කරන ලෙසත් ඉල්ලා තිබුණි.

<u>තීරණය</u>

☞ 2018-05-22 දින පෙ.ව. 10.00 ට පැවැත්වෙන භාණ්ඩ වෙන්දේසිය සිදු කිරීම සඳහාත්, පත් කරන ලද නිලධාරී මණ්ඩලය සඳහාත් සභාවේ අනුමැතිය ලබා දෙන ලදී. සභාවේ නියෝජනය ලෙස ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා, ගරු නගර සභා මන්ත්‍රී අතුල ප්‍රියන්ත මහතා, ගරු නගර සභා මන්ත්‍රී කේ.ජී.පී. දයානන්ද මහතා යන අය සුදුසු බවට ගරු සභාපති එම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්. ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**11:4** **‘ 2017-12-31දිනට පවත්වන ලද භාණ්ඩ සමීක්ෂණයට අදාලව විනාශ කළ යුතු භාණ්ඩ විනාශ කිරීම සඳහා මණ්ඩලයක් පත් කිරීම ’** මැයෙන් අභ්‍යන්තර විගණන නිලධාරී විසින් ඉදිරිපත් කර තිබූ ලිපි ගොනුව සභාගත කරන ලදී.

2017-12-31 දිනට පවත්වන ලද ගබඩා භාණ්ඩ හා ඉන්වෙන්ට්‍රි භාණ්ඩ සමීක්ෂණයට අදාලව විනාශ කල යුතු භාණ්ඩ විනාශ කිරීම සඳහා මූල්‍ය හා ප්‍රතිපත්ති කමිටුවේ නිර්දේශ ලැබී ඇති බවත් එම විනාශ කිරීම් කටයුතු 2018-05-22 දින ප.ව. 3.00 ට පැවැත්වෙන බවත් ඒ සඳහා 8 දෙනෙකුගෙන් යුත් නිලධාරී මණ්ඩලයක් පත් කර ඇති බවත් ඒ සඳහා ගරු මන්ත්‍රීවරුන් තිදෙනෙක් ද පත් කරන ලෙසත් ඉල්ලා තිබුණි.

**<u>තීරණය</u>**

☞ 2018-05-22 දින ප.ව. 3.00 ට පැවැත්වෙන භාණ්ඩ විනාශ කිරීම සිදු කිරීම සඳහාත්, පත් කරන ලද නිලධාරී මණ්ඩලය සඳහාත් සභාවේ අනුමැතිය ලබා දෙන ලදී. සභාවේ නියෝජනය ලෙස ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා, ගරු නගර සභා මන්ත්‍රී එම්.ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා, ගරු නගර සභා මන්ත්‍රී කේ.ජී.පී. දයානන්ද මහතා යන අය සුදුසු බවට ගරු සභාපති එම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්. ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**11:5** **' LF – 1853 ටිපර් රථය සම්බන්ධවයි '** මැයෙන් විෂය ලිපිකරු විසින් ඉදිරිපත් කර තිබූ ලිපිය සභාගත කරන ලදී.

LF – 1853 **අංක දරණ ටිපර් රථය මේ වන විට ධාවන තත්වයේ නොපවතින බවත් මෙම රථය සභාවේ වැඩ කටයුතු සඳහා අත්‍යාවශ්‍ය බවත් මීට පෙරද මෙම රථය අළුත්වැඩියා සඳහා යෝජිත ඇස්තමේන්තුව වන රු. 1541000/- ක මුදල දකුණු පළාත් යාන්ත්‍රික ඉංජිනේරු මහතා වෙත යොමු කර අනුමත කර ඇතත් මේ වන තුරු අළුත්වැඩියා කටයුතු සිදු කර නොමැති බවත් මෙම ටිපර් රථය ඉතා ඉක්මනින් අළුත්වැඩියා කල යුතු බැවින් ඒ සඳහා අවශ්‍ය අනුමැතිය ලබා දෙන ලෙසත් ඉල්ලා තිබුණි.**

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

සභාපතිතුමනි මේක අබලන් වෙලා තියෙන්නේ. මමත් බැලුවා. මේකට අනුමැතිය අරගෙන ජපන් මූණක් තිබ්බනම් ලක්ෂ 6 කින් විතර හදාගන්න තිබ්බ. ලක්ෂ 15 ක් 16 ක් වියදම් කරනවට වඩා. එතකොට වාහනේ දිරනවත් අඩුයි. ඕකෙ වෙ වෙනම දීල තියෙනවා ඇස්තමේන්තුව. ඒකයි ලොකු මුදලක් ආවෙ. එනිසා සභාපතිතුමා මූණක් තිබ්බනම් හොඳයි කියන එකයි මගේ අදහස.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ආර්.එම්. ලසන්ත අජිත් කුමාර මහතා කතා කරමින්</u>**

සභාපතිතුමා ඕකට පොඩි මූණක් තියල හරියන්නෑ. වාහනේ උසයිනේ. ලොකු මූණක් තියන්න වෙනවා. එතකොට ලක්ෂ 6 කින් කරන්න අමාරුයි.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ලක්ෂ 15 ක් වියදම් වෙනදේ ලක්ෂ 7 කින් 8 කින් කරන් පුළුවන් නම් හොදයි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා කතා කරමින්</u>**

සභාපතිතුමනි ටාටා සමාගමෙන් මේ වාහනය රෙපයාර් කිරීම සඳහා යන වියදම ඇස්තමේන්තුවක් ගත්තනම් හොදයි.

**<u>තීරණය</u>**

☞ LF – 1853 **අංක දරණ ටිපර් රථය ජපන් මූණක් (කැබ් එකක්) තබා අළුත්වැඩියා කිරීම දකුණු පළාත් යාන්ත්‍රික ඉංජිනේරු මහතාගේ නිර්දේශය ලබාගෙන සිදු කිරීම සුදුසු බවට ගරු සභාව විසින් තීරණය කරන ලදී.**

**11:6** **‘ අම්බලන්ගොඩ නගර සභා කාර්යාල ගොඩනැගිල්ල අබලන්වීම සම්බන්ධව තත්ත්ව පරීක්ෂණ වාර්තාවක් ලබා ගැනීම ’** මැයෙන් ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ අධ්‍යක්ෂතුමා විසින් එවා තිබූ ලිපිය සභාගත කරන ලදී.

නගර සභා කාර්යාල ගොඩනැගිල්ල පිළිබද තතත්ත්ව පරීක්ෂණ වාර්තාව සැකසීම සඳහා පූර්ව ක්ෂේත්‍ර පරීක්ෂණයක් කල යුතු බවත් ඒ සඳහා රු. 42814.50ක මුදලක් වැය වන බවත් එම මුදල ගෙවීමෙන් පසුව ගොඩනැගිල්ල පරීක්ෂා කොට වාර්තාව සැකසීමේ කටයුතු ආරම්භ කල හැකි බවත් ක්ෂේත්‍ර පරීක්ෂණයෙන් අනතුරුව යම් යම් කරුණු තහවුරු කර ගැනීම සඳහා තවදුරටත් ක්ෂේත්‍ර පරීක්ෂණ හෝ විද්‍යාගාර පරීක්ෂණ වාර්තා ලබා ගැනීමට අවශ්‍ය විය හැකි බවත් ඒ සඳහා වන වියදම් ඇස්තමේන්තු ඉහත මුදලෙහි ඇතුලත් නොවන බවත් ඒ සඳහා වන මුදල ක්ෂේත්‍ර පරීක්ෂණයෙන් පසුව ලිඛිතව දැනුම් දෙනු ලබන බවත් දන්වා තිබුණි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දූවගේ මහතා කතා කරමින්</u>**

සභාපතිතුමා ඔය මුදල වගේ නෙමෙයි එතකොට අපිට වගකීමක් තියෙනවා. සල්ලි ගියාට කමක් නැහැ. අපි ඒ වාර්තාව අරගෙන වැඩ කරමු.

**<u>තීරණය</u>**

☞ ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය මගින් අම්බලන්ගෙඩ නගර සභා කාර්යාලය සම්බන්ධයෙන් තත්ත්ව පරීක්ෂණ වාර්තාවක් ලබා ගැනීම වෙනුවෙන් රු. 42814.50 ක මුදලක් ගෙවා සුදුසු බවට ගරු සභාපති එම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්. ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**11:7 ' වතුර බවුසරය නොමිලේ ලබා ගැනීම සඳහා අවසර ඉල්ලීම '** මැයෙන් සී ඩ්‍රැගන්ස් බෞද්ධ සමිතියේ ලේකම්තුමා විසින් එවා තිබූ ලිපිය සභාගත කරන ලදී.

වෙසක් තොරණට ආධාර ලබා ගැනීම සඳහා පැවැත්වෙන විනෝද ක්‍රීඩා සඳහා අවශ්‍ය වතුර ගෙන ඒම සඳහා වතුර බවුසරය මුදල් අය කිරීමකින් තොරව ලබා දෙන ලෙසත් තවද මෙම තොරණ සඳහා රු. 1600000/- ක් පමණ මුදලක් වැය වන බවත් එම මුදල පියවා ගනු ලබන්නේ මෙම ක්‍රීඩා වලින් ලැබෙන ආදායමින් බැවින් එයින් ලැබෙන මුදල් විනෝද බද්දෙන් නිදහස් කර දෙන ලෙසත් ඉල්ලා තිබුණි.

<u>**තීරණය**</u>

☞ සී ඩ්‍රැගන්ස් බෞද්ධ සිමිතිය විසින් වෙසක් තොරණ සඳහා ආධාර ලබා ගැනීමට පැවැත්වෙන විනෝද ක්‍රීඩා සඳහා වතුර බවුසරය මුදල් අයකිරීමකින් තොරව ලබා දීම සඳහා කරන ලද කරන ලද ඉල්ලීම සහා අනුමැතියට යටත්ව අවසරය ලබා දීම වෙනුවෙන් ගරු මන්ත්‍රීවරුන්ගේ විරුද්ධත්වයක් නොමැති වූ බැවින් ඒ සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලද අතර ඉන්ධන තමන් විසින් සපයා ගත යුතු බවට තීරණය කරන ලදී. විනෝද ක්‍රීඩා වලින් ලැබෙන ආදායම විනෝද බද්දෙන් නිදහස් කිරීමටත් ගරු සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

**11:8 ' රිදම් නයිට් සංගීත වැඩසටහන - මැයි 19 '** මැයෙන් අම්බලන්ගොඩ, පනියන්දූව පාර, අංක 10 හි එම්.එච්. හසිත වානක මහතා විසින් එවා තිබූ ලිපිය සභාගත කරන ලදී.

තමා විසින් සංවිධානය කර ඇති **රිදම් නයිට් සංගීත වැඩසටහන ධර්මාශෝක විද්‍යාලයීය ශ්‍රවනාගාරයේදී 2018 මැයි 19 දින පැවැත්වෙන බවත් මෙයින් ලැබෙන ලාභය ධර්මාශෝකවිද්‍යාලයට ක්‍රීඩා උපකරණ ප්‍රදානය කිරීමට යොදවන බවත් එම නිසා මෙම වැඩසටහනෙන්** ලැබෙන මුදල් විනෝද බද්දෙන් නිදහස් කර දෙන ලෙසත් ඉල්ලා තිබුණි.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දූවගේ මහතා කතා කරමින්**</u>

සභාපතිතුමනි, ධර්මාශෝක විද්‍යාලයට ලබා දෙන මුදල නිදහස් කරල අනික් ටික සභාවට අයකර ගන්න. ලාභයෙන් 25%ක් විද්‍යාලයට දීල 75% ක් සභාවට ගන්න.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

මම කියන්න ඕනෙ මේ දේ පාවිච්චි කරමින් අම්බලන්ගොඩ නගර සභාවට ලැබෙන ආදායම් අහිමි කරගෙන යනවා. මන්ත්‍රීවරු මේ දේ කල්පනා කල යුතුයි.

**ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්**

සභාපතිතුමනි අපි පාසලක සංගමයක් විසින් ඉල්ලීමක් කරහම ලබා දෙමු. තනි පුද්ගල ඉල්ලීම් වලට ලබා නොදී ඉදිමු. හැම පාසලකටම පොදු ගානක් දෙමු.

**ගරු නගර සභා මන්ත්‍රී ධම්මික කොඩිකාර මහතා කතා කරමින්**

සභාපතිතුමනි මමත් ඒ දේට එකග වෙනවා.

**තීරණය**

☞ මේ සම්බන්ධයෙන් සාකච්ඡා කල සභාව ප්‍රසංගය සදහා මුද්‍රණය කරන ලද සියළු ප්‍රවේශ පත්‍ර සදහා වන විනෝද බදු මුදල තැන්පතුවක් ලෙස සභාවේ තැන්පත් කර ප්‍රසංගයෙන් ලද ආදායමෙන් ධර්මාශෝක විද්‍යාලයටලබා දුන් මුදල පිළිබද සහතික කරන ලද ලිපියක් ලබාගෙන එම මුදල පමණක් විනෝද බද්දෙන් නිදහස් කිරීමටත් ඉතිරි මුදල සභාවට ලබා ගැනීමටත් තීරණය කරන ලද අතර මින් ඉදිරියට තනි පුද්ගලයින් විසින් කරනු ලබන ඉල්ලීම් සදහා විනෝද බදු නිදහස් නොකිරීමටත් සංගමයක් මගින් කරනු ලබන ඉල්ලීමකදී ආදායම් පරීක්ෂ නිර්දේශය ලබාගෙන සභාවට යොමු කර තීරණයක් ගැනීම සුදුසු බවටත් සභාව විසින් තීරණය කරන ලදී.

**11:9** **' පරිසර සංරක්ෂණ ජාතික වැඩසටහන- අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය පරිසර සංවේදී කළාපවල වන පැල සිටුවීමේ වැඩසටහන සදහා සහය ලබා ගැනීම '** මැයෙන් අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් විසින් එවා තිබූ ලිපිය සභාගත කරන ලදී.

පරිසර සංවේදී කළාපවල සහ පොදු ස්ථානවල වන පැල රෝපණය කිරීමේ වැඩසටහන යටතේ පැල 1250 ක් කොට්ඨාශයට ප්‍රවාහනය කිරීම සදහා සභාව සතු ටිපර් රථය නොමිලේ ලබා දෙන ලෙසත් ඉල්ලා තිබුණි.

**තීරණය**

☞ පරිසර සංරක්ෂණ ජාතික වැඩසටහන වෙනුවෙන් කන්නෙලිය පැල තවානේ සිට වී පැල 1250 ක් අම්බලන්ගොඩ කොට්ඨාශයට ප්‍රවාහනය කිරීම සදහා (ඉන්ධන නොමැතිව) නගර සභාව සතු ටිපර් රථය ලබා දීමට සභාවේ අනුමැතියට යටත්ව අවසරය ලබා දීම වෙනුවෙන් සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

**11:10 ' ඡායා පිටපත් යන්ත්‍රයක් ලබා ගැනීම '** මැයෙන් විෂය ලිපිකරු විසින් ඉදිරිපත් කර තිබූ ලිපිය සභාගත කරන ලදී.

කාර්යාලයේ ඡායා පිටපත් යන්ත්‍රය අක්‍රියව ඇති බවත් නව ඡායා පිටපත් යන්ත්‍රයක් ලබා ගැනීම සඳහා මුදල් කමිටුවට යොමු කර මිළ ගණන් කැඳවීමට අවශ්‍ය පිරිවිතර ගාල්ල තාක්ෂණ විද්‍යාලයේ උපදේශකවරුන් මගින් සිදු කර ගැනීමට නිර්දේශ ලබා දී ඇති බවත් නමුත් මේ වන තෙක් ඒ පිළිබඳ විස්තර සපයා නොමැති බවත් කාර්යාල කටයුතු සඳහා අත්‍යාවශ්‍ය බැවින් නව ඡායා පිටපත් යන්ත්‍රය ඉක්මනින් ලබා ගැනීම සඳහා කටයුතු කරන ලෙසත් දන්වා තිබුණි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා කතා කරමින්</u>**

සභාපතිතුමනි මේකෙ වාර්තාව ගන්න ගාල්ලට යවලා මාසෙකට වැඩියි. මමත් එතෙන්ට කතා කරා. මේක පැය 24 කින් කරන්න පුලුවන් දෙයක්.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ඇත්තටම මේ පාර වාර්තාව අමාරුවෙන් ගැහුවෙ. හරියට ජේන්නෙ නැහැ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දූවගේ මහතා කතා කරමින්</u>**

සභාපතිතුමනි අද වෙනකොට ප්‍රධාන පෙලේ සමාගම් වලින් මිළ ගණන් අරගෙන කරන්න. නැත්තම් මේ වැඩ කරගන්න බැහැනේ.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

සභාවෙන් අරන් තියෙනවා. ගාල්ලට යොමු කරල තියෙන්නෙ නිර්දේශ ගන්න.

**<u>තීරණය</u>**

☞ නගර සභා කාර්යාලයට නව ඡායා පිටපත්යන්ත්‍රයක් ලබා ගැනීම සඳහා මිලදී ගැනීමේ ක්‍රියාපටිපාටිය අනුගමනය කරන ලෙසට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

**11:11 ' අම්බලන්ගොඩ වෙසක් කළාපය 2018 සාර්ථක කර ගැනීම සඳහා නගර සභාවේ අනුග්‍රහය ලබා ගැනීම සම්බන්ධවයි '** මැයෙන් අම්බලන්ගොඩ තරුණ බෞද්ධ සංගමය විසින් එවා තිබූ ලිපිය සභාගත කරන ලදී.

අම්බලන්ගොඩ තරුණ බෞද්ධ සංගමය විසින් 2018 වර්ෂයේද සදහම් වෙසක් කලාපය පැවැත්වීමට කටයුතු යොදා ඇති බවත් 2018 මැයි 27 වන දින සිට ජුනි 02 වන දින දක්වා අම්බලන්ගොඩ

හිරේවත්ත බුදු පිළිමය අසල සිට පටබැදිමුල්ල වටරවුම පෙදෙස දක්වා ප්‍රධාන මාර්ගය ආවරණය වන පරිදි පැවැත්වෙන බවත් ඒ සඳහා යකඩ පයිප්ප (කොඩි කණු) 50 ක්, ප්ලාස්ටික් පුටු 500 ක්, සැදැහැ ගීත ප්‍රසංගය සඳහා ප.ව. 5.00 සිට රාත්‍රී 12.00 දක්වා බස්නැවතුම් පොලෙහි පොලිස් මුරපොල පිහිටි ස්ථානය, කොඩි කණු සිටුවීම හා ගැලවීම සඳහා සභාව සතු කැන්ටර් රථය රියදුරු සමගද, සභාව සතු ජල බවුසරය ජලය සහ රියදුරු සමගද, විශාල පිත්තල පහනද, ගවයින් මුදවාගත් ගවයින් පරිත්‍යාග කිරීමේ පිංකම සඳහා බස් නැවතුම්පොල ඉදිරිපිට ත්‍රීරෝද රථ ගාලද, සභාව සතු රෙදි කූඩාරම් 8 ක්ද, දැන්වීම් පුවරුවක් බස් නැවතුම්පොළ භූමියට යාබද විදුලි පහන් කණුවේ ප්‍රදර්ශනය කිරීම සඳහා ද යන කරුණු සඳහා මුදල් අය කිරීමකින් තොරව අවසර ලබා දෙන ලෙසත් ඉල්ලා තිබුණි.

<u>ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.එම්. නිලානි මෙනවිය කතා කරමින්</u>

සභාපතිතුමනි තරුණ බෞද්ධ සංගමයේ කලින් ගලවපු බැනර් එක නැවත දැම්මද? ඒක ජාතික උත්සවයක් වෙනුවෙන් දාපු බැනර් එකක්. අපි මේව ආරක්ෂා කරන්න ඕනෙ.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

වැරදි තැන සවි කරපු එක අපි ගලවගෙන ඇවිත් තියෙනවා. අවශ්‍යනම් අරගෙන ගිහින් හරි තැන සවි කර ගන්න පුළුවන්. උපි නගරය අලංකාරව තියාගන්න යම් යම් නීති පනවල තියෙනවා. අපි ඒ නීති කඩ කරන්නේ නැහැ. අපි ඒවට සුදුසු ස්ථාන දීල තියෙනවා.

<u>තීරණය</u>

☞ අම්බලන්ගොඩ තරුණ බෞද්ධ සංගමය විසින් 2018 මැයි 27 වන දින සිට ජුනි 02 වන දින දක්වා පවත්වනු ලබන සදහම් වෙසක් කලාපය සඳහා යකඩ පයිප්ප (කොඩි කණු) 50 ක්, ප්ලාස්ටික් පුටු 500 ක්, සැදැහැ ගීත ප්‍රසංගය සඳහා ප.ව. 5.00 සිට රාත්‍රී 12.00 දක්වා බස්නැවතුම් පොලෙහි පොලිස් මුරපොල පිහිටි ස්ථානය, කොඩි කණු සිටුවීම හා ගැලවීම සඳහා සභාව සතු කැන්ටර් රථය රියදුරු සමගද, සභාව සතු ජල බවුසරය ජලය සහ රියදුරු සමගද, විශාල පිත්තල පහනද, මුදවාගත් ගවයින් පරිත්‍යාග කිරීමේ පිංකම සඳහා බස් නැවතුම්පොල ඉදිරිපිට ත්‍රීරෝද රථ ගාලද, සභාව සතු රෙදි කූඩාරම් 8 ක්ද, දැන්වීම් පුවරුවක් බස් නැවතුම්පොළ භූමියට යාබද විදුලි පහන් කණුවේ ප්‍රදර්ශනය කිරීම යන භාණ්ඩ හා සේවාවන් මුදල් අය කිරීමකින් තොරව ලබා දීමට ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ඒ සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

**11:12** **‘ වෙරළ උද්‍යානයේ ඉදිකර ඇති වැසිකිළියට ජල පහසුකම් ලබා ගැනීම ’** මැයෙන් අම්බලන්ගොඩ, පටබැදිමුල්ල, අංක 85, ග්‍රාම නිලධාරි විසින් එවා තිබූ ලිපිය සභාගත කරන ලදී.

පටබැදිමුල්ල ප්‍රජාශාලාවේ ඉදිකර ඇති වැසිකිළිය සඳහා මෙතෙක් ජල පහසුකම් ලබා දී නොමැති බවත් එම වැසිකිළිය සඳහා ජල පහසුකම් ලබා දෙන ලෙසත් ඉල්ලා තිබුණි.

තීරණය

☞ වෙරළ උද්‍යානයේ ඉදිකර ඇති වැසිකිළියට ජල පහසුකම් ලබා දීම සඳහා ගරු සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

**11:13 ' පළාත් පාලන ආයතන සතු අරමුදල් යොදාගෙන සිදු කරනු ලබන සංවර්ධන කටයුතු '** මැයෙන් දකුණු පළාත් පළාත් කොමසාරිස්තුමා විසින් එවා තිබූ ලිපිය සභාගත කරන ලදී.

උක්ත කරුණ සම්බන්ධයෙන් දකුණු පළාත් ප්‍රධාන ලේකම්ගේ 2018-04-10 දිනැති ලිපිය හා බැඳෙන බවත් ඒ අනුව සභා අරමුදල් යොදාගෙන සිදු කරනු ලබන සංවර්ධන වැඩසටහන්, මාර්ග වෙනත් ඉදිකිරීම් මින් ඉදිරියට පළාත් පාලන ආයතන වල සභා රැස්වීම් වලින් අනුමත කර සභා වාර්තාව පළාත් පාලන සහකාර කොමසාරිස්ගේ නිර්දේශ සමගින් තමා වෙත යොමු කර අනුමැතිය ලබා ගත යුතු බවටත් දන්වා තිබුණි.

ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්

ඇත්ත වශයෙන්ම මෙම ලිපියෙන් සභාවේ සංවර්ධන කටයුතු අක්‍රීය කරල තියෙනවා. මන්ත්‍රීවරුන්ට කියන්න ඕනෙ සභාවෙ අරමුදල් යොදවල කරන කටයුතු සම්බන්ධයෙන් මේ සභාවෙ ඉන්න මන්ත්‍රීවරු 21 දෙනා ඇරුනම වෙන කවුරුත් තීන්දු කිරීම අවශ්‍යතාවයක් නැහැ. ඒක පාර්ලිමේන්තුවෙන් සැලසුන නීතිය ප්‍රකාරව තමයි කටයුතු කරන්නෙ. නමුත් ප්‍රධාන අමාත්‍යතුමා විසින් මේ දීපු තීන්දුව අනුව පළාතෙම තියෙන පළාත් පාලන ආයතන වල සම්පූර්ණ විෂය ක්ෂේත්‍රයම අඩපණ කරල දැන් පළාත් සභාව තියෙන තත්වයටම අකර්මණ්‍ය කරන්න තමයි මේක කරල තියෙන්නෙ. එනිසා මෙය දැඩි ලෙස මම හෙලා දකිනවා. පළාත් පාලන කොමසාරිස්වරයාට කිසිම අයිතියක් නැහැ සභාවේ මුදල් යොදවල නගරයේ වැඩ කටයුතු කිරීමට යාමට එතුමාගෙන් අනුමැතිය ගන්න අවශ්‍ය නැහැ. අනුමැතිය ගන්න ඕනෙ තමුන්නාන්සේලා 21 දෙනාගෙන් විතරයි. අපි අය වැය ඉදිරිපත් කරල තියෙනවා. ඒක අනුමත කරල තියෙනවා. ඒ අනුව මේ සභාවෙ හැමදාම වියදම් වෙන මුදල් සම්බන්ධයෙන් ගෙවන මුදල් සම්බන්ධයෙන් පෞද්ගලිකව මට අවසර දෙන්න පුළුවන් රු. 10000.00 යි. එය ඉක්මනවන සෑම ගෙවීමක්ම මේ සභාවෙ අනුමැතිය ගන්න ඕනෙ. මේ ලිපිය අනුව වැඩ කරන්න ගියහම එක වැඩක් කරන්න අවුරුද්දක් මාස හයක් විතර යනවා. ඒ නිසා ඇත්තටම මෙය අනුවණ ක්‍රියාවක්. අද වෙනකොට අම්බලන්ගොඩ නගර සභාවට දකුණු පළාත් සභාවෙන් ලැබිය යුතු මුදල ලක්ෂ 300 ක්. ඒ මුදල ලබා දෙන්නෙ නෑ. දැනට මේ මිනිස්සු ගෙවන පොඩි පොඩි මුදලින් තමයි වැඩ කරන්නෙ. එනිසා මෙය පළාත් සභාව විසින් කරනු ලබන ඉතාම පහත් ක්‍රියාවක් ලෙස මම දකිනවා.

ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරමිණියගේ මහතා කතා කරමින්

ගරු සභාපතිතුමනි, මේ වන විට අපේ පළාත් පාලන ආයතන වල පරම බලය නිලධාරීන්ට පාවාදීමක් ලෙසයි මම දකින්නෙ. මේ වන විට ප්‍රධාන අමාත්‍යතුමාගෙ උපදෙස් මත පළාත් පාලන

කොමසාරිස්වරයා විධායකය මත එතුමන්ගෙන් අවසරය ගත යුතුයි කියලයි මෙම ලිපියෙන් කියවෙන්නෙ. වසර 3 කට අධික කාලයකින් අපි වෙර වැයමකින් දිනාගත්ත මේ අපේ සර්වජන ඡන්ද බලය යටතේ අපේ මන්ත්‍රීවරුන්ගේ විශේෂ බලය නිලධාරීන්ට පාවා දීල නිලධාරිවාදය රජකරවන යුගයක් නැවත ඇති කරන්නට මේ ලිපියෙන් උත්සාහ අරගෙන තියෙනවා. අපි පළාත් පාලන නියෝජිතවරු හැටියට නැගී සිටිය යුතුයි. ඒ සඳහා ඔබතුමාලාගේ නැණස පැදේවායි පතමින් මම නවතිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.ජී. ලක්ෂ්මි හේමන්තා ද සිල්වා මෙනවිය කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි අපි නියෝජනය කරන්නෙ මේ අම්බලන්ගොඩ නගරයේ බුද්ධිමත් ජනතාව. අපි රකින්න ඕනෙ අම්බලන්ගොඩ ජනතාවගේ අයිතිවාසිකම්. අපි කරන්න ඕනෙ අම්බලන්ගොඩ ජනතාවට යුතුකම්. ඉතින් එය කරන්න අපි 21 දෙනා මෙතන බැදිල ඉන්න අතරෙ ඒකට කවුරුහරි අකුල් හෙලනව නම් මම ඒකට මගේ විරෝධතාවය ප්‍රකාශ කරනවා. අපි නගර සභා ආඥා පනත අනුව තමයි පාලනය වෙන්නෙ. එහෙම පනතකින් දීපු බලයකින් ක්‍රියා කරන අපිට බාහිර බලපෑමක් මගින් අපේ අයිතිවාසිකම් සීමා කරනව නම් මම මේ සියළුම මන්ත්‍රීවරු වෙනුවෙන් විරෝධතාවය ප්‍රකාශ කරනවා. මොකද මෙතුමන්ලා හැමෝටම යම් අභිමානයක් , අයිතිවාසිකමක් මන්ත්‍රීවරු වශයෙන් තියෙන්න ඕනෙ. එනිසා අපි 21 දෙනාගෙ අභිමානය රැක ගනිමින් අම්බලන්ගොඩ ජනතාවට යුතුකම් ඉටු කිරීමට අපි සියළු දෙනාම ක්‍රියා කරමුයි කියා පවසමින් මගේ දැඩි විරෝධතාවය මේ අවස්ථාවේ ප්‍රකාශ කරනවා. ඒවගේම අපිට එන්න තිබෙන ලක්ෂ 300 ගෙන්න ගන්න. ඔබතුමා ලිපියක් හදන්න. ඒහුර මේ සම්බන්ධව විරුද්ධත්වය ප්‍රකාශ කරන බවටත් ලිපියක් හදන්න. මම අත්සන් කරනවා. මේ සම්බන්ධව ගතහැකි සියළුම කාර්යන් ඔබතුමා සිදු කරන්න කියා මා ඉල්ලා සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>**

සභාපතිතුමනි එම ලිපිය සම්බන්ධව මගෙත් දැඩි විරුද්ධත්වය ප්‍රකාශ කරන්න කැමතියි. නැත්තම් ඉදිරියට මේ අපේ ගම්වල ජනතාවට අපිට උත්තර දෙන්න බැරි වෙනවා. අපිට අවශ්‍ය වැඩක් කර ගන්න බැරි වෙනවා. එනිසා මගේ දැඩි විරුද්ධත්වය ප්‍රකාශ කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්</u>**

සභාපතිතුමනි මේ ලිපිය අනුව නම් වැටහෙන්නෙ අපි මෙතන සම්මත කරන යම් ව්‍යාපෘතියක් අපි සම්මත කරාට පසුව නැවත වතාවක් යවන්න ඕනෙ පළාත් පාලන කොමසාරිස්තුමාට. ඔබතුමා පරීක්ෂා කරල බලන්න මේක ලංකාවටමද කියල නීතිය.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එම්.ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා කතා කරමින්</u>**

සභාපතිතුමනි යම් දෙයක් ආවම ඒක දේශපාලන කෝණයකින්ම බැලිය යුතු නැහැ. පළාත් පාලන විෂය භාර අමාත්‍යතුමා ප්‍රධාන අමාත්‍යතුමා. අපි මේ ගැන සාකච්ඡා කරල විසඳුමක් ගන්න ඕනෙ. පෞද්ගලිකව මේ විදියට කතා කරන එක අපි තරයේ හෙලා දකිනවා. අපේ නායකතුමා එතුමා. එතුමට

මොනවත් කියනවට ඇත්තටම අපිත් කැමති නැහැ. ප්‍රශ්නයක් තියෙනවනම් අපි සාකච්ඡා කරල විසඳගමු. මේ හැම දෙයක්ම දේශපාලන කෝණයකින් බලන එකනම් අපි අනුමත කරන්නෙ නැහැ.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ඩී. ධර්මදාස මහතා කතා කරමින්**</u>

සභාපතිතුමනි පසුගිය දිනවල මාධ්‍යයෙන් ප්‍රචාරය වුනා අමාත්‍යවරයෙක් ප්‍රකාශ කරා පළාත් පාලන ආයතන වලට මුදල් දෙන්නෑ වැඩ කරන්න කියලා. මහ ආණ්ඩුවේ මන්ත්‍රීවරුන්ටයි, පළාත් සභා වලටයි විතරයි කියල මුදල් ලබා දෙන්නෙ කියලා. ඒකෙම අතුරු එලයක්ද දන්නෑ සභාපතිතුමා මේක.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ඒ.ජී. ලක්ෂ්මි හේමන්තා ද සිල්වා මෙනවිය කතා කරමින්**</u>

සභාපතිතුමනි රාහුල මහත්මය කියපු දේට මම උත්තරයක් දෙන්න ඕනෙ. මට වාඩි වෙන්නත් කිව්වා. මම කොහොමත් අවුරුදු 20 ක් තිස්සෙ වාඩි වෙනවා. හිටගන්නවා. ඒක මගේ රස්සාව. මම මහ ඇමතිතුමාට විරුද්ධ වෙන දෙයක් කිව්වෙ නැහැ.

<u>**ගරු නගර සභා මන්ත්‍රී එම්.ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා කතා කරමින්**</u>

මම ඔබතුමියට කිව්වෙ නැහැ.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ඒ.ජී. ලක්ෂ්මි හේමන්තා ද සිල්වා මෙනවිය කතා කරමින්**</u>

සභාපතිතුමනි මම එතුමත් එක්ක අවුරුදු ගානක් වැඩ කරල තියෙනවා. මම කිව්වෙ අපි මන්ත්‍රීවරුන්ගෙතියෙන අභිමානය ඇයි අපි කාටවත් බාල්දු කරන්නෙ කියලා. අපි කාටවත් මඩ ගහන්නෙ නැහැ. කාටහරි මඩ ගහන කොට අනික් අයටත් මඩ වදිනවා. අනික අපි කොන්ද කෙලින් තියන් වැඩ කරන්න ඕනෙ ජනතාවට. අපිට එහෙම බැරිනම් අපි මෙතන ඉන්න එකෙන් වැඩක් නැහැ.

<u>**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**</u>

සභාපතිතුමනි රාහුල මන්ත්‍රීතුමාට සභාව සම්බන්ධ දැනීමක් තියෙනවා. අපි මීට පෙරත් මට මතක හැටියට ලක්ෂ 20 කට වැඩි ඇස්තමේන්තු හෝ වෙනත් යම් දෙයක් තමයි පළාත් පාලන කොමසාරිස්තුමාට යවන්නෙ. ඊට අඩු දෙයක් මේ සභාවෙ මන්ත්‍රීවරුන්ගේ අනුමැතියට අනුව තමයි වැඩ කරන්නෙ. අපි මේ ජනතාවට සේවය කරන්න තමයි ඇවිල්ල ඉන්න. ඉතින් පාරක් හදන්න රු. 200000/- ක 300000/- ක ඇස්තමේන්තුවක් ආවොත් මේක යවන්න ඕනෙද කොමසාරිස්තුමාට. මේක මහ වැරදි වැඩක්නෙ සභාපතිතුමා. අපි මේ ඡන්දෙන් දිනල මෙතෙන්ට ඇවිල්ල තියෙන්නෙ. නිකන් මෙතන පත් කරල නෙමෙයිනෙ. කරුණාකරල සභාපතිතුමා මේකට ඉඩ දෙන්න එපා. අනිත් එක සභාපතිතුමා මහජන නියෝජිතයන්ට යටත්ව තමයි ඉන්නෙ නිලධාරීන්. එනිසා නිලධාරීන්ට ඕන ඕන විදියට වැඩ කටයුතු කරනවට අපි සභාව විදියට දැඩිසේ විරුද්ධයි. කලින් තිබුන නීතිය ප්‍රශ්නයක් නැහැ. ඒක ලංකාවටම බලපවත්වන නීතියක්. මම දන්න තරමින් මේ නීතිය ඇවිල්ල තියෙන්නෙ

දකුණු පළාත් සභාවට විතරයි. සභාපතිතුමා අපි මේ මිනිස්සුන්ට වැඩ කරන්න ඇවිල්ල තියෙන්නෙ. අද සභාවෙ සම්මත කරල ඊට පස්සෙ වටේ ගිහිල්ල එනකන් ඉන්න ඕනෙ මේක සම්මත වෙලා. මේ යන්නෙ නිලධාරීවාදයක්. ඒනිසා මේකට විරුද්ධව අපි සියළු දෙනාම එකතුවෙමු කියන ඉල්ලීම කරමින් මම නිහඬ වෙනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එම්.ඩබ්. නිලානි මෙනවිය කතා කරමින්</u>**

සභාපතිතුමනි මම කියන්න ඕනෙ අපේ ධර්මදාස මන්ත්‍රීතුමා ප්‍රකාශ කරා මාධ්‍ය මගින් කරපු ප්‍රකාශයක් ගැන. මාධ්‍ය සියළුම දේ නිවැරදිව ප්‍රකාශ කරනවයි කියන්න බැහැ. ඒ නිසා ඔබතුමා ඒ ගැන නිවැරදිතාවය සොයල කතා කරානම් හොඳයි. ඒවගේම සභාපතිතුමනි ඔබතුමා අපේ සියළු මන්ත්‍රීවරුන්ව භාරව කටයුතු කරන පුද්ගලයා. ප්‍රධාන අමාත්‍යතුමා කියන්නෙ අපේ පළාත් පාලන ඇමතිතුමා. අපි කියන්නෙ නෑ වැරදි දේට අපි එතුමත් එක්ක ඉන්න ඕනෙ කියලා. නමුත් මම නම් පක්ෂයේ සහ ප්‍රධාන අමාත්‍යතුමාගෙ නිර්දේශය මත මෙතෙන්ට මන්ත්‍රීවරියක් වශයෙන් මෙතෙන්ට පත්වෙලා ඇවිල්ල තියෙන්නෙ. ඒ නිසා ඒ ගෞරවයත් තියාගෙන අම්බලන්ගොඩ ජනතාවගේ ගෞරවය රැකගන්න එක මගේ යුතුකම හා වගකීම කියල මම හිතනවා. සභාපතිතුමනි ඔබතුමා පසුගිය මැතිවරණ කාලෙදි ලබා දීපු ප්‍රකාශනයේ තිබුන ප්‍රධාන අමාත්‍යතුමා කිසිම දෙයක් මෙ සභාවට දුන්නෙ නැහැයි කියලා. එවැනි කටයුතු කරපු ඔබතුමා මෙවැනි ලිපියක් එවපු වෙලාවක අපිව මීට වඩා දැනුවත් කරල කටයුතු කරානම් හොඳයි කියල මම විශ්වාස කරනවා. අපි හිතනවා අපේ ප්‍රධාන අමාත්‍යතුමා ඉදිරියේදි අපිව දැනුවත් කරල කටයුතු කරාවි කියලා. අපි සියළු දෙනා මෙතෙන්ට ඇවිල් තියෙන්නෙ ජනතාවට සේවය කරන්න. ඒ සඳහා ඔබතුමා අපට දෙන සහයෝගය වගේම ගරු ප්‍රධාන අමාත්‍යතුමාත් කොමසාරිස්තුමත් ඒ සඳහා සහයෝගය ලබා දෙන බව අපට විශ්වාසයක් තියෙනවා. එනිසා අපි ඒකාධිපති විදියට කටයුතු නොකර එතුමලත් එක්ක සහයෝගෙන් කටයුතු කරල අම්බලන්ගොඩ නගර සභාව සාර්ථක වැඩ පිළිවෙලක් සඳහා යොමු වෙන්න කටයුතු කරමු කියල ඉල්ලා සිටිමින් මගේ කතාව අවසන් කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩී. ධර්මදාස මහතා කතා කරමින්</u>**

සභාපතිතුමනි මේ සභාවෙ ප්‍රධාන අමාත්‍යතුමාට විරුද්ධ වෙන විදියට කවුරුත් කතා කරේ නැහැ. ප්‍රධාන අමාත්‍යතුමා ඔය තත්වෙට ගේන්න මෙතන ඉන්න අයගෙන් වැඩිපුරම වැඩ කරපු කෙනා තමයි මම. ධනසේන මාදුවගේ මන්ත්‍රීතුමත් දන්නව ඒ ගැන. ඉතින් මම කිව්වෙ මාධ්‍ය තුලින් ඒ රජයේ කැබිනට් අමාත්‍යවරයා ප්‍රකාශ කරේ පළාත් පාලන ආයතන වලට මුදල් දෙන්නෙ නැහැයි කියලා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්</u>**

සභාපතිතුමනි දැන් බලන් ගියහම මෙතන වැඩ නෙමෙයි කෙරෙන්නෙ. අපි කතා කරනව විතරයි. ප්‍රධාන අමාත්‍යතුමත් අපිට උදව් කරනවා. එතුමා අම්බලන්ගොඩ වීම ගැන අපි ආඩම්බර විය යුතුයි. මම පළමුවෙන්ම කියනවා මේ ලිපිය සම්බන්ධව පසු විපරමක් කරන්න කියලා. මේක දකුණු පළාත් සභාවට විතරයිද? ලංකාවෙ හැමෝටමද කියල දන්නෙ නැතිව මෙතන අදහස් හුවමාරු කර ගන්න

ඕනෙ නැහැ. පොදුවෙ ගත්ත තීරණයක් නම් අපිට ඒකට එකග වෙන්න වෙනවා. දකුණු පළාතට විතරනම් අපි පසු විපරමක් කරල බලමු අපි 21 දෙනා සමගි වෙලා කතා කරල බලමු. අනික් එක මේ එක එක ඇමතිවරු ප්‍රකාශ කරා කියලා මුදල් දෙන්නෙ නැත්නම් අම්බලන්ගොඩ නගර සභාවට විතරක් නෙමෙයි ලංකාවෙම ආයතන වලට ලැබෙන්නෙ නැහැ. ලැබෙනව නම් ඔක්කොටම ලැබෙනවා. මේ ඇමතිවරුන්ගෙ ප්‍රකාශයි ප්‍රවෘත්ති සාකච්ඡායි කොච්චර දේවල ඡන්ද වලදි කියනවද? බොරු පව ගහලනෙ හැමෝම දිනන්නෙ. ඒ නිසා ඒවට මෙතන වාද විවාද කරන්න ඕන්නැ. අපි වැඩ කරමු කට්ටිය එක්ක එකතු වෙලා. අපි පසු විපරමක් කරල ඊට පස්සෙ ඒකමතිකව තීරණයක් ගනිමු. ස්තුතියි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා කතා කරමින්</u>**

සභාපතිතුමනි, ඉතිහාසය පුරාවට පළාත් පාලන කොමසාරිස්වරයා විසින් මේ සභාවල් මෙහෙයවනු ලැබුවා. ඒවගේ පරිනත රාජ්‍ය නිලධාරියෙකු විසින් මේ මට්ටමේ ලිපියක් මෙවැනි සභාවකට එවීමම ඒ සභාව හැල්ලුවට ලක් කිරිමක් ලෙස තමයි මම දකින්නෙ. මෙතනදි නිලධාරීන් අසරණයි. කමිටු විසින් මේ ගරු සභාව විසින් අනුමත කරහම එතුමන්ලට වැඩ කිරීමේ හැකියාව තිබුණා. මේ ලියුම හරහා ඒ හැකියාව නැති වෙනවා. මේකෙන් විදවන්නෙ නගරයේ ජනතාව. අපි මොන දේශපාලන මතිමතාන්තර දැරුවත් බලන්න ඕනෙ මෙතෙන්ට පත්කරපු ජනතාවට අපෙන් වන සේවයේ කාර්යක්ෂමතාවය කොපමණද කියලා. ඒකට බාධාවක් වෙනවනම් ඒකට විරුද්ධව මම ඉන්නවා. ඒ නිසා සභාපතිතුමනි ඔබතුමා පළාත් පාලන නියෝජිතයන් හමුවෙලා හරි පළාත් පාලන කොමසාරිස්තුමා හමුවෙලා හරි තීරණයකට එන්න දැන් තියෙන තත්වය මිලියන් 2 හෝ 11/2 ක හරි අඩු කරල යම් එකගතාවයකට එන්න. නැතුව මේ ලක්ෂ 11/2, 2 වගේ වැඩ අනුමැතියට යොමු කරන එක මන්ත්‍රීවරුන්ට කරන අපහාසයක්. අපි දන්නැ කොමසාරිස්තුමාගෙ මතය මොකක්ද කියලා. අපි ඒකට පරිභව කරනව නෙමෙයි. අවසානයේදී මේක විදවන්නෙ නගරයේ ජනතාව. ඒක පළාත් පාලන කොමසාරිස්තුමාට තේරුම්කර දිය යුතුව තිබෙනවා. නැත්නම් අවසානයේ මේ නිලධාරීන්ට අපි දෙන තීන්දු ක්‍රියාත්මක කිරීමේ හැකියාව නොමැති වෙනවා. වාහනයක් කැඩුනොත් ඇස්තමේන්තුව ලක්ෂ 3ක් 4ක් වුනොත් කොමසාරිස්තුමා අනුමත කරනකම් ගෙවන්න බැරි වෙනවා. ඒ නිසා ඔබතුමන්ලා පළමුව ගාල්ල දිස්ත්‍රික්කයේ සභාපතිවරු උප සභාපතිවරු එකතු වෙලා එතුමා හමුවෙලා මේ ප්‍රශ්නය ප්‍රායෝගිකව තේරුම් කරල දීල මේ ලිපිය ඉල්ලා අස්කර ගන්න කියල ඉල්ලීමක් කරන්න ගරු සභාපතිතුමනි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දූවගේ මහතා කතා කරමින්</u>**

සභාපතිතුමනි මේ පනතේ වගන්ති තියෙනවා ඔබතුමා බලන්න ඒ වගන්ති වලට යටත්වද මේ දේවල් එන්නෙ කියලා. ඒ දේවල් බලලා ඔබතුමා අදාල නීති අරගෙන සභාවට ඉදිරිපත් කරන්න.

**<u>ගරු සභාපති එම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

අපි මේ සම්බන්ධව ගාලු දිස්ත්‍රික්කයේ සභාපතිවරු සමග සාකච්ඡාවක් කැදවල තියෙන්නෙ. ප්‍රධාන අමාත්‍යතුමාට හරි පළාත් පාලන කොමසාරිස්තුමාට හරි පාර්ලිමේන්තුවෙන් පවරන ලද බලය ඉක්මවා කටයුතු කරන්න බලයක් නැහැ. ඒ අනුව මෙය අපි අනුගමනය කරනවද නැද්ද කියන එක අපි

සභාපතිවරු වශයෙන් ලංකාවෙම තීන්දුවක් ගන්නවා එහෙම වුනොත් අපි මෙය නොසලකා හරිනවා. ගැටළුවක් ඇති වෙන්නෙ නැහැ. අපි අපේ අයිතිය වෙනුවෙන් පෙනී සිටිනවා. නගර සභා වලට බලය පවරල තියෙන්නෙ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවෙන් නගර සභා ආඥා පනත ප්‍රකාරව. ඒ පනත අනුව වැඩ කරන තාක් කල් අපි වැරදි වෙන්නෙ නැහැ. අපි වැඩක් කරන්න කලින් ඇස්තමේන්තු අනුමත කරනවා. ඒ අනුව වැඩේ කරනවා. ඊට පස්සෙ තමයි ගෙවීම් කරන්නෙ. ගෙවීම් කරනකොටත් අනුමත කරනවා. ඒ සියල්ලම නීතියෙන් පැවරුන බලතල අනුව අපි කටයුතු කරනවා.

**<u>තීරණය</u>**

☞ නගරයේ සංවර්ධන කටයුතු වාර්ෂික අය වැය ලේඛනයට අනුව සිදු කරනු ලබන බවත් ඊට අදාල නොවන සංවර්ධන කටයුත්තක් සිදු කිරීමේදී නිලධාරීන් විසින් පරිපාලන යෝජනා ඉදිරිපත් කර අනුමැතිය ලබා ගත යුතු බවටත් ගරු සභාව විසින් තීරණය කරන ලදී.

## (12) න්‍යාය පත්‍රයට ඇතුලත් නොවූ වෙනත් කරුණු

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දූවගේ මහතා කතා කරමින්</u>**

සභාපතිතුමනි මෙතන පුස්තකාලය පිටුපස හදල තියෙන වැසිකිළිය අපි මුදලුත් අනුමත කරල තියෙනව. නමුත් තාම ඒක පුස්තකාලෙ අයට භාරදීල නැහැ. ඒක හොයා බලන්න වෙනවා. අපි කණගාටු වෙනවා. අදකාලෙ මේ පොදු වැසිකිළි හදන්නෙ නැහැ කටවල් දාල. මෙච්චර මුදලක් එක්ලක්ෂ ගානක් වියදම් කරල තිබුන කටටම බිත්ති හතරක් බඳින එකට මෙච්චර මුදලක් යාම පිළිබඳව ගැටළුවක් තියෙනවා. මේ වැසිකිළිය හදන්න ගිය ඇස්තමේන්තුව සභාගත කරන්න කියල මම ඉල්ලා සිටිනවා.

**<u>ගරු සභාපති එම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ඇයි තාම ඒක විවෘත කරල නැත්තෙ තාක්ෂණසේවා නිලධාරී මහත්මය?

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දූවගේ මහතා කතා කරමින්</u>**

සභාපතිතුමනි මේක පුදුම ඇස්තමේන්තුවක්. අපිට මේක ලබා දෙන්න බලන්න. මේ ඔබතුමා ලබා දුන්න මේ ඇස්තමේන්තුවේ දාපු ගණන් එක්ක ප්‍රශ්න ගොඩක් තියෙනවා. මේක පරීක්ෂා කරන්න අවශ්‍යයි. සම්පූර්ණ විවෘත කරන්න ඕනෙ. මේක නගර සභා පාලනයක් නැති කාලෙ හදල තියෙන්නෙ. තාම ඇරල නැහැ. වැඩ ඉවරනම් මුදල් ගත්තනම් ඇයි ඇරියෙ නැත්තෙ. මෙහෙම මුදල් දෙන්න බැහැ. මෙහෙම ඕන ඕන විදියට මුදල් අපිට අනුමත කරන්න බැහැ. ලොකු මුදල් දාල තියෙන්නෙ. ස්කොටින් ෆෑන් වලට දාසයදහස් ගානක්. දැන් මේව හයිකරන්නෙ නැහැ. මම ඔබතුමාට ඇමරිකන් ස්ටෑන්ඩඩ් කොමඩ් එකක් ගෙනත් දෙනවා මීට අඩුවට. ඔබතුමා කියන විදියට ස්කොටින් ෆෑන් එකක් අටදහස්

ගානක්. මේ පිළිබඳව මගේ දැඩි විරෝධය සභාපතිතුමා. ටොයිලට් එකකට හාර ලක්ෂ හැත්තදාහක්. මම හිතන්නෙ බාත්රූම් හයක විතර පේළියක් හදන්න තිබුණ මේ මුදලින්. නගරයේ සල්ලි මෙහෙම නාස්ති කරන්න දෙන්න බැහැ සභාපතිතුමනි.

__ගරු සභාපති එම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්__

මේ බාත්රූම් එක හදල තියෙන්නෙ අපි එන්න කලින්.

__ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්__

ඒක තමයි මම කිව්වෙ. නිලධාරීන් වග කියන්න ඕනෙ කියලා. මේ පිළිබඳව අපේ දැඩි විරෝධය. අපි මේ පොළවෙ පය ගහල ඉන්න අය. සිංගප්පූරුවෙ ඉඳල නෙමෙයි අපි මෙහේ එන්නෙ. මේකෙ කොන්ත්‍රාත් එක කරෙ කවුද? අපි දැන් කරන්නෙ මේක විදල බලනවා.

__ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්__

සභාපතිතුමනි නගර සභා සීමාවෙ හැම කොට්ඨාශයකම මාර්ග අබලන් තත්වයට පත්වෙලා තියෙන්නෙ. නමුත් අපේ සේවකයො 22 ක් ඉන්න ඕන තැන 9 දෙනයිලු ඉන්නෙ. ඒ නිසා මම යෝජනා කරනවා ඩිරෙක්ට් ලේබර් යටතේ සේවකයො ටිකක් බඳවගෙන ඉතා ඉක්මනින් පාරවල් ටික වැඩ ඉවර කරන්න කියලා.

__තීරණය__

- **මාර්ග ප්රතිසංස්කරණය කිරීම සඳහා සෘජු ශ්‍රමික පදනම යටතේ සේවකයින් බඳවා ගැනීම සුදුසු බවට ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරම්ණියගේ මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

__ගරු නගර සභා මන්ත්‍රී ඩී. ධර්මදාස මහතා කතා කරමින්__

සභාපතිතුමනි මටත් තියෙනවා කර්මාන්ත අංශයේ සෞඛ්‍ය අංශයේ කම්කරුවන් පිළිබඳව ප්‍රශ්න කිහිපයක්. මාර්ග කම්කරු ස්ථිර කම්කරුවන් 24 දෙනෙක් ඉන්නවා. නමුත් වැඩ කරන්නෙ 9 ක් විතර. ඒ අයගෙ දුක්ගැනවිල්ලක් තියෙනවා. හැම දෙයක්ම කරන්න ඕනෙ ඒ අය කියලා. මේධානන්ද මාවත පිළිසකර කරද්දි ඒක අපිට තේරුණා. 24 දෙනෙක් ඉන්නව නම් සභාපතිතුමනි අනික් කට්ටිය කොහෙද ඉන්නෙ. ඒ අදාල ස්ථාන වලට ඒ අය යොමු කරන්න. වෙනත් තැන්වල ඉන්නව නම් ඒ තැන්වල ඒගොල්ලො ස්ථිර කරල කම්කරු ප්‍රශ්නෙ විසඳන්න. ඒගොල්ලො කියනවා අපිම තමයි හැම තැනටම අදින්නෙ කියලා. ඒ කතාවෙත් සාධාරණයක් තියෙනවා. තව ප්‍රශ්නයක් තියෙනවා සෞඛ්‍ය අංශයේ ට්‍රැක්ටර් එලවන අය කියනවා ඒ අය උදේලු එන්නෙ. ඒ අයට පාන්දර ආවම කෑම කන්න ස්ථානයක් නැහැලු. කඩවලිනුත් කැමති නැහැලු ඒ අය එනවට. ඒගොල්ලො කුණු අතගාන නිසා. ඒ නිසා ඒ අයට කෑම කන්න තැනක් හදල දෙන්න. ඒවගේම ට්‍රැක්ටර් වලට කුණු දැමීමේදී ගෙවල් වල තියෙන සේරම

කුණු භාර දෙනවා. මම ඉල්ලීමක් කරනවා පාරවල් පිළිසකර කරාට පස්සෙ දැන්වීමක් දමන්න පාරවල් වල කුණු දමන්න එපා කියලා. කුණු දැමුමොත් නීතියෙන් දඩුවම් කරන බව දන්වන්න.

**<u>ගරු සභාපති එම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මාර්ග කම්කරුවන් කී දෙනෙක් ඉන්නවද? කී දෙනෙක් වැඩ කරනවද? ඒ අය වැඩ කරන තැන් මට විස්තරයක් දෙන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.ජී. ලක්ෂ්මි හේමන්තා ද සිල්වා මෙනවිය කතා කරමින්</u>**

සභාපතිතුමනි තුඩුවමුල්ල පාරෙ වලවල් ලොකුවට තියෙනවා. ආරන්‍යයට යන පාරනේ. දැන් වැස්සත් නැති නිසා ඒක ඉක්මනින් පිළිසකර කරල දෙන්න කියල ඉල්ලා සිටිනවා.

**<u>ගරු සභාපති එම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

අපි මාර්ග 4 ක වැඩ කොටස් කරා. මුහුදු වෙරළ පාර, මහ අම්බලන්ගොඩ පාර, කළුවඩුමුල්ල පාර සහ මේධානන්ද මාවත. අපි පත්වුනාට පස්සෙ වැඩ කරන දින අහුවුනේ දවස 10 කටත් අඩු ප්‍රමාණයක්. තව මාස දෙකක් යනකොට අම්බලන්ගොඩ තියෙන පාරවල් සියල්ලම පිළිසකර කරන්න පුළුවන් වේවි. ඒ පාර ප්‍රිමික්ස් වලින් කරන්න බැහැ. ඒකට ඇස්තමේන්තුවක් දෙන්න. අපි ඒක කරල දෙන්නම්.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා කතා කරමින්</u>**

සභාපතිතුමනි මන්ත්‍රීතුමිය කියන පාර හරිය ගගත් එක්ක සමාන මට්ටමේ තියෙන්නෙ. ඒ නිසා පොඩි වැස්සටත් පාර යට වෙනවා. ඒක උස්සල වගේ තමයි හදන්න වෙන්නෙ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>**

සභාපතිතුමනි මෙතෙන්ට ඉන්ටර් ලොක් ටයිල්ස් වගේ දැම්මොත් වතුර ආවත් ප්‍රශ්නයක් නැහැ.

**<u>ගරු සභාපති එම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මෙතන ගග නිසා එහා පැත්තෙ ඉන්න කට්ටියත් තමන්ගෙ ඉඩම උඩින් ගිහිල්ල වතුර ගගට වැටෙන්න කැමති නැහැ. ඒගොල්ලො උස්සගෙන තියෙන්නෙ. ඒක හින්ද පාර දැන් කාණුව වෙලා තියෙන්නෙ. මේක සාමාන්‍යයෙන් උස්සල හදන්න කීයක් විතර යයිද? මන්ත්‍රීතුමියත් එක්ක ගිහිල්ල මන්ත්‍රීතුමිය කියන විදියට ඇස්තමේන්තු කරල දෙන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා කතා කරමින්</u>**

සභාපතිතුමනි අම්බලන්ගොඩ කුඩා නගරයක්. නගරයේ ජනතාවට කුණු ගෙදර තියාගන්නවද, වත්තෙ තියාගන්නවද, පාරට දානවද? මේ ප්‍රශ්නෙ තියෙනවා ගරු සභාපතිතුමනි. අපි නීති හැදුවට ප්‍රායෝගික නැත්තම් ඒක ක්‍රියාත්මක වෙන්නෙ නැහැ. පර්චස් හයක අටක ගෙවල් හදාගෙන ඉන්න නගරයේ

ජනතාවට තියෙන ප්‍රශ්නෙ තමයි තමන්ගෙ වත්තෙ කෙසෙල් ගහ, පැපොල් ගහ කැපුවහම මේක පාරට දාන්න තහනම්. එහෙමනම් මෙහේට සල්ලි බැදලා මාසයක් ඉදල ඕනෙ ඒක ට්‍රැක්ටරයට දීල අස් කරන්න. ඒ අතර ඩෙංගු නිලධාරීන් යනවා කුණු ගොඩ වහාම අයින් කරන්න කියලා. ඒ නිසා අපි නීති හැදුවට යම් යම් තැන්වලදී මේක ප්‍රායෝගික නෑ. අද වෙනකොට නගරයේ කම්කරුවකු හොයා ගන්න බැරි තත්වයක් තියෙන්නෙ. ඉතින් හොරාට හරි පාරට තමයි දාන්නෙ. ඒ නිසා අපේ සෞඛ්‍ය අංශය මීට වඩා සැලසුම් සහගතව වැඩ කරොත් හොදයි කියලා මම කියනවා. අඩුම තරමෙ සති දෙකකටවත් සැරයක් එක ගමක් ඉවරවෙන විදියට එකතුවෙලා තියෙන කුණු අරගන්න පුළුවන්. ටේලරයක් තියල හරි මිනිස්සු දැනුවත් කරල කරන්න පුළුවන්. එතකොට අපි පාරෙ යනකොට දකින කෙසෙල් කදන්,

පැපොල් කදන් , ගෙවල් කඩපු කැලි තැන තැන තියෙන එකක් නැහැ. සම්පූර්ණයෙන් ගෙයක් කඩල වගේ දෙයක් ට්‍රැක්ටරයෙන් සල්ලි බැදල අදින්න පුළුවන්. මම මේ මන්ත්‍රීවරුන්ට දැන ගැනීම සදහා කිව්වෙ.

<u>ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා කතා කරමින්</u>

සභාපතිතුමනි පොල්වත්තෙ අග්ගාරාම විහාරස්ථානය සම්බන්ධ ලිපියක් එවල ඇති. වහලෙ උළුකැට බිදීම පිළිබද ප්‍රශ්නයක් තියෙන්නෙ. මේක අපිට ලොකු පාඩුවක්. ඒවගේම මේ උළුකැට නැවත දැමීම හරිම අපහසු කාර්යක්. වහලට නගින එක හරිම අමාරුයි.

<u>ගරු සභාපති එම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

වැඩ අධිකාරී මහත්මය මේක වාර්තාවක් දාල සභාවට එන්න ඕනෙ. ඔතන බෝලෙ වහලට යන්නෙ නැතිව නවත්තන විදියක් ඔයගොල්ලන් තිරණය කරන්න. මම හිතන්නෙ උඩට දැලක් දැම්මත් හරි.

<u>ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා කතා කරමින්</u>

සභාපතිතුමනි ඒවගේම ළමයි කෑම කාල ඔක්කොම දාන්නෙ පන්සල් වත්තට. ඒ නිසා ඒ පැත්ත සම්පූර්ණයෙන්ම වසා දමන්න කියල මම ඉල්ලා සිටිනවා.

<u>ගරු සභාපති එම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

අපි පුහුණු කරුවන් දැනුවත් කරමු ඒ දේ කරන්න එපා කියල.

<u>ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරම්ණියගේ මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි අපේ අම්බලන්ගොඩ හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් වන එල්.සී. ද සිල්වා මැතිතුමාගෙ අලියො නාවන්න ගිහිපු පාර පින්නදූව තොටුපොල පාර අද පටු පාරක් බවට පත් වෙලා. ඒ පාරෙ උදවිය මට ලිපියක් භාර දුන්නා. මේ පාර අපි දකින්නෙ නගරෙ තියෙන ප්‍රාථමිකම පාර විදියටයි.

<u>ගරු සභාපති එම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

ඔතන පාරක් නැහැ තියෙන්නෙ අඩි පාරක් නේද.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරම්ණියගේ මහතා කතා කරමින්</u>**

ඒවගේම සභාපතිතුමනි මීට කලිනුත් ඔබතුමා බැලුව තාප්පයක් ඉදිකරල දෙන්නයි කියල අවට වැසියෙක් කියනවා අඩි 20 ක විතර ප්‍රමාණයක. මේ පිළිබඳව ඔබතුමාගෙ අවධානය යොමු කරන්න කියල ඉල්ලා සිටිනවා.

**<u>ගරු සභාපති එම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ඔය අදාල ඉඩම් ටික අරන් දෙන්න. ඒ අවශ්‍ය දේවල් කරල දෙන්නම්.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරම්ණියගේ මහතා කතා කරමින්</u>**

ඒවගේම සභාපතිතුමනි ප්‍රිමික්ස් කර්මාන්තය මන්දගාමී බවක් තිබෙන බවටයි ප්‍රකාශ වුනේ. ඒ කටයුතු ඉක්මනින්ම කරන්න කියල ඉල්ලා සිටිනවා.

**<u>ගරු සභාපති එම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

අද පටන් ගන්නවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්. සරත්චන්ද්‍ර මහතා කතා කරමින්</u>**

සභාපතිතුමනි මටත් තියෙනවා කරුණු කිහිපයක්. එකක් තමයි අග්ගාරාම පන්සල් භූමියට කුණු දමන එක. සභ්‍යත්වයක් තියෙන ක්‍රීඩකයින් එහෙම කරනව නම් ඒක අභාග්‍යක්. අනිත් එක දැල් ගහල ධර්මශාලාවට වන හානිය වලක්වනව කියන එක නිෂ්ඵල කාර්යක්. අහස උසට දැල් ගහන්න වෙයි. ඒක ප්‍රායෝගික නැහැ. වයස් සීමාවක් පනවල තියෙනව මේකට.

**<u>ගරු සභාපති එම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මෙහෙමයි අපි ඕකෙ අවු. 13 න් පහල තමයි සෙල්ලම් කරන්න දුන්නෙ. මෙතන ක්‍රීඩාපිටිය නැති නිසා තමයි ඔය ක්‍රීඩාපිටියට යොමු වෙලා තියෙන්නෙ. මාස 6 ක් විතර ඔය ප්‍රශ්නෙ තියේවි. ඊට පස්සෙ හරියාවි. මේ ග්‍රවුන්ඩ් එකේ වුනත් අහල පහලට ඔය ප්‍රශ්නෙ තාමත් තියෙනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්. සරත්චන්ද්‍ර මහතා කතා කරමින්</u>**

සභාපතිතුමනි ක්‍රීඩා පිටිය සම්බන්ධව අනිකු නීති හරියටම තියෙනවා. වැටවල් ගහල, ගේට්ටු දාල බයිසිකලයක්වත් ඇතුලට ගන්න බැහැ. ඒව නීති අකුරට ක්‍රියාත්මක වෙනවා. නමුත් මේ පන්සල සම්බන්ධව සැලකිල්ලක් පේන්නැ. අනික් කාරණාව තමයි මේ වැසිකිළිවල අසභ්‍ය වචන පින්තූර ඇඳල තියෙනවා. ඒව පන්සලට එන දායකයො අඳින්නෙ නැහැ. ක්‍රීඩා කරන්න එන ළමයි කමයි මේව

කරන්නෙ. ඒ කාරණා තුන ගැන සභාපතිතුමාගෙ අවධානය යොමු වෙයි කියල බලාපොරොත්තු වෙනවා.

**ගරු සභාපති එම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

පන්සලේ වැසිකිළි භාවිතා කරන්නැනෙ ළමයි. මම හිතන විදියට ළමයින්ට චෝදනා කරන එක වැරදියි.

**ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්. සරත්චන්ද්‍ර මහතා කතා කරමින්**

සභාපතිතුමා ඇවිල්ල බලන්න.

**ගරු නගර සභා මන්ත්‍රී ධනසේන මාදුවගේ මහතා කතා කරමින්**

සභාපතිතුමා ළමයි තාප්පෙ ලගින් ඇවිල්ල ඇතුලට ගිහිල්ල තමයි පින්තූර එහෙම අදින්නෙ. කවුරුහරි නැහැයි කියනව නම් අපිට ඒව පෙන්නන්න පුළුවන්. ඒක ළමයි වාර ගණනාවක් කරල තිබුණ. උපාසකම්මල ඇවිල්ල අපිට කියනවා. පහුගිය වෙසක් පෝය දවසෙ පිට්ටනියෙ ළමයි සෙල්ලම් කරා. පෝය දවසට පිට්ටනියට මුර කාරයෙක් දාන්න.

**ගරු සභාපති එම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

මන්ත්‍රීතුමා පෝය දවසට පොල්වත්තෙ ක්‍රිඩාපිටය කිසිසේත්ම දෙන්නෙ නැහැ. මේ පිට්ටනිය හදන්න අග්ගාරාමයෙනුත් යම්කිසි දායකත්වයකුත් ලැබුනා. ඒ නිසා කොහොමත් පෝය දවසට ලබා දෙන්නෙ නැහැ.

**ගරු නගර සභා මන්ත්‍රී ධනසේන මාදුවගේ මහතා කතා කරමින්**

සභාපතිතුමා ළමයි එදා පෝය දවසෙ හූ කිය කියා තමයි දැගලුවේ. ඒක නැවැත්තුවේ සභාපතිතුමාට කියල තමයි. ඒ නිසා එදාට අනිවාර්යෙන්ම මුරකාරයෙක් දාන්න.

**ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්**

සභාපතිතුමා මට කයන්න තියෙන්නෙ ඕකන්ද ප්‍රජාශාලාව ගැන. ඒකට ගහක් වැටිල වහල දිරාපත් වෙලා තියෙන්නෙ. ආදාහනාගාරයට එන වාහන නවත්තන්න තැනක් එතන අඩුයි. ඒ නිසා එතන ලස්සනට හදන්න පුළුවන්. ගොඩක් ජනතාව එතෙන්ට එනවා. නගර සභාවෙ නමනෙ යන්නෙ. එනිසා එතන සමතලා කරල වාහන නවත්තන්න තැනක් හදන්න කියල මම ඉල්ලා සිටිනවා.

**ගරු සභාපති එම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

වැඩ අධිකාරී මහත්මය මෙතන ප්‍රජාශාලාව දැන් කඩන් වැටිල තියෙන්නෙ. එතන පාර්කින් එකක් ඩිසයින් කරල ඇස්තමේන්තුවක් දෙන්න.

**ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා කතා කරමින්**

සභාපතිතුමනි නුගේතුඩුව අතුරු පාරෙ විදුලි කණු සවිකරල කාලයක් වෙනවා. තාම ඒවට විදුලිය නැහැ. ඒ සදහා ක්‍රියා මාර්ගයක් ගන්න කියල ඉල්ලා සිටිනවා.

**ගරු නගර සභා මන්ත්‍රී ධනසේන මාදුවගේ මහතා කතා කරමින්**

සභාපතිතුමා නුගේතුඩුව අතුරු මාර්ගයේ ප්‍රධාන අමාත්‍යතුමා විසින් හාරලක්ෂ හැත්තපන්දහසක් දීල ලයිට් කණු 7 ක් දාල තියෙන්නෙ. එතන උඩින් පාරට තව ලයිට් කණු 3ක් දාන්න. විදුලි සමාගමෙන් ආපු වෙලාවෙ ඒ ටික මැනල නැහැ. ඒ වාර්තාව විදුලි සමාගමෙන් මහ ඇමතිතුමාට යවන්න ඕනෙ. අනිත් ලයිට් කණු 3 ත් ගන්න ලියුම හදල තියෙන්නෙ. ඒක කරාට පස්සෙ ලයිට් දෙන්න පුළුවන්.

**ගරු සභාපති එම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

නන්දන මන්ත්‍රීතුමා ඒ කණු වලට විදුලිය තාම දීල නැහැ. විදුලිය දුන්නට ප්සෙ අපි දෙන්නම්.

**ගරු නගර සභා මන්ත්‍රී ඒ.ජී. ලක්ෂ්මී හේමන්තා ද සිල්වා මෙනවිය කතා කරමින්**

සභාපතිතුමා මහ අම්බලන්ගොඩ පුස්තකාලෙ වහලෙ පීලි දිරල පැත්තක් වැටිල. ඒකත් සකස් කරල දෙන්න කියල ඉල්ලා සිටිනවා.

**ගරු සභාපති එම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

තාක්ෂණ සේවා නිලධාරී මහත්මය ඒකටත් ඇස්තමේන්තුවක් දෙන්න. සභාවෙන් හරි කරන්න පුළුවන් නම් ඉක්මනින් කරන්න. මේක ඉදිකරන කොට අහල පහල අය මුකුත් කිව්වෙ නැහැ. එනිසා අපේ වගකීමත් අපි කරන්න ඕනෙ.

**ගරු නගර සභා මන්ත්‍රී එම්.ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා කතා කරමින්**

සභාපතිතුමා ලිපියක් ඉදිරිපත් කරල තියෙනවා හෙප්පුමුල්ලෙ ආර්.ඊ.ද සිල්වා මාවතේ නගර සභා පුස්තකාලයට යාබද තාප්පයක් සම්බන්ධව.

**ගරු සභාපති එම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

අපි දාල තියෙන්නෙ තාක්ෂණ සේවා නිලධාරී වාර්තාව ගන්න.

**ගරු නගර සභා මන්ත්‍රී එම්.ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා කතා කරමින්**

සභාපතිතුමා විලේගොඩ ලුම්බිනි එකට යන පාරෙ අපේ නගර සභාවට අයත් සිමෙන්ති බෝඩ් එකක් තියෙනවා. දැන් තියෙන්නෙ හොටෙල් ඉතාලියා කියල අකුරු වලින් ලියලා. ඒක මෙහෙන් අහල කරනවද කොහොමද දන්නෑ. ඒක ඉවත් කරන්න කියල මම ඉල්ලා සිටිනවා.

**<u>ගරු සභාපති එම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මන්ත්‍රීතුමා එතන ධම්මානන්ද මාවත කියල අපි අළුතින් හයි කරපු බෝඩ් එකක් තියෙනවා. මේ පරණ බෝඩ් අපි කඩා ඉවත් කරේ නැහැ. පෝස්ටර් අලවන්න ඉඩ තිබ්බා. ඒ කොටසෙ තමයි මේ දේ කරල තියෙන්නෙ. අනිත් එක අපි සමාගමක් එක්ක ගිවිසුම්ගත වෙලා තියෙන්නෙ. අපේ නේම් බෝඩ් මුදල් අය කිරීමක් නැතිව ඒ අය විසින් ගහල දෙනවා. අවුරුදු දෙකකට සැරයක්. ඒවෙගේම බස් නැවතුම්පොලත් අවුරුදු දෙකකට සැරයක් තීන්ත ගානව. මුදලක් යන්නෙ නැහැ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එම්.ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා කතා කරමින්</u>**

සභාපතිතුමා අනිත් එක මේ හැමතැනම ලොතරැයි කුඩු. අවසරය නොදීපු ඒව තියෙනවනම් ඉවත් කරල දාන්න. සමහරු බදු දෙනවා. එහෙමනම් මේවගෙන් නගර සභාවට ආදායම ගන්න. නැත්නම් කොහේවත් ඉන්න අය වාසි ගන්නවා.

**<u>ගරු සභාපති එම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ආදායම් පරිපාලක මහතා, අපෙන් අවසර නොගත්ත හැම කුඩුවක්ම අරගෙන එන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.ජී. ලක්ෂ්මී හේමන්තා ද සිල්වා මෙනවිය කතා කරමින්</u>**

සභාපතිතුමා මහ අම්බලන්ගොඩ ඉරොෂ්මී මහත්මියලාගෙ ගෙදර ලඟින් යන පාර අපි කලින් සභාව තියෙන කොට ඩැමේජ් කරා කියල මුදල් අයකරා. එතනින් එහාට පාර හැදිල නැහැ. එතනින් එහාට මිනිස්සුන්ට යන්නත් බැහැ.

**<u>ගරු සභාපති එම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

තාක්ෂණ සේවා නිලධාරී මහත්මය මහ අම්බලනගොඩ ලක්ෂ්මී මන්ත්‍රීතුමිය කියපු ස්ථානයේ ප්‍රශ්නයක් ඇති වෙලා බැකෝ එකකින් කඩපු තැනක් තියෙනවා. ඒක ඉතිරි ටික කොන්ක්‍රීට් කරන්න ඇස්තමේන්තුවක් දෙන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.එම්. නිලානි මෙනවිය කතා කරමින්</u>**

සභාපතිතුමා මහ අම්බලන්ගොඩ තුන්මං හන්දියේ ස්ලැබ් කැලි කීපයක් කැඩිලා. මෙතන වාහන අනතුරු සිදු වුනා. මම අපේ පාලනය එන්න කලින් කිව්වහම ටී.ඕ. මහත්මයා එක කැල්ලක් දැම්මා. එතෙන්ට එකක් මදියි. අනික් කැලිත් කැඩිලා.

**<u>ගරු සභාපති එම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

තාක්ෂණ සේවා නිලධාරී මහත්මයා, මෙතන නම්බි මුල්ල පාර එකතු වෙන තැන. එතෙන්ට ස්ලැබ් කැලි ටික මෙහේ ගහල දවස් 28 තියල දාන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා කතා කරමින්</u>**

සභාපතිතුමා සක්වා එක ලගින් යන මැටි පාර ඉන්ටර්ලොක් අල්ලන්න ඇස්තමේන්තු කරල තිබ්බා. ඒක නැවත ඇස්තමේන්තු කරන්න කියල ඉල්ලා සිටිනවා.

<u>**ගරු සභාපති එම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

තාක්ෂණ සේවා නිලධාරී මහත්මයා, ඒක නැවත ඇස්තමේන්තු කරන්න.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා කතා කරමින්**</u>

සභාපතිතුමා බස් නැවතුම්පොල පින්තාරු කරන ආයතනයටම කියල සරසවි හන්දිය ලග ගොඩනැගිල්ලත් පින්තාරු කරන්න බැරිද? සෑහෙන කාලෙකින් ඒක කරල පින්තාරු කරල නැහැ.

<u>**ගරු සභාපති එම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

මම උත්සාහ කරල බලන්නම් ඒ අය ආවහම.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ධම්මික කොඩිකාර මහතා කතා කරමින්**</u>

සභාපතිතුමා පාරවල් වල නාම පුවරු ඔක්කොම කැඩිලා. ඒක ඉක්මන් කරල කරගන්න බලන්න. අපිටත් ස්පොන්සර් කරන අය ඉන්නවා.

<u>**ගරු සභාපති එම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

අපි ඉක්මනින් කරගන්න බලමු.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ධම්මික කොඩිකාර මහතා කතා කරමින්**</u>

සභාපතිතුමා පෝරඹ හරස් පාර තාර දාන්න සූදානම් වෙලා කොන්ත්‍රාත්කරු ජේ සී බී එකකින් මුළු පාරම ගැලෙව්ව. බාගෙට තාර දාල ඉතිරි ටික නැවැත්තුවා.

<u>**ගරු සභාපති එම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

මේක වැඩිපුර කැඩුවට කොන්ත්‍රාත්කරුගෙන් අයකර ගත්තනම් හරි. ඉතිරි කොටස සඳහා ඇස්තමේන්තුවක් දෙන්න.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ඒ.ජී. ලක්ෂ්මි හේමන්තා ද සිල්වා මෙනවිය කතා කරමින්**</u>

සභාපතිතුමා මම ඉල්ලා සිටිනවා අම්බලන්ගොඩ නගරයේ සභාව සතුව තියෙන ඉඩම් හඳුනාගැනීම සඳහා වැඩ පිළිවෙලක් යොදන්න කියලා.

<u>**ගරු සභාපති එම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

අපේ සභාව සතුව දේපල ලේඛනයක් තියෙනවා. අපි මන්ත්‍රීවරු සමග සාකච්ඡාවක් වෙනම දාල එම ලේඛනය යාවත්කාලීන කරමු.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.ජී. ලක්ෂ්මි හේමන්තා ද සිල්වා මෙනවිය කතා කරමින්</u>**

සභාපතිතුමා ඒවගේම තව යෝජනාවක් තියෙනවා මෙතන නගර සභා පාරෙ තියෙන අපිට අයිති හිස් භූමිය. එතන මොකක් හර දෙයක් කරා නම් හොඳයි.

**<u>ගරු සභාපති එම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මෙහෙමයි මන්ත්‍රීතුමිය අපිට සමහර ඒව තියෙනවා පරිත්‍යාග. පරිත්‍යාග ලැබිච්ච ඒ දෙන කරුණටම යොදවන්න ඕනෙ. මෙතන දීල තියෙන්නෙ ළිදකට. ළිද කඩන් වැටුනා. ළිද හදමු.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.ජී. ලක්ෂ්මි හේමන්තා ද සිල්වා මෙනවිය කතා කරමින්</u>**

සභාපතිතුමා ඒවගේම අර මහ අම්බලන්ගොඩ ළිද. ඒකත් සභාපතිතුමා වැටක් හරි ගහල ආරක්ෂිත කරානම් හරි. ඒවගේම මාදම්පා ගගේ නාන තොටුපොල ඉස්සර හැමෝම නෑව. එතන අපවිත්‍ර වෙලා තියෙන්නෙ. හැමෝම කුණු කසල දානවා. වැසිකිළිවල අපද්‍රව්‍ය පවා හරවලා තියෙනවා. මට ජනතාව කිව්ව මේ අවට අය අපවිත්‍ර දේවල් බැහැර කරන්නෙ කොහේටද කියල බලන්න කියලා.

**<u>ගරු සභාපති එම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

අපි කලින් එම්.ඕ.එච්. එකත් එක්ක වැඩ සටහනක් කරා ගග දිගේම. එහෙම දාල තිබුන ඒව අපි වැස්සුව.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එම්.ඩබ්. නිලානි මෙනවිය කතා කරමින්</u>**

සභාපතිතුමා හල්වතුරෙත් සමහර අය අපද්‍රව්‍ය ඇලට හරවලා තියෙනවා. ඇලට ගිහිල්ල ඊලගට ගගට එනවා. පොඩි ළමයි නානවා. මේක ෂැහෙන්න ප්‍රශ්නයක්. මහජන සෞඛ්‍ය පරීක්ෂක මහත්මයට කියල පරීක්ෂා කරන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්.සරත්චන්ද්‍ර මහතා කතා කරමින්</u>**

සභාපතිතුමා මම කලිනුත් සභාවෙ මතක් කරා. පොල්වත්තෙ පිට්ටනිය ඉස්සරහ තියෙන භූමි භාගය පිළබඳව. දැන් අපි අවුරුදු ගානක් තිස්සෙ ඒ අය හිටියා පාවිච්චි කරා කියල යම් ඉඩම් දෙන්න හදනවා. අපි අවුරුදු දහයක් ඇස්පියාගෙන ඉදල ඒක පාවිච්චි කරනකම් ඊට පස්සෙ ඒ අයට පවරන්න කටයුතු කරනවා. ඊට වඩා නරකද අපේ භූමි භාගයක් වෙනත් අයෙක් පාවිච්චි කරනව කියලා ඒක වලක්වන්න පියවරක් ගන්න එක වඩා සුදුසුයි කියල මම යෝජනා කරනවා.

**<u>ගරු සභාපති එම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මම ඔබතුමාට මේ ගැන පුද්ගලිකව කියන්නම්.

<u>**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**</u>

සභාපතිතුමා අපි මැනුමක් කරා නේද? ඒ ලිපිගොනුව නැහැයි කියනවා.

<u>**ගරු සභාපති එම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

ලිපිගොනු නැතිවෙන්න විදියක් නැහැ. වෙලා තියෙන්නෙ පරණ ගොනුවට අමුණන්නෙ නැතිව අළුතින් ලිපිගොනු හදල අමුණනවා. ඒකයි වෙලා තියෙන්නෙ. ලේකම්තුමිය මේ ගැන සොයා බලල කටයුතු කරන්න. කාර්යාලයක කරන්න ඕන ක්‍රියාදාමයක් තියෙනවා. ඒ ක්‍රමවේදය අනුගමනය කරන්න.

<u>**ගරු නගර සභා මන්ත්‍රී එම්. අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්**</u>

ගරු සභාපතිතුමනි නගර සභාව සතු භාණ්ඩ වන කැනපි, පුටු නිකුත් කිරීමේදී යම් කිසි ක්‍රමවේදයක් තියෙනවද? ඒවගේම අවමංගල කොඩි දූර්වර්ණ වෙලා තියෙන්නෙ. මේ සඳහා ඔබතුමාගෙ අවධානය යොමු වෙන්න කියල ඉල්ලා සිටිනවා.

<u>**ගරු සභාපති එම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

ඒ කොඩි අළුතින් සකස් කරන්න සභාවේ අනුමැතිය ලබා දෙන්න.

<u>**තීරණය**</u>

- **අවමංගල කටයුතු සඳහා යොදා ගන්නා සුදුකොඩි හා නගර සභා කොඩි අළුතින් සකස් කිරීමට සුදුසු බව ගරු සභාපති එම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රී එම්. අතුල ප්‍රියන්ත මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**ප.ව' 1.30 ට පමණ සභාවේ වැඩ කටයුතු අවසන් කරන ලදී.**

බී. ඒ. ධම්මිකා,
ලේකම්,
අම්බලන්ගොඩ නගර සභාව.

අරුණ ප්‍රදීප් මණිමෙල් වඩු,
සභාපති,
අම්බලන්ගොඩ නගර සභාව.

**2018 -05 - 21** වන දින,

අම්බලන්ගොඩ නගර සභා කාර්යාලයේදීය.